Gal-Oya
Plantations (Pvt)
Limited

2018/19

ගල්ඔය වැවිලි පුද්ගලික සමාගම

වාර්ෂික වාර්තාව



සංක්ෂේපය

ගල්ඔය

වර්ෂ 1997 සිට අක්‍රීයව පැවති එවකට සීමාසහිත හිඟුරාන සීනි කර්මාන්ත (පුද්ගලික) සමාගම යළි නඟාසිටුවීම සඳහා සීමාසහිත ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම පිහිටුවන්නේ 2007 වර්ෂයේදී ය.

ශ්‍රී ලංකා රජය වෙනුවෙන් පොදු ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිසම විසින් හිඟුරාන සීනි කර්මාන්ත (පුද්ගලික) සමාගම නැවත ප්‍රකෘතිමත් කිරීම සඳහාත් කර්මාන්ත ශාලාව ආශ්‍රිත ඉඩම් වගාකිරීම සඳහාත් උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ගෙන් කැමැත්ත විමසන ලදී.

බ්‍රවුන්ස් සහ සමාගම සහ LOLC ආයතනයේ මූලිකත්වයෙන් යුතු ව්‍යාපාර එකමුතුවක් විසින් රාජ්‍ය - පුද්ගලික හවුල් ව්‍යාපාරයක් ලෙස පවත්වාගෙන යාමත් එමඟින් එවකට අත්හැර දමා තිබූ සීනි කම්හල නැවත පණගැන්වීමත් යන අභිප්‍රායයන් පෙරදැරිකරගෙන ශ්‍රී ලංකා රජය වෙත යෝජනාවක් ඉදිරිපත් විය.

එම වාර්තාව අධ්‍යයනය කිරීමෙන් අනතුරුව, ශ්‍රී ලංකා රජය හා ඉහත ව්‍යාපාර එකමුතුව අතර හවුල් ව්‍යාපාරයක් ලෙස නව සංස්ථාවක් ඇරඹුනි. ඊට අමතරව සීමාසහිත ගල්ඔය (පුද්ගලික) සමූහ ව්‍යාපාරය එහි පාලක නියෝජිතයා ලෙස පත් කරන ලදී.

හෙක්ටයාර 7,659 කින් යුතු සංස්ථාව සතු භූමි ප්‍රමාණයෙන් වගා කළ හැකි හෙක්ටයාර 5,200ක් වූ භූමි ප්‍රමාණය පවුල් 4,400ක් අතර බෙදා දී ඇත. ඉතිරි භූමි ප්‍රමාණය කර්මාන්ත ශාලාවට අයත් ගොඩනැගිලි, නිවාස සංකීර්ණ, උස්බිම් රක්ෂිත, මාර්ග හා ජලවහන පද්ධති වලින් සමන්විතය. වරිපතන්චේන, ගල්මඩුව, දීඝවාපි, හිඟුරාන සහ නීත්ත වශයෙන් ව්‍යාපෘති බල ප්‍රදේශය ප්‍රධාන කලාප 05 කට බෙදා ඇත.



අන්තර්ගතය


ගල්ඔය

දැක්ම හා මෙහෙවර 03
ප්‍රධාන අවධාරණයන් 05
විධායක අධ්‍යක්ෂගේ නිවේදනය 07
ප්‍රධාන මෙහෙයුම් නිලධාරීගේ නිවේදනය 09
මූල්‍ය අවධාරණයන් 11
කොටස් හිමියන්ගේ ආයෝජන 13
අධ්‍යක්ෂ මණ්ඩලය 15
ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය 17
සමාගම් ව්‍යුහය 19
වගා කටයුතු 20
සීනි නිෂ්පාදනය 25
ස්කාගාරය 31
ජෛව කොම්පෝස්ට් සැකසුම් ඒකකය 35
කාර්ය මණ්ඩලය 37
අනාගත ව්‍යාපෘති 40
අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව 42
අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් පිළිබඳ ප්‍රකාශය 45
විගණන කමිටු වාර්තාව 47

මූල්‍ය කටයුතු – 2018/19

ජාතික විගණන කාර්යාලයේ වාර්තාව 49
ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය 57
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 58
හිමිකම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය 59
මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය 60
මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන් 61
වාර්ෂික මහා සභා රැස්වීමේ නිවේදනය 85
පෙරකලාසි පත්‍රය 86
සමාගම් තොරතුරු 88






Annual Report

දැක්ම

අපගේ අභිලාෂය වන්නේ ඵලදායීතාව ඉහළ නැංවීම කඩිනම් කිරීම, පාර්ශ්වකරුවන්ගේ ඉලක්ක සාක්ෂාත් කරගැනීම සහ හරිත පරිසරයේ පැවැත්මට සහයවෙමින් වෙළඳපළ ප්‍රමුඛයා වීම උදෙසා ශ්‍රී ලංකාවේ උක් කර්මාන්තය යළි නඟා සිටුවීම යි.




මෙහෙවර

නැගෙනහිර පළාතේ සීනි කර්මාන්තය යළි නඟාසිටුවීම සඳහා මෙන්ම එම ව්‍යාපාරය විවිධාංගීකරණය කිරීමට සහ ඉහළ හා අඛණ්ඩ ආදායමක් උපයා ගැනීම පිණිස පරිසරයට සහාය වන අතරම සංවිධානයේ නිපුණත්වයෙන් ඉහළ, අභිප්‍රේරිත, වෘත්තීය මට්ටමේ, ක්‍රියාශීලී හා ආචාරසම්පන්න කාර්යය මණ්ඩලයක් ගොඩනැංවීම සඳහා හැකි සියලු සම්පත් උපරිම ලෙස භාවිතා කිරීම.


ප්‍රධාන අවධාරණයන්

ගල්ඔය


ශෂ්‍ය විද්‍යාත්මක කරුණු සමඟ වගා වපසරිය (හෙක්.)




උක් දඬු අස්වැන්න (මෙ.ටො.)




ඇඹරූ උක්දඬු ප්‍රමාණය (මෙ. ටො.)



සීනි නිෂ්පාදනය (මෙ.ටො.)



මොලැසස් නිෂ්පාදනය (මෙ.ටො.)



විධායක අධ්‍යක්ෂගේ
නිවේදනය



දනේෂ් අබේරත්න
විධායක අධ්‍යක්ෂ
ගල්ඔය වැව්ලි (පුද්ගලික) සමාගම

2019 මාර්තු 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා ගල්ඔය වැව්ලි පුද්ගලික සමාගමේ කාර්ය සාධනය පිළිබඳව වාර්තා කිරීමට ලැබීම පිළිබඳව මම සතුටු වෙමි.

හිඟුරාන ගල්ඔය නිම්නයේ පිහිටි සීනි කම්හල 60 දශකයේ හැඳින්වූයේ "ආසියාවේ යෝධයා" යනුවෙනි. නවීන යන්ත්‍ර සූත්‍ර සහිතව කලාපයේ විශාලතම සීනි කම්හලක් ලෙසින් ඉදිකළ මෙම කර්මාන්ත ශාලාව 1960 දී විවෘත කරන ලදී.කෙසේ වෙතත්, වැරදි කළමනාකරණය, කම්කරු හා වෘත්තීය සමිති ප්‍රශ්න හේතුවෙන් 1993 දී එහි ක්‍රියාකාරීත්වය නවතා දමන ලදී. ඉන්පසු, දේපල නැවත ප්‍රකාශයට පත්කිරීම සඳහා නව ආයෝජකයෙකු සොයා ගන්නා තෙක් දේපල රජයට පවරා ගන්නා ලදී. ගල්ඔය වැව්ලි සමාගම ශ්‍රී ලංකා රජය සහ සමූහ ව්‍යාපාරය අතර හවුල් ව්‍යාපාරයක් ලෙස 2007 වර්ෂයේදී පිහිටුවන ලද අතර, එහි අයිතියෙන් 51% ශ්‍රී ලංකා රජය සතුව පවතින අතර, මෙම අත්හැර දමා ඇති සීනි කර්මාන්ත ශාලාව පුනර්ජීවනය සඳහා එහි අයිතියෙන් 49% ක් බ්‍රවුන් සහ සමගම හා LOLC සමාගම සතු වේ.

ගල්ඔය වැව්ලි සමාගම බිහි වූ පසු හිඟුරාන සීනි කම්හල නැවත පෙර තිබූ තත්ත්වයට පත්කිරීම දුෂ්කර කාර්යයක් විය. අප එහි මෙහෙයුම් යථා තත්ත්වයට පත් කරන අවස්ථාව වන විට මීට පෙර උක් වගාවේ සහ නිෂ්පාදනයේ නිරත වූ බොහෝ සේවකයන් සහ ගොවීන් පසුගිය කාලයේ මුහුණ දුන් විවිධ ගැටලු හේතුවෙන් බලාපොරොත්තු අත්හැර දමා තිබුණි. එබැවින්, ඔවුන්ගේ පැහැදීම සහ විශ්වාසය යළිත් වරක් ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා ගෙයින් ගෙට යාමේ ව්‍යාපාර, කණ්ඩායම් සාකච්ඡා, රැස්වීම් ආදිය මගින් ඔවුන් දැනුවත් කිරීම සඳහා මුලදී විශාල උත්සාහයන් සහ ආයෝජනයන් සිදු කරන ලදී.

2019 මාර්තු 31 වන විට ගල්ඔය වැවිලි සමාගම විසින් හිඟුරාන සීනි කම්හල නැවත පණ ගැන්වීම සඳහා රුපියල් බිලියන 9.598 ක ආයෝජනයක් සිදු කරන ලදි. වසරේ පිරිවැටුම 2017/18 හි පැවැති රු.මි. 1,243 සිට මිලියන 2,023 දක්වා වැඩි වී ඇත. ගල්ඔය වැවිලි සමාගමේ වත්මන් නිෂ්පාදන සීනි (දිනකට ටොන් 2,000), ENA (දිනකට ලීටර් 21,500), ජෙව පොහොර සහ අපගේ පරිභෝජනය සඳහා මෙගාවොට් 2 ක විදුලියෙන් සමන්විත වේ.

සීනි කර්මාන්තශාලාව නවීකරණය කර උක් ඇඹරීමේ ධාරිතාව 25% කින් වැඩි කිරීම, විදුලිබල නිෂ්පාදනය මෙගාවොට් 2 සිට 10 දක්වා වැඩි කිරීම, වාණිජමය අරමුණු සඳහා ස්කාගාරයෙන් CO_2 ග්‍රහණය කර ගැනීම සහ මත්පැන් ඇසුරුම් කිරීම සඳහා ඉදිරි වසරවලදී ආයෝජනය කිරීමට සමාගම තවදුරටත් බලාපොරොත්තු වන අතර මේවා දැනට ක්‍රියාත්මක වේ.

ගල්ඔය වැවිලි සමාගම දැනටමත් දිළිඳුකම ඉහළ මට්ටමක පවතින අම්පාර, සියඹලාණ්ඩුව ආදී ප්‍රදේශවල සෘජු හා වක්‍ර රැකියා අවස්ථා නිර්මාණය කර ඇත. සෘජු රැකියා 1,000කට වැඩි ප්‍රමාණයක් සහ වක්‍ර රැකියා අවස්ථා 18,000කට වැඩි ප්‍රමාණයක් දැනටමත් නිර්මාණය වී ඇත. නව ආදායම් මාර්ග සමඟින් ප්‍රජාවගේ ජීවනෝපාය නඟා සිටුවීමට මෙමගින් සහාය වී ඇත. පසුගිය වසර කිහිපය තුළ කර්මාන්ත ශාලාව පිහිටි ප්‍රදේශයේ සැලකිය යුතු වර්ධනයක් දක්නට ලැබුණි. මෙම කම්හල නිසා රැකියා නියුක්තිය ඉහල ගොස් ඇති අතර එය සේවකයන්ගේ මූල්‍ය තත්ත්වය සහ ඔවුන්ගේ යහපැවැත්ම වැඩිදියුණු කිරීමට ඉමහත් උපකාරයක් වී ඇත. ඊට කදිම උදාහරණය වන්නේ වේලාසනින් වසා දැමූ කඩ සාප්පු දැන් රාත්‍රියේදීත් ව්‍යාපාරික කටයුතු සඳහා විවෘතව තැබීම යි.

හිඟුරාන සීනි කම්හල පුනර්ජීවනය කිරීම තුලින් ඒ ආශ්‍රිත ප්‍රදේශවල යටිතල පහසුකම්, විශේෂයෙන් මහා මාර්ග සහ ඇළ මාර්ග සංවර්ධනය කිරීමට මග පාදා ඇති අතර පහසුවෙන් ප්‍රවේශ විය හැකි පරිදි අභ්‍යන්තර මාර්ග ද ප්‍රතිසංස්කරණය කර ඇත. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ද සහාය ඇතිව ඇළ මාර්ග ප්‍රතිසංස්කරණය කෙරේ.

ගල්ඔය වැවිලි සමාගම 2011 වසරේ සිට සෑම වසරකම රුපියල් බිලියන 3ක් පමණ වැය කරනුයේ ගොවිමහතුන්ගේ ගෙවීම්, ට්‍රැක්ටර් රථ සඳහා වන ගෙවීම්, වැටුප් හා මෙහෙයුම් කටයුතු සඳහා අවශ්‍ය වන ද්‍රව්‍ය ලබා ගැනීම ආදී ක්‍රමවලින් ප්‍රජාවන්ගේ ආදායම වැඩිදියුණු කිරීම සඳහාය. තවද මෙම ප්‍රදේශයේ පිහිටුවා ඇති ආගමික ස්ථාන, පාසල් හා රෝහල් සඳහා මූලික යටිතල පහසුකම් සපයා දීමෙන් සහයෝගය ලබා දෙන්නෙමු.

ආනයනික ද්‍රව්‍ය සඳහා ආදේශකයන් නිර්මාණය කිරීම තුලින් ජාතික හා ග්‍රාමීය ආර්ථිකය නඟා සිටුවීමට අප සමාගම විසින් විශාල දායකත්වයක් දක්වනු ලැබේ.

සමාගමේ කොටස් හිමියන්, අමාත්‍යාංශ මගින් හා අනෙකුත් ආයතන වල නිලධාරීන් ලබාදෙන අඛණ්ඩ සහයෝගය වෙනුවෙන් මා ඔවුන්ට කෘතඥ වෙමි. අපගේ කළමනාකරණ කාර්ය මණ්ඩලය සහ සියලුම සේවකයින් ගේ සහයෝගය සහ කැපවීම නොමැතිව අපගේ සමාගමට මෙම විශිෂ්ට ජයග්‍රහණය ලබා ගැනීමට නොහැකි ය. එබැවින් මම ඔවුනට ස්තුතිවන්ත වෙමි.

දනේෂ් අබේරත්න
විධායක අධ්‍යක්ෂ
ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම



ප්‍රධාන මෙහෙයුම් නිලධාරීගේ
නිවේදනය

ගල්ඔය

සුරත් පෙරේරා
ප්‍රධාන මෙහෙයුම් නිලධාරි
ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම

වර්ෂ 2019 මාර්තු 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා ගල්ඔය වැවිලි පුද්ගලික සමාගමේ කාර්ය සාධනය පිළිබඳව වාර්තා කිරීමට ලැබීම පිළිබඳව මා සතුටු වෙමි.

මෙම මූල්‍ය වර්ෂය අවසානයේදී උක් වගා කරන ලද මුළු භූමි ප්‍රමාණය හෙක්ටයාර් 5,999 ක් වූ අතර එය මෙතෙක් වාර්තා වූ ඉහළම උක් වගා වපසරිය වේ. අපගේ සමාගමට අයත් උක් ඉඩම් වරිපතංචේන, ගල්මඩුව, හිඟුරාන, නීත්ත, දීසවාපිය යන ප්‍රධාන කලාපවලත් අම්පාර සහ සියඹලාණ්ඩුව යන බාහිර වගා ප්‍රදේශවලත් පැතිර පවතී. 2018/2019 වසර තුළ අපි හෙක්ටයාර 3380 ක හොඳම රෝපණ වැඩසටහන ක්‍රියාත්මක කළෙමු. තවද, මූල්‍ය වර්ෂයක් තුළ අස්වනු නෙළන ලද වැඩිම බීජ උක් ප්‍රමාණය මෙට්‍රික් ටොන් 32,422ක් ලෙස මෙම කාලය තුළ වාර්තා විය.

2018/19 වාරය තුළ අපගේ උක් වගා කරන ලද භූමි වලින් මෙට්‍රික් ටොන් 152,915 ක වාණිජ උක් අස්වැන්නක් නෙලාගෙන ඇත. උක් සැපයුම මත පදනම්ව, සමාගම 6.74 හි සීනි මෙට්‍රික් ටොන් 9,565 ක් සහ මොලැසස් මෙට්‍රික් ටොන් 8,076 ක් නිෂ්පාදනය කළේය. මීට අමතරව අපි මේ වසරේ නිෂ්පාදනය කරන ලද මොලැසස් සහ පසුගිය වසරේ පැවැති තොගවලින් ENA ලීටර් 4,284,325 ක් නිෂ්පාදනය කරණ ලදී. නමුත් කොම්පෝස්ට් අලෙවිය සක්‍රිය නොවීම හේතුවෙන් මෙම කාලය සඳහා අප නිෂ්පාදනය කරේ ජෛව කොම්පෝස්ට් මෙ.ටොන් 1,700ක් පමණි.

දැනට ගල්ඔය වැවිලි සමාගමේ නිෂ්පාදන සීනි, ENA, ජෛව පොහොර සහ මෙගාවොට් 2ක විදුලියෙන් (අපගේ පරිභෝජනය) සමන්විත වේ. කර්මාන්තයේ දිගු කාලීන තිරසාරභාවය සහ වර්ධනය සඳහා නව ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාත්මක වෙමින් පවතී. සීනි කර්මාන්තශාලා නවීකරණය කර උක් ඇඹරීමේ ධාරිතාව 25% කින් වැඩි කිරීම, විදුලිය නිෂ්පාදනය මෙගාවොට් 2 සිට 10 දක්වා වැඩි කිරීම, ස්කාගාරයෙන් වාණිජ අරමුණු සඳහා CO_2 ග්‍රහණය කර ගැනීම, අත් සනීපාරක්ෂක නිෂ්පාදනය සහ මත්පැන් බෝතල් කිරීම අනාගතයේ දී දියුණුවක් ගෙන දෙන ධනාත්මක දිගු කාලීන බලපෑමක් සහිත අනාගත ව්‍යාපෘති වේ.

ගල්ඔය වැවිලි සමාගම අම්පාර දිස්ත්‍රික්කයේ විශේෂයෙන්ම හිඟුරාන ප්‍රදේශයේ ඍජු හා වක්‍ර රැකියා අවස්ථා දැනටමත් නිර්මාණය කර ඇත. මූල්‍ය වර්ෂය අවසානයේ ඍජු රැකියා 936 ක් ලබා දී ඇති අතර දැනට වක්‍ර රැකියා අවස්ථා 18,000කට වැඩි ප්‍රමාණයක් අප විසින් නිර්මාණය කර ඇත. සැලසුම් කර ඇති සියලුම ව්‍යාපෘති ආරම්භ කිරීමත් සමඟ ඍජු රැකියා සංඛ්‍යාව ක්‍රමයෙන් 1,500 දක්වාත් වක්‍ර රැකියා අවස්ථා 25,000 දක්වාත් වැඩි කිරීමට අපි සැලසුම් කර තිබේ. නව ආදායම් මාර්ග සමඟින් ප්‍රජාවගේ ජීවනෝපාය නඟාසිටුවීමට මෙමගින් උපකාර වනු ඇත. කර්මාන්ත ශාලාව පිහිටි ප්‍රදේශයේ පසුගිය වසර කිහිපය තුළ සැලකිය යුතු සංවර්ධනයක් වූ බවට සාක්ෂි පවතී.

විවිධ හේතූන් මත විශේෂයෙන් උක් රෝග, අනපේක්ෂිත ගංවතුර, අධික නියඟ තත්ත්වයන් හේතුවෙන් අස්වැන්න පහත වැටුනු අතර 2018/19 වර්ෂයේ සීනි නිෂ්පාදනය අප අපේක්ෂා කළ ඉලක්කයට වඩා අඩු මට්ටමක පැවතුනි. තවද, ප්‍රධාන වශයෙන් අයහපත් කාලගුණික තත්ත්වයන්, පළිබෝධ සහ රෝග හේතුවෙන් උක්වලින් නිස්සාරණය කර ගත හැකි සීනි ප්‍රමාණය පහත වැටුණි. අපි දින 205 ක් ක්‍රියාත්මක කිරීමෙන් මූල්‍ය වර්ෂය සඳහා ඊ එන් ඒ නිෂ්පාදන ඉලක්කය වන ලීටර් 5,000,000 න් 86% ක් නිපදවූයෙමු. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ අපගේ විකුණුම් සහ අප සතු තොග පහත වැටීමයි. ජෛව කොම්පෝස්ට් නිෂ්පාදනදී ද එම ප්‍රශ්නයට මුහුණ දීමට සිදු වූ අතර ඉලක්කයට සාපේක්ෂව කොම්පෝස්ට් නිෂ්පාදනය අඩු කිරීමට අපට සිදු විය.

සීනි කර්මාන්තය කෘෂිකාර්මික කර්මාන්තයක් වන අතර එය ප්‍රධාන වශයෙන් කාලගුණය, රෝග සහ රජයේ ප්‍රතිපත්ති වැනි බාහිර සාධක මත රඳා පවතී. මෙම සාධක කාලයෙන් කාලයට වෙනස් වන අතර, කර්මාන්තයට හිතකර සහ අහිතකර තත්ත්වයන් උදා කරයි. සීනි නිෂ්පාදන අංශයේ ප්‍රධාන ගැටලු වන්නේ අඩු ඵලදායිතාව, මෝල් / ස්කාගාර ධාරිතාව භාවිතය සහ ක්‍රියාකාරිත්වයේ පරිමාණය, ශ්‍රම හිඟය, සීනි සහ එහි අතුරු නිෂ්පාදන සඳහා නිසි මිලකරණ යාන්ත්‍රණයක් නොමැතිකම, කර්මාන්තය ආරක්ෂා කිරීමේ පියවර සහ නිසි ව්‍යවස්ථාදායක සහ ආයතනික රාමුවක් ය. රජයේ නව රෙගුලාසි හේතුවෙන් ඇතැම් කාලසීමාවන් තුළ පොහොර සහ වල්නාශක හිඟය ද උක් අස්වැන්න කෙරෙහි බලපා තිබුණි. රජය විසින් ඇතැම් වල්නාශක තහනම් කර පොහොර ආනයනය සීමා කර ඇතත් විවෘත වෙළෙඳපොළේ නොතිබුණි. නිසි කල අප අස්වනු නෙලනු ලැබුවද, සමහර ඉඩම්වලට ජල සම්පාදන පහසුකම් නොමැතිකම හා දුර්වල ජලවහනය, සමහර ගොවීන් නිරී බෝග කළමනාකරණය දුර්වල වීම සමහර ක්ෂේත්‍රවල අස්වැන්න අඩුවීමට හේතු විය.

අපි ඉදිරි වසර දෙස සුබවාදීව බලා සිටින අතර කර්මාන්ත වටාපිටාව වඩාත් හිතකර වනු ඇතැයි අපේක්ෂා කරමු. වගා ක්ෂේත්‍ර ආශ්‍රිත ගැටලු මහඟරවා ගැනීම සඳහා සමාගම විසින් තිරසාර මූලාරම්භයන් රැසක් ක්‍රියාත්මක කරයි. ප්‍රභේද පැනිකඩ සඳහා ප්‍රතිරෝධී ප්‍රභේද සංවර්ධනය කිරීම සහ හඳුන්වාදීම, තවාන්වල සිටුවීම සඳහා උණු වතුර පිරියම් කරන ලද ප්‍රාථමික උක් භාවිතා කිරීම, ක්ෂේත්‍ර සනීපාරක්ෂාව පවත්වා ගැනීම පළිබෝධ සහ රෝග කළමනාකරණය ඊට ඇතුලත්ය. ජලාපවහන පහසුකම් වැඩිදියුණු කිරීම, වාරිමාර්ග පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම සහ ජෛව කොම්පෝස්ට් පොහොර බෙදා හැරීම ප්‍රශස්ත අස්වැන්නක් ලබා ගැනීමට පහසුකම් සපයයි. තවද, වගාව කෙරෙහි ඇති උනන්දුව වැඩි කිරීම සඳහා ගොවීන් අතර අස්වනු ලාභාංශ දියත් කිරීමට සමාගම සැලසුම් කර ඇත. වගා ක්ෂේත්‍රවල ප්‍රභේද පැනිකඩ සඳහා ඉහළ සීනි අස්වැන්නක් ලබා දෙන ප්‍රභේද හඳුන්වා දීම සහ සීනි කම්හලේ පැරණි යන්ත්‍ර සූත්‍රවලින් නව අධි තාක්ෂණික යන්ත්‍ර සූත්‍ර වෙත මාරු වීමෙන් උකහාගත හැකි සීනි ප්‍රමාණය වැඩි වනු ඇත.

උක් වගා කිරීම සඳහා පමණක් වෙන් කර ඇති හෙක්ටයාර 5,202 ක භූමි ප්‍රමාණයක්; වසර 50 කට වඩා වැඩි පළපුරුද්ද සහිත ගොවියන්ගේ දැනුම සහ විශේෂඥභාවය; වාරිමාර්ග පහසුකම් සහ යටිතල පහසුකම් සඳහා ප්‍රවේශය, සහ උක් පර්යේෂණ ආයතනය සමඟ බීජ උක් සම්බන්ධයෙන් පවත්නා සම්බන්ධීකරණය සහ අනෙකුත් කාර්ය මණ්ඩලයේ දැනුම හා අත්දැකීම් වැනි අර්ථාන්විත ශක්තීන් අප සමගම සතු ය. එල්.ඕ.එල්.සී. පී එල් සී සහ බ්‍රවුන් සහ සමාගම කොටස්කාරිත්වයන් ගල්ඔය වැවිලි සමාගම ආරම්භයේ සිටම සමාගමේ කළමනාකාරිත්වය සඳහා උපරිම සහයෝගය ලබාදී ඇත. මෙම සාධක ඔස්සේ ගල්ඔය වැවිලි සමාගම සිය සීනි නිෂ්පාදනය සඳහා පවතින ඉල්ලුම සපුරාලීමට සැපයුම ප්‍රමාණවත් නොවන වෙළඳපොළක් වෙත අවතීර්ණ වීමට හොඳින් සූදානම්ව සිටී.


ශ්‍රී ලංකා රජය, අමාත්‍යාංශ, භාණ්ඩාගාරය, දේශපාලනඥයින් සහ රාජ්‍ය නිලධාරීන්, LOLC සහ බ්‍රවුන්ස් කළමනාකාරිත්වය, සභාපතිවරයා සහ අධ්‍යක්ෂ මණ්ඩලය මෙම කාලසීමාව පුරාවට අඛණ්ඩව සහයෝගය ලබා දීම සම්බන්ධයෙන් මම ස්තුතිවන්ත වීමට කැමැත්තෙමි. අපගේ අගනා ගොවීන්ට, ගොවි සමාජ නායකයින්ට, කැපවීමෙන් හා වෙහෙස මහන්සි වී වැඩ කරන කළමනාකරණ කාර්ය මණ්ඩලයට, සියලුම සේවකයින්ට වසර පුරාවට ඔවුන් ලබාදුන් සහයෝගය සහ කැපවීම වෙනුවෙන් මගේ අවංක ස්තුතිය පුද කරමි. අම්පාර දිස්ත්‍රික්කයේ අතිපූජ්‍ය නාහිමිපාණන් වහන්සේ ප්‍රමුඛ සෙසු ආගමික නායකයින් ලබාදුන් වටිනා අවවාද සහ සහයෝග වෙනුවෙන් ඒ සැමට මගේ ගෞරව පූර්වක කෘතඥතාව පිරි නැමිය යුතුය.

සුරත් පෙරේරා
ප්‍රධාන මෙහෙයුම් නිලධාරී
ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම
2020.07.24


මූල්‍ය අවධාරණයන්

ගල්ඔය

සමාගම ලබාගත් ණය (රුපියල්)




සමාගමේ සමස්ත වත්කම්




- දේපළ පිරියත යන්ත්‍රෝපකරණ
- භාණ්ඩ ලේඛණ (ඉන්වෙන්ට්‍රි)
- ගොවීන්ට ලබාදුන් ණය
- භූමිය හා ගොඩනැගිලි භාවිතා හිමිකම්
- නොනිමි මූලධන ආයෝජන
- වෙළඳාම සහ අනෙකුත් ලැබිය යුතු දේ
- සංවර්ධිත යටිතල පහසුකම්
- මුදල් සහ ඊට සමාන වත්කම්
- ලැබිය යුතු ආදායම් බදු
- අදාළ පාර්ශවයෙන් ගෙවිය යුතු මුදල
- ජෛව වත්කම්


පිරිවැය හා වියදම් 2018/19



සමාගමේ කොටස් හිමිකම්



අයහාරය හා වෙනත් ආදායම් (රුපියල්)



කොටස් හිමියන්ගේ ආයෝජන

ගල්ඔය



ලංකා ඔරික්ස් ලීසින් සමාගම

LOLC
imagine the possibilities

වසර තිස් හතරකට ප්‍රථම, ආනාගතය පිළිබඳ මනා පෙර දැක්මකින් යුත්, ඉතා නිවැරදිව කාලය විනිවිද යාමේ හැකියාව සහිත සමාගමක් විසින් එවකට ශ්‍රී ලාංකීය වෙළෙඳ ක්ෂේත්‍රය තුළ ප්‍රබල උවමනාවක්ව පැවති කල්බදු විසඳුම් සැපයීමේ ප්‍රමුඛයා ලෙස සිය දොරටු විවෘත කරන ලද්දේ ලංකා ඔරික්ස් ලීසින් සමාගමයි (LOLC). ඉතා කෙටි කලක් තුළ ණය එකතුකිරීම, ඉතුරුම් හා තැන්පතු, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ඉලක්ක කරගත් මූල්‍ය පහසුකම්, ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම්, ඉස්ලාම් මූල්‍ය පහසුකම් හා විදෙස් විනිමය තැන්පතු යනාදී කල්බදු පහසුකම් සැපයීමෙන් ඔබ්බට ගමන්කරමින් විශේෂකරණය වූ මූල්‍ය සේවාවන් රැසක් සපයමින් LOLC ආයතනය විසින් ඔරික්ස් ලීසින් සමාගම් සමූහය ස්ථාපනය කරන ලදී. විවිධාකාර ක්ෂේත්‍රයන්හි නියැළීම තුළින් ලද සමුච්චිත ඵලය මනාව තුළනය කරගනිමින්, LOLC ආයතනය රථවාහන කළමනාකරණය, තොරතුරු තාක්ෂණය හා රථවාහන ආශ්‍රිත සේවාවන් සැපයීම ආරම්භ කරන ලදී. ශ්‍රී ලංකාවේ වර්ධනය හා සංවර්ධනය ආශ්‍රිත ක්ෂේත්‍රයන් තුළ මතුවන නව ව්‍යවසායකත්ව අවස්ථා පෙළගැස්වීම සඳහා LOLC ආයතනය උපායමාර්ගික තීරණයකට එළඹුණි. එමඟින් ස්වකීය ව්‍යාපාරික කටයුතුවල වර්ධනයක් අත්පත්කර ගනිමින්ම කෘෂිකර්මාන්තය, විනෝද කටයුතු, ඉදිකිරීම් හා පුණර්ජනනීය බලශක්ති යනාදී ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කරනු දක්නට හැකිය. අද වන විට LOLC ආයතනය නිසැක වශයෙන්ම තිරසාර වූ ශ්‍රී ලාංකීය ව්‍යාපාර සමූහ අතරින් එකක් බවට පත්ව තිබේ. කෙසේ නමුත්, නොවෙනස්ව හෝ හායනය නොවී පවතින්නේ අනාගත සාර්ථකත්වය උදෙසා සමාගම සතු වූ ගාමක බලය, ක්‍රියාශූර බව, දැඩි උද්‍යෝගය හා සියලු දෙනාටම ඉඩ ප්‍රස්ථා විවෘත කරදීමට පවතින පරම හැකියාවයි. අපගේ ව්‍යාපාරය හැමවිටම පෙරමුණ ගන්නේ ව්‍යවසායකයන් ඉහළ කළමනාකාරීත්වය වෙත බද්ධ කිරීමේ සිට ජන ජීවිත හා ජීවනෝපායන් වැඩිදියුණු කිරීම හා ඒවායේ ඉදිරි ගමන සැලසීම, ඔවුන්ගේ සිහින සැබෑ කිරීම හා දීර්ඝ කාලීන අභිලාශයන් මුදුන් පමුණුවාලීම මෙන්ම ජනතාව බලගැන්වීම සඳහා අවශ්‍ය භාණ්ඩ හා සේවාවන් සැපයීම පිණිස ය.



බ්‍රවුන්ස් සහ සමාගම

බ්‍රවුන්ස් සහ සමාගම කර්මාන්ත ක්ෂේත්‍ර හතක් ඔස්සේ ස්වකීය මෙහෙයුම් විවිධාංගීකරණය කළ සමූහායතනය කි. වසර 135 කට අධික කාලයක් පුරා ව්‍යාපාරික ක්ෂේත්‍රයේ රැඳී සිටිමින් ශ්‍රී ලාංකීය පාරිභෝගික අවශ්‍යතා පිළිබඳ සමාගම ලද ගැඹුරු අවබෝධය සියලුම ශ්‍රී ලාංකිකයන් වෙත උසස් ගුණාත්මයෙන් යුත් භාණ්ඩ හා සේවාවන් සැපයීමේ දී භාවිතා කරනු ලබයි.

බ්‍රවුන්ස් සමූහායතනය, ප්‍රමුඛ පෙළේ ගෝලීය වෙළෙඳ සන්නාම කීපයක් සමඟ කටයුතු කරයි. ඔස්ට්‍රියානු ගුවන් ප්‍රවාහන සමාගම, බීජී, කොන්ටිනෙන්ටල් ගුවන් ප්‍රවාහන සමාගම, ඉක්ලිප්ස්, එක්සයිඩ් බැටරිස්, ඉන්ටර්වට්, ඔසී, ඔලිම්පස්, ශාර්ප්, ඉයුකනුබා, ටැෆේ, සැග්රෝ, යන්මාර් මැරීන් එන්ජින්ස්, අශෝක් ලේලන්ඩ් මැරීන්, පිටිනි බොව්ස්, ස්කැන්ඩිනේවියන් ගුවන් ප්‍රවාහන සමාගම, මකීටා, මැක්ටෙක්, එෆ්.ජී. විල්සන්, යමාෂා, ඩෙලිම් රෝයල් බොයිලර් සමාගම, එම්.එෆ්.ජී. සිෆැන්ග් සහ මැසී ෆර්ගියුසන් ඉන් කිහිපයකි. බ්‍රවුන්ස් සහ සමාගම දැනටමත් දීප ව්‍යාප්ත ගෘහස්ථ වෙළෙඳ නාමයකි.

බ්‍රවුන්ස් සහ සමාගම නිසොල්මන්ව නමුත් වේගවත්ව, සරලව හා බාධාවකින් තොරව, විෂය පථයන් විශාල ලෙස පුළුල්කරමින් හා අප සේවාවන් සපයන සැමට භාණ්ඩ, සේවාවන් හා වටිනාකම් අතින් විශිෂ්ටත්වය මුදාහරිමින්, සක්‍රිය, නවීන සහ අනර්ඝ සමාගම බවට අපි අද පත්ව සිටිමු.

අධ්‍යක්ෂ



කීර්ති බී. කොටගම - සභාපති

කීර්ති බණ්ඩාර කොටගම මහතා කෘෂිකර්ම විද්‍යාවේදී (ගෞරව) උපාධිය, ව්‍යාපාර කළමනාකරණ (මූල්‍ය හා තාක්ෂණික කළමනාකරණය) විද්‍යාපති උපාධිය කෘෂිකර්මය හා ව්‍යාපාර කළමනාකරණය යන ක්ෂේත්‍රයන්හි වෘත්තීය විධායක නිලධාරියෙකි. ඔහු ස්වකීය කෘෂිකර්ම විද්‍යාවේදී (ගෞරව) උපාධිය ශ්‍රී ලංකා පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙන් ලබා ගත් අතර තායිලන්තයේ ආසියානු තාක්ෂණික ආයතනයෙන් ව්‍යාපාර කළමනාකරණ (මූල්‍ය හා තාක්ෂණික කළමනාකරණය) විද්‍යාපති උපාධිය ලබාගෙන තිබේ. ඒ මහතා විසින් ඉටුකළ සේවාවන් හා ලබාදුන් දායකත්වය දේශීය හා ජාත්‍යන්තර සංවිධාන කීපයක ගෞරවයට හා පිළිගැනීමට පාත්‍ර වී තිබේ.

ඩී. එම්. එල්. බණ්ඩාරනායක - අධ්‍යක්ෂ

ඔස්ට්‍රේලියාවේ වික්ටෝරියා විශ්ව විද්‍යාලයේ , එම්.ඒ (සිංහල භාෂාව), කැලණිය විශ්ව විද්‍යාලය, බී.ඒ. (පේරාදෙණිය විශ්ව විද්‍යාලය), රාජ්‍ය කළමනාකරණ ඩිප්ලෝමාව, ස්ලිඩා. බණ්ඩාරනායක මහතා 2018 සිට අම්පාර දිස්ත්‍රික් ලේකම්වරයා වේ. ඔහු ඌව පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම්, වැවිලි අමාත්‍යාංශයේ අතිරේක ලේකම්, පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශයේ අතිරේක ලේකම්, ඇල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රාදේශීය ලේකම්, ඌව පළාතේ එම්.ඩී.ටී.අයි හි අධ්‍යක්ෂ , ඌව පළාත් ඉඩම් කොමසාරිස්, හපුතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සහකාර ප්‍රාදේශීය ලේකම්, වාරිමාර්ග අමාත්‍යාංශයේ සහකාර ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ සහ ගුරු පදවිය යන තනතුරු හොබවා ඇත.





එස්. ගිරිදරන් - අධ්‍යක්ෂ

එස්. ගිරිදරන් මහතා රාජ්‍ය අංශයේ ප්‍රමුඛ වෘත්තිකයෙකි. ඔහු මුදල් අමාත්‍යාංශයේ මහලේකම් කාර්යාලයේ තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජෙනරාල්වරයෙකි. ඔහු ශ්‍රී ලංකා පරිපාලන සේවයේ වසර 24 කට වැඩි පළපුරුද්දක් ලබා ඇත. මඩකලපුවේ ශාන්ත මයිකල් විද්‍යාලයේ නිර්මාණයක් වන එස්. ගිරිදරන් මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ කළමනාකරණය පිළිබඳ පශ්චාද් උපාධි ආයතනයෙන් රාජ්‍ය කළමනාකරණය පිලිබඳ විද්‍යාපති උපාධියත් නැගෙණහිර විශ්ව විද්‍යාලයෙන් විද්‍යාවේදී උපාධියත් ලබා ගෙන තිබේ. රොටරි සමාජයේ මඩකලපුව උරුමයේ සභාපති වීම වැනි සමාජ ක්‍රියාකාරකම් සමඟ ගිරිදරන් මහතා සම්බන්ධ වේ.

බී එම් ඩී බණ්ඩාර බස්නායක - අධ්‍යක්ෂ

බස්නායක මහතා ව්‍යාපාරික පරිපාලනය පිළිබඳ ලන්ඩන් මෙට්‍රොපොලිටන් විශ්ව විද්‍යාලයේ උපාධිධාරියෙකු වන අතර ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ පීඅයිඑම් හි ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විධායක ශාස්ත්‍රපතිවරයෙකි. එසේම, ඔහු ඇමරිකා එක්සත් ජනපදයේ හොනොලුලු විශ්ව විද්‍යාලයෙන් එම්. බී. ඒ. උපාධියක් ලබා ඇත. ඇසෝසියේටඩ් පුවත්පත් සිලෝන් ලිමිටඩ් හි මූල්‍ය අධ්‍යක්ෂවරයා වන ඔහු බොහෝ පෞද්ගලික සමාගම්වල විධායක අධ්‍යක්ෂවරයෙකු ලෙස සේවය කර ඇත. විශේෂයෙන් මුද්‍රිත මාධ්‍ය, විදුලි සංදේශ, ඖෂධ සහ වෙළඳාම යන අංශවල විශාල ව්‍යාපාර කළමනාකරණය කිරීමේ අත්දැකීම් ඔහු සතු ය.





එන්.එස්. වනසිංහ - අධ්‍යක්ෂ

එම්.ඒ (ආර්ථික විද්‍යාව) කැලණිය විශ්ව විද්‍යාලය, බී.කොම් (විශේෂ) - ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය. වනසිංහ මහතා වර්ෂ 2015 සිට වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (සැලසුම්) වේ. ඔහු පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (සැලසුම්), කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්), මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහකාර අධ්‍යක්ෂ (සැලසුම්), රජරට නවෝදය ව්‍යාපෘතියේ නියෝජ්‍ය අධ්‍යක්ෂ සහ 2002 සිට උතුරු මැද පළාත් ග්‍රාම සංවර්ධන ව්‍යාපෘතියේ (ඒඩීබී) සහකාර අධ්‍යක්ෂ.

මණ්ඩලය (2019 මාර්තු 31 දිනට)

ගල්ඔය



කේ. ඒ. කේ. පී. ගුණවර්ධන - අධ්‍යක්ෂ

නීතිඥ, අලෙවිකරණ කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (පී.අයි.එම්, ශ්‍රී ජයවර්ධනපුර) ප්‍රධාන මෙහෙයුම් නිලධාරී - එල්ඕඑල්සී, ප්‍රධාන නීති නිලධාරී - එල්ඕඑල්සී සමූහය. 2004 දී එල්.ඕ.එල්. සී. හා සම්බන්ධ වූ අතර නීතිඥයෙකු ලෙස වසර 30 කට වැඩි පළපුරුද්දක් ඇත. ඔහු නීතිපති දෙපාර්තමේන්තුවට අනුයුක්ත රජයේ නීති කවුසිල කාර්යාලය, ශ්‍රී ලංකාවේ සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ නෛතික හා බලාත්මක කිරීමේ අධ්‍යක්ෂ කාර්යාලය සහ ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය ඇතුළු රජයේ වැදගත් තනතුරු ගණනාවක් දරා ඇත. පාරිභෝගික කටයුතු අධිකාරියේ පළමු අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස එය පිහිටුවීමට සම්බන්ධ විය. ඔහු එල්.ඕ.එල්. සී.සමූහයේ දේශීය හා විදේශීය උප සමාගම් ගණනාවක මණ්ඩලවල සේවය කරයි.



ඩබ්. කේ. ඩී. ටී. අබේරත්න - විධායක අධ්‍යක්ෂ

විද්‍යාවේදී විශේෂ උපාධිය (ඉංජිනේරු විද්‍යාව), (එක්සත් රාජධානියේ වරළත් ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ අධි සාමාජික, එක්සත් රාජධානියේ අලෙවිකරණය පිළිබඳ වරළත් ආයතනයේ අධි සාමාජික, එක්සත් රාජධානියේ වරළත් ගෝලීය කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ අධි සාමාජික, ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ ආයතනයේ අධි සාමාජික. අබේරත්න මහතා වර්තමානයේ දී සීමාසහිත ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගමේ විධායක අධ්‍යක්ෂ තනතුරත්, සීමාසහිත ගල්ඔය (පුද්ගලික) සමූහ ව්‍යාපාරයේ අධ්‍යක්ෂ තනතුරත් හොබවයි. එතුමා, බ්‍රවුන් සහ සමාගමේ (පී.එල්.සී.) ප්‍රධාන මෙහෙයුම් නිලධාරී තනතුරද දරයි. බහුජාතික සමාගම් ද ඇතුළුව දිවයිනේ ප්‍රමුඛ පෙලේ සමාගම් කිහිපයක කළමනාකරණ ශ්‍රේෂ්ඨයේ වසර 10ක ට ආසන්න පළපුරුද්දක් ඔහු සතු ය. බහුජාතික සමාගම්වල සේවයේ යෙදී සිටියදී ඒ මහතා විදෙස් ව්‍යාපෘතිවල නියැළී ඇත.



ආර්. එම්.ජී කේ. බී රත්නායක - අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී

කෘෂිකර්ම විද්‍යාවේදී (විශේෂ) උපාධිය (පේරාදෙණිය විශ්ව විද්‍යාලය), කෘෂිකර්ම දැනුම්-පද්ධති කළමනාකරණය විද්‍යාපති උපාධිය (වාගනින්ගන් විශ්ව විද්‍යාලය, නෙදර්ලන්තය), ඉඩම් ප්‍රතිසංස්කරණය හා ග්‍රාමීය සංවර්ධනය පිළිබඳ ඩිප්ලෝමාව (තායිවානය හා පිලිපීනය), නියඟයට ග්‍රාහී ප්‍රදේශ පිළිබඳ විශේෂ අවධානය යොමුකළ ජල පෝෂක කළමනාකරණ වැඩසටහන (ඉන්දියාවේ ගුවාහාටි සහ ඇසැමී ප්‍රදේශ). ගාමිණී රත්නායක මහතා සීමාසහිත ගල්ඔය වැවිලි පුද්ගලික සමාගමේ හා සීමාසහිත ගල්ඔය (පුද්ගලික) සමූහ ව්‍යාපාරයේ වත්මන් අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරීවරයායි. ගොවිජන පර්යේෂණ ක්ෂේත්‍රයේ වසර 17 කට වැඩි පළපුරුද්දක් සහිත ඒ මහතා උක් පර්යේෂණ ආයතනයේ ක්‍රියාකාරී අධ්‍යක්ෂ, අතිරේක වැවිලි බෝග සංවර්ධන අමාත්‍යාංශයේ ව්‍යාපෘති අධ්‍යක්ෂ, සහ තල් සංවර්ධන මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී යන තනතුරු ද හොබවා ඇත.



වසන්ත ඩී. බටගොඩ - අධ්‍යක්ෂ

එල්. එල්. බී.(ගෞරව), (කොළඹ) එල්.එල්.එම්. (කොළඹ). නීතිඥ

වසන්ත බටගොඩ, නීති වෘත්තියේ වසර 16 ක ක්‍රියාකාරී ලෙස අභ්‍යාසයේ නියැලෙන නීතිඥයෙකි. 2003 දී නීති වෘත්තියට ඇතුළත් වූ ඔහු මුල් උසාවිවල සහ අභියාචනාධිකරණවල ද නීතිමය කටයුතුවල නිරත විය. ඔහු කොළඹ විශ්ව විද්‍යාලයේ නීති පීඨයෙන් එල්.එල්.බී දෙවන පන්තියේ ගෞරව සාමාර්ථයත් බුද්ධිමය දේපළ නීතිය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියත් ලබා ගත්තේය. ඔහු 2014 දක්වා ජ්‍යෙෂ්ඨ ජනාධිපති නීතිඥවරයා සමඟ ඉහළ පෙළේ අපරාධ නඩු ගණනාවක පෙනී සිටියේය. ඔහු 2014 දී එල්. ඕ . එල්. සී. සමූහයට සහකාර සාමාන්‍යාධිකාරී ලෙස සම්බන්ධ වූ අතර දැනට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නීති සහ උපායමාර්ගික ව්‍යාපාර) ලෙස සේවය කරයි. ඔහු බ්‍රවුන් සහ සමාගම් පීඑල්සී සහ මතුරට වැවිලි සමාගමේ නීති ප්‍රධානියා ලෙස කටයුතු කරයි. එසේම ඔහු සිලෝන් ග්‍රැෆීන් ලිමිටඩ් හි අධ්‍යක්ෂවරයෙකි.



ජන්සෙනි කුහනේසන් - සමාගම් ලේකම්

එල්.ඕ.එල්.සී.ආයතනික සේවා (පුද්ගලික) සමාගම සඳහා ලේකම් සේවාවන් සපයමින් එම ආයතනය නියෝජනය කරන ජන්සෙනි කුහනේසන් මහත්මිය වරලත් ලේකම්වරුන්ගේ සහ පරිපාලකයින්ගේ ආයතනයේ (එක්සත් රාජධානියේ) අධි සාමාජිකාවකි. එල්.ඕ.එල්.සී. සමූහයට සම්බන්ධ වීමට පෙර ඇය ආර්.අයි.එල්. දේපළ පීඑල්සී හි සමාගම් ලේකම් සහ ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ සහ ලංකා සංචාරක මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරියක් ලෙස කටයුතු කළාය.

ජෙයෂ්ඨ



එම්.එම්.ඩී.එස්.එන්. පෙරේරා
ප්‍රධාන මෙහෙයුම් නිලධාරී



ඒ.එච්.ඩබ්.මධුෂාන්
මානව සම්පත් හා පරිපාලන ප්‍රධානී



එස්.එම්.එස්.පී. කුමාර
ප්‍රධාන කළමනාකරු -කර්මාන්ත ශාලාව



ටී. අයි. විජේසිංහ
වැඩපොළ කළමනාකරු



කේ. ටී. එස්. කුමාර
බාහිර වගා කළමනාකරු

කළමනාකාරිත්වය

ගල්ඔය



බී. මයිල්රාජ්කර්තිකේයන්
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - ස්කාගාරය



එම්.ඒ.සී. මුණසිංහ
මුල්‍ය ප්‍රධානී



එච්.සී. ගුණරත්න
ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරී




ඩබ්. ඒ. එන්. චතුරංග
කළමණාකරු- නඩත්තු



එච්. එම්. ඒ. බණ්ඩාර
වැවිලි කළමණාකරු

සමාගම් ව්‍යූහය

ගල්ඔය



වගා කටයුතු

ගල්ඔය

වර්ෂ 2019 මාර්තු 31න් අවසන් වූ වර්ෂයේ

ප්‍රතිඵල

175,056 මෙ.ටො.
වගා ක්ෂේත්‍රවලින්

3,380 හෙක්.
අවසන් කල රෝපණ කටයුතු

2018/19 සඳහා අස්වැන්න

52 මෙ.ටො./ හෙක්.
සාමාන්‍ය අස්වැන්න

10,282 මෙ.ටො.
ශෂ්‍ය විද්‍යා අංශයෙන්

4,625 හෙක්.
පවතින උක් බිම් ප්‍රමාණය

වර්ෂ 2019 මාර්තු 31න් අවසන් වන වර්ෂයේ

ඉලක්ක

290,432 මෙ.ටො.
වගා ක්ෂේත්‍රවලින්

මූළු අස්වැන්න වර්ධනය වීම

13,655 මෙ.ටො.
ශෂ්‍ය විද්‍යා අංශයෙන්

3,500 හෙක්.
නව හා නැවත වගා කිරීම්

ගොවි පවුල් 4,400 ක් සඳහා වෙන් කර දී ඇති හෙක්ටයාර් 5,200 ක් පමණ වූ වාරි ඉඩම් ප්‍රමාණය ද ඇතුළත්ව සමස්ත උක් වගාව හෙක්ටයාර් 7,659 කින් සමන්විත වේ. ව්‍යාපෘති ප්‍රදේශය වරිපතන්චේන, ගල්මඩුව, දීසවාපි, හිඟුරාන සහ නීත්ත නමින් ප්‍රධාන කලාප 05 කට බෙදා ඇත. ජල යෝජනා ක්‍රමයක් සහිත හෙක්ටයාර් 166 කින් යුත් කේන්ද්‍රීය වතුයාය උක් වගා කළ හැකි ඉඩම් හෙක්ටයාර් 5,200 ට අවශ්‍ය පහසුකම් සලසයි.


කලාපය	වගා වපසරිය (හෙක්ටයාර්)	කට්ටිකරුවන් සංඛ්‍යාව
වරිපතන්චේන	1,067	947
ගල්මඩුව	1,233	926
දීසවාපි	1,034	870
හිඟුරාන	764	697
නීත්ත	1,104	1,001
එකතුව	5,202	4,441

උක් පැළ තවාන

ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගමේ ශෂ්‍ය විද්‍යා අංශය බීජ උක් නිෂ්පාදනය, පළිබෝධ සහ රෝග පාලනය කිරීම, කෘෂිකාර්මික කාර්ය මණ්ඩලය සහ ගොවීන් සඳහා ව්‍යාප්ති වැඩසටහන් පැවැත්වීම සහ උක් පර්යේෂණ ආයතනය (එස් ආර් අයි) සමඟ එක්ව උක් වගාවේ විවිධ අංශ පිළිබඳ පර්යේෂණ පැවැත්වීම සිදු කරයි. මෙම අංශය අනාගත රෝපණ ද්‍රව්‍ය සහ අත්භදා බැලීමේ වැඩසටහන් සඳහා ප්‍රභවයක් ලෙස උක් පර්යේෂණ ආයතනයේ උක් ක්ලෝන 20 කට අධික ප්‍රමාණයක් පවත්වාගෙන යයි. තවාන් ප්‍රදේශය හෙක්ටයාර 201කින් සමන්විත වන අතර ඉන් හෙක්ටයාර් 72 ක් ප්‍රාථමික බීජ උක් නඩත්තුව සඳහා ද හෙක්ටයාර් 120ක් ද්විතියික තවාන් සඳහාද සැලසුම් කර ඇත. තවානට අමතරව, කොන්ත්‍රාත් බීජ උක් ගොවීන් ද සමස්ත බීජ උක් අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම සඳහා බීජ ලබා දෙයි.

ජයග්‍රහණ

මූල්‍ය වර්ෂය අවසන් වන විට ප්‍රධාන වගා කලාප 5 වන වරිපතන්චේන, ගල්මඩුව, දීසවාපි, හිඟුරාන, නීත්ත මෙන්ම අම්පාර හා සියඹලාණ්ඩුවේ බාහිර වගාකරුවන්ගේ වගා ප්‍රදේශවල හෙක්ටයාර් 5,999 ක උක් වගා කරන ලදී.



සුළු ගොවි කෘෂි ව්‍යාපාර හවුල්කාරිත්ව වැඩසටහන (SAPP)

උක් අස්වැන්නත් සමඟ අතුරු වගාව ව්‍යාප්ත කිරීම මගින් අම්පාර දිස්ත්‍රික්කයේ ඉඩම් ලාභීන්ගේ අදායම ඉහළ නැංවීමේ අරමුණින් 2017 වසරේදී සුළු ගොවි කෘෂි ව්‍යාපාර හවුල්කාරිත්ව වැඩසටහන (SAPP) සමඟ ගල්ඔය වැවිලි සමාගම හවුල් විය. හවුල්කාරිත්වයේ අරමුණු වූයේ උක් අස්වැන්න ඉහල නැංවීම සහ ගොවීන්ගේ අදායම ඉහල නැංවීම යි. හවුල්කාරිත්වයේ ප්‍රධාන ලක්ෂණ අතරට ව්‍යාප්ති සහාය, කාරක ප්‍රාග්ධනය සඳහා ණය ප්‍රවේශය, බෝග රක්ෂණය සහ ගොවීන් සඳහා උපකරණ ප්‍රදානය ඇතුළත් විය. මෙම වැඩසටහනේ දී ප්‍රතිලාභීන් 4,000 ක් හවුල්කාරිත්වයට ඇතුළත් කර ඇති අතර සුදුසුකම් ලත් ගොවීන් සඳහා වසරකට 6.5% ක පොලී අනුපාතයකට උපරිම වශයෙන් රු.230,000 ක් සහ රු.34,500 ක් වටිනා බහුකාර්ය යන්ත්‍රයක් බැගින් ලබා දී ඇත.

උක් වගාවේ ප්‍රගතිය


2018/19 කන්නය තුළ අපගේ උක් වගාවන්ගෙන් සහ ශෂ්‍ය විද්‍යා අංශයේ ක්ෂේත්‍රවලින් වාණිජ උක් දඬු මෙට්‍රික් ටොන් 152,916 ක වාණිජ උක් අස්වැන්නක් ලබාගෙන ඇත. මෙම කාලය තුළ වාණිජ උක් වලට අමතරව බීජ උක් මෙට්‍රික් ටොන් 32,422.140 ක අස්වැන්නක් ලබාගෙන ඇත. වැවිලි දෙපාර්තමේන්තුව යටතේ ඇති ප්‍රදේශවලින් වාණිජ උක් දඬු මෙට්‍රික් ටොන් 150,709.580 ක් ද, බීජ උක්දඬු මෙට්‍රික් ටොන් 24,346.510 ක් ද අස්වනු නෙළා ඇති අතර සාමාන්‍ය අස්වැන්න හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන් 52 කි.

2017/18 සඳහා නව වගාවන් ප්‍රතිස්ථාපනය කිරීම

නව වගා ප්‍රදේශ	ප්‍රමාණය (හෙක්.)
ශෂ්‍ය විද්‍යා අංශය	114
වගා ක්ෂේත්‍ර	2397
බාහිර වගාකරුවන් - අම්පාර	422
බාහිර වගාකරුවන් - සියඹලාණ්ඩුව	447
එකතුව	**3380**

දැනට පතින වගා ප්‍රදේශ (ශෂ්‍ය විද්‍යා අංශය + වගා ක්ෂේත්‍ර + බාහිර වගාකරුවන්)

බෝග වර්ගය	ප්‍රමාණය (හෙක්.)
රෝපිත බෝගය	3034
පළමු නිරි බෝගය	1016
දෙවැනි නිරි බෝගය	378
තෙවැනි නිරි බෝගය	91
සිව්වැනි නිරි බෝගය	35
පස්වැනි නිරි බෝගය	43
හයවැනි නිරි බෝගය	24
හත්වැනි නිරි බෝගය	3
අටවැනි නිරි බෝගය	0
නමවැනි නිරි බෝගය	1
එකතුව	**4625**





Harvesting at Galmaduwa Zone



සීනි නිෂ්පාදනය
ගල්ඔය

2019 මාර්තු 31න් අවසන් වූ වසරේ

ප්‍රතිඵල

152,017 මෙ.ටො.
ඇඹරූ මුළු උක්දඬු ප්‍රමාණය

9,565 මෙ.ටො.
සීනි නිෂ්පාදනය

8,076 මෙ.ටො.
මොලැසස් නිෂ්පාදනය

6.74 %
සීනි ප්‍රතිසාදනය

2020 මාර්තු 31න් අවසන් වන වර්ෂය සඳහා

ඉලක්ක

262,384 මෙ.ටො.
ඇඹරීමට අපේක්ෂිත උක්දඬු ප්‍රමාණය

20,993 මෙ.ටො.
සීනි නිෂ්පාදනය

13,119 මෙ.ටො.
මොලැසස් නිෂ්පාදනය

8 %
සීනි ප්‍රතිසාදනය



ගල්ඔය නිම්නයේ පිහිටි හිඟුරාන සීනි කම්හල මුලින්ම ඉදිකර විවෘත කරන ලද්දේ 1960 දශකයේය. චෙකොස්ලොවැකියානු රජය විසින් පරිත්‍යාග කරන ලද මෙම කර්මාන්තශාලාව "ආසියාවේ යෝධයා" ලෙස ආදරයෙන් හඳුන්වනු ලැබූ අතර එකල කලාපයේ නවීන යන්ත්‍ර සූත්‍ර භාවිතයෙන් ඉදිකරන ලද විශාලතම සීනි කර්මාන්තශාලා වලින් එකකි. කර්මාන්තශාලා යන්ත්‍රෝපකරණ සපයන ලද්දේ එක්සත් රාජධානියේ "මර්ලීස් වොට්සන්" (Mirrlees Watson) නම් සමාගම විසිනි. බලාගාරයේ ශ්‍රේණිගත ධාරිතාව දිනකට ටොන් 2,000 (ටී.සී.ඩී) වේ. කර්මාන්තශාලාව රික්තක තැටි සීනි සැකසුම් පද්ධතියක් සහිත රෝලර් තුනේ මෝල් ටැන්ඩම් පහකින් සමන්විත වේ. මෙම යන්ත්‍රය ස්වයංක්‍රීය දුඹුරු සීනි නිපදවන අතර බැහැර කිරීමේ ක්‍රියාවලිය අනුගමනය කරයි.

1960 වසරේ සිට රජයට අයත්ව තිබූ කර්මාන්ත ශාලා සංකීර්ණය වෘත්තීය සමිති නොසන්සුන්තාව සහ වැරදි කළමනාකරණය හේතුවෙන් 1997 දී වසා දමන ලදී. ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම 2009 දී කර්මාන්ත ශාලාව පුනර්ජීවනය කිරීම ආරම්භ කරන ලද අතර පළමු වරට උක් ඇඹරීම 2012 දී සිදු කරන ලදී.

කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් පහත දැක්වේ

- උක්වල ගුණාත්මකභාවය පරීක්ෂා කිරීම
- උක් සකස් කිරීම සහ ඇඹරීම
- වාණිජ සීනි නිෂ්පාදනය
- සීනිවල තත්ත්ව පරාමිතීන් පරීක්ෂා කිරීම
- වාෂ්ප හා බලශක්ති උත්පාදනය
- ජලය පිරිපහදු කිරීම
- විදුලි හා උපකරණ සැකසුම් වැඩ
- **පිරිසැකසුම්,** අලුත්වැඩියා සහ වාත්තු වැඩ
- සිවිල් ඉදිකිරීම් සහ අලුත්වැඩියා කටයුතු







තත්ත්ව පාලන ඒකකය:

අපද්‍රව්‍ය වලින් තොර මනා ලෙස මේරූ හා එහි සීනි ප්‍රතිශතය ඉහළ අගයක් ගන්නා උක් දඬු කර්මාන්තශාලාව වෙත ලබා දීම සඳහා උක් දඬු වල ගුණාත්මකභාවය පරීක්ෂා කිරීම සිදු කරයි.

ඇඹරුම් අංශය:

කැපීම් යන්ත්‍ර (කටර්) 02 ක් මගින් උක්ගස් කුඩා කැබලි වලට කපා රෝල 3 බැගින් ඇති ඇඹරුම් යන්ත්‍ර පහ තුලට ක්‍රමානුකූලව ඇඹරීම සඳහා උක්ගස් කොටස් ඇතුළු කිරීම මගින් යුෂ මිරිකා ගැනීම සිදු කෙරේ.

නිෂ්පාදන අංශය:

අඹරාගන්නා උක්යුෂ පිරිපහදු කිරීම, වාෂ්පීකරණය කිරීම හා සීනි කැට බවට පත් කිරීම සිදු කෙරෙන අතර අවසාන පියවර වශයෙන් සාදා ගන්නා ලද ප්‍රමිතියෙන් ඉහළ සීනි කිලෝ ග්‍රෑම් 50 බැගින් සීනි මළු ලෙස ඇසුරුම් කරයි.

රසායනාගාරය:

සීනි නිෂ්පාදන ක්‍රියාවලියේ සෑම අදියරකදී අවශ්‍ය ගුණාත්මකභාවය හා තත්ත්ව පාලන කටයුතු සිදුකරනු ලබයි.

බොයිලේරු අංශය:

පැයට ටොන් 35 බැගින් වාෂ්ප නිෂ්පාදන ධාරිතාවයක් ඇති බොයිලේරු යන්ත්‍ර 2 ක් මගින් මෙගාවොට් 2 ක විදුලි ධාරිතාවයක් උත්පාදනය කිරීමට අවශ්‍ය ඇඹරීම් යන්ත්‍ර 05 ක් සඳහා අවශ්‍ය ජල වාෂ්ප නිපදවයි.

කර්මාන්තශාලා වැඩපල:

කර්මාන්තශාලාවේ මෙහෙයුම් කටයුතු සඳහා අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර සැලසුම් කිරීම්, නිර්මාණය කිරීම හා වාත්තු කිරීමේ කටයුතු ආදී කාර්යයන් සිදු කරයි.

විදුලි අංශය:

උක්රොඩු දහනයෙන් ලබා ගන්නා බලශක්තිය භාවිතයෙන් ජල වාෂ්ප විදුලි ජනක යන්ත්‍ර ක්‍රියාත්මක කර එමගින් නිපදවනු ලබන විදුලිය කර්මාන්තශාලාවේ සියළු විදුලි අවශ්‍යතාවන් සැපිරීම හා නඩත්තුව.

සිවිල් අංශය:

සියලුම ඉදිකිරීම් , නඩත්තු කටයුතු වලට අදාල වඩු වැඩ සහ පෙදරේරු වැඩ ආදී කටයුතු සිදු කෙරේ.

ජල පවිත්‍රාගාරය:

2012 ජනවාරි මස සිට සියලුම සමාගම් පරිශ්‍රයන් සඳහා පිරිසිදු ජලය ලබා දෙමින් ජල පවිත්‍රාගාරය සහ පොම්පාගාර කටයුතු අවසන් කර එහි ක්‍රියාකාරිත්වය ආරම්භ කර ඇත. බලාගාරයේ ධාරිතාව පැයකට ලීටර 250,000 කි.



ජයග්‍රහණ

බොයිලේරු යන්ත්‍ර 2ක් මගින් උක් රොඩු දහනය සිදුකර කර්මාන්තශාලාවට අවශ්‍ය බලශක්තිය ලබා ගැනීමේ දී එහි විමිනි වලින් පිටවන දහනීය අළු අවට ප්‍රදේශයට පැතිර යාම නිසා ඉතා විශාල ගැටළුවක් ඇති වී තිබුණි. මෙම දහනීය අළු පරිසරයට එක් නොකොට ක්‍රමවත්ව ඉවත් කිරීම සඳහා නව පද්ධතියක් 2018/19 මුදල් වර්ෂය තුළ ස්ථාපනය කරන ලදී. එය ඉතාමත් සාර්ථක ලෙස ක්‍රියාත්මක වේ.



කර්මාන්තශාලාවේ ප්‍රබලතාව

උසස් තත්ත්වයෙන් යුතු දුඹුරු සීනි නිෂ්පාදනය - උක් ඇඹරුම් ධාරිතාවය දිනකට මෙට්‍රික් ටොන් 2,000කි.

සීනි නිෂ්පාදනය - දිනකට මෙට්‍රික්ටොන් 160

බොයිලේරු ධාරිතාවය - පැයට මෙට්‍රික්ටොන් 35

බැගින් යන්ත්‍ර 02

විදුලි ජනන ඒකක ප්‍රමාණය - මෙට්‍රික්ටොන් 2

කර්මාන්තශාලා ක්‍රියාකාරකම්

සීනි කර්මාන්තයේ දී උක් ප්‍රවාහනයේ සිට සීනි නිෂ්පාදනය ක්‍රියාවලිය දක්වා සිදු කරනු ලබන පියවරයන් කිහිපයකි. මෙම නිෂ්පාදන ක්‍රියාවලිය පහත සඳහන් පියවරයන් වලින් සමන්විත වේ

- ඇඹරීම
- පිරිපහදු කිරීම
- වාෂ්පීකරණය
- ස්ඵටිකීකරණය
- වෙන්කිරීම
- වියළීම
- ඇසුරුම් කිරීම



ස්කාගාරය

ගල්ඔය

2019 මාර්තු 31 න් අවසන් වූ වසර සඳහා

ප්‍රතිඵල

4,284,325 ලීටර්

ඊ එන් ඒ නිෂ්පාදනය

15,388 මෙ.ටො.

මොලැසස් භාවිතය

205

වැඩ කරන දින ගණන



2019 මාර්තු 31 න් අවසන් වන වසර සඳහා

ප්‍රතිඵල

5,000,000 ලීටර්

ENA නිෂ්පාදනය

250

වැඩ කරන දින ගණන

18,184 මෙ.ටො.

මොලැසස් භාවිතය

ස්කාගාර සංකීර්ණ පද්ධතිය ශූන්‍ය ද්‍රව විසර්ජන පද්ධතියක් වේ (ZDL). 'කසළවලින් ධනය' යන සංකල්පය මත පදනම් වූ නවීනතම යන්ත්‍රෝපකරණ සහිත ශ්‍රී ලංකාවේ ඇති එකම ස්කාගාරය මෙය වන අතර පාරිසරික බලපත්‍රයක් සහ ඇගයීමක් ඇති එකම ස්කාගාරය ගල්ඔය වැවිලි සමාගමට හිමිවීම අපට ආඩම්බරයකි. මෙම සංකීර්ණය ENA, CO_2, ජීව වායු, ජෛව කොම්පෝස්ට්, දියර පොහොර සහ අප ජලය මගින් පිරිසිදු ජලය නිෂ්පාදනය කිරීමේ නවීන තාක්ෂණයෙන් නිර්මාණය කර ඇත.

ENA හි ගුණාත්මකභාවය ආනයනික ENA වල ගුණාත්මකභාවයට සමාන වේ. මත්පැන් නිෂ්පාදකයින් සියලුදෙනාම පාහේ උසස් තත්ත්වයේ මත්පැන් නිෂ්පාදනය සඳහා අපගේ ඊ එන් ඒ වලට කැමැත්තක් දක්වයි.

ENA නිෂ්පාදනය දිනකට මධ්‍යසාර ලීටර් 21,500 කි. දිනකට ජීව වායුව නිෂ්පාදනය ඝන මීටර් 10,000 කි. වසරකට මෙට්‍රික්ටොන් 5,000 ජෛව පොහොර නිෂ්පාදනයක් සිදු කරයි. අප ජලය පිරිපහදු පවිත්‍රාගාරයේ ධාරිතාව දිනකට කිලෝ ලීටර් 400 කි.

ක්‍රියාවලි විස්තරය

උසස් තත්ත්වයේ ENA නිෂ්පාදනය සඳහා පැසවීම සහ ආසවනය වැනි ප්‍රධාන ක්‍රියාවලි දෙකක් ඇතුළත් වේ.

පැසවීම

පැසවීම යනු මොලැසස් පිරිදොවනය ඇල්කොහොල් සහ CO_2 බවට පරිවර්තනය වන ජීව විද්‍යාත්මක ක්‍රියාවලියයි. ගෘහස්ථ යීස්ට් මුහුන් (සැකරෝමයිසිස් සර්විසිඒ - Saccharomyces cerevisiae) උපකාරයෙන් පැසවීමේ ක්‍රියාවලිය සිදු කරනු ලබයි. පැසවීමේ ක්‍රියාවලිය සඳහා පැසවුම් 4 ක් සහ මුහුන් බඳුන් 3 ක් සම්බන්ධ වේ.

ආසවනය

සාම්ප්‍රදායික ක්‍රමවලට වඩා කැපී පෙනෙන ලක්ෂණ ඇති නවීනතම පරිසර හිතකාමී එම්.පී.ආර්. ආසවනය (බහු-පීඩන ආසවනය) භාවිතා කර අවම බලශක්ති අවශ්‍යතාවයක් සහිතව ENA හි උසස් තත්ත්වය ලබා ගැනීම සඳහා ආසවන කුලුණු හතක් යොදා ගැනේ.



ඡායාරූපය: රසායනාගාරයේ දී තත්ත්ව සහතික කිරීම







Distillery Plant Complex

පෙජව කොම්පෝස්ට් සැකසුම් ඒකකය

ගල්ඔය



පෙජව කොම්පෝස්ට් සැකසුම් ඒකකය

වසරකට ටොන් 5,000 ක නිෂ්පාදන ධාරිතාවක් ඇති ශ්‍රී ලංකාවේ විශාලතම පෙජව කොම්පෝස්ට් සැකසුම් ඒකකය ස්කාගාර සංකීර්ණයේ ඇත. සමස්ත පෙජව කොම්පෝස්ට් ක්‍රියාවලියම නිර්මාණය කර ඇත්තේ සීනි කර්මාන්තශාලාවෙන් සහ ස්කාගාරයෙන් පිටවන අපද්‍රව්‍ය හැසිරවීමට සහ පෝෂකවලින් ඉහළ පෙජව පොහොර උත්පාදනය කිරීමට හැකි ආකාරයට ය. පෙජව කොම්පෝස්ට් අපේ රටේ අවශ්‍යතාවය සඳහා ආනයනය කරන අකාබනික පොහොර විස්ථාපනය කල හැකි විකල්පයක් විය හැකිය.

ක්‍රියාවලි විස්තරය

පෙජව කොම්පෝස්ට්කිකරණය හෙවත් ලිග්නො-සෙලියුලෝසික් ද්‍රව්‍ය සරල සංයෝගයක් බවට වියෝජනය කිරීම මගින් "බයෝ කොම්පෝස්ට්" ලෙස හැඳින්වෙන හියුමස් වැනි අන්ත ඵලයක් ලබාදීම ජීව විද්‍යාත්මක ක්‍රියාවලියකි. එය කාබනික පොහොරවලින් පොහොසත් ප්‍රභවය කි. එය පාංශු සාරවත් බව සහ බෝග වර්ධනය සැලකිය යුතු ලෙස වැඩිදියුණු කිරීමට ද උපකාරී වේ.

මෙම ක්‍රියාවලිය ස්වායු ක්‍රියාවලියක් වන අතර, සෙලියුලෝස් සහ ලිග්නින් වැනි සංකීර්ණ කාබනික සංයෝග සරල ද්‍රව්‍ය බවට බිඳ දැමීම සඳහා බැක්ටීරියා, ඇක්ටිනොමයිසීටෙස් සහ දිලීර වැනි කාබනික සංයෝග සමග පවතින විවිධ තාපකාමී (තර්මොෆිලික්) ක්ෂුද්‍ර ජීවීන් සම්බන්ධ වේ.



කොම්පෝස්ට් සෑදීමේදී ක්ෂුද්‍ර ජීවීන් කාබනික ද්‍රව්‍ය මත යැපෙන අතරතුර ඔක්සිජන් පරිභෝජනය සිදු කරයි. තවද ගුණනය වේ. කොම්පෝස්ට් නිෂ්පාදන ක්‍රියාවලිය සැලකිය යුතු තාප ප්‍රමාණයක් ජනනය කරයි. කාබන්ඩයොක්සයිඩ් සහ ජල වාෂ්ප ඉවත්වීම මගින් කාබනික කොම්පෝස්ට් නිෂ්පාදනය කිරීමේදී ආරම්භක වියළි කාබනික ද්‍රව්‍යවල බර අඩු කරයි.

කොම්පෝස්ට් නිෂ්පාදන ක්‍රියාවලිය පහත අදියරවලට බෙදා ඇත:

1. වැටි සෑදීම.
2. මුහුන් යෙදීම.
3. වාතනය.
4. ගෝඩා ඉසීම සහ පදම් කිරීම.
5. හැලීම සහ ඇසිරීම.
6. අලෙවිය.

පෛව කොම්පෝස්ට් වල සුවිශේෂී ප්‍රතිලාභ

- **පසෙහි භෞතික, රසායනික හා ජීව විද්‍යාත්මක ගුණ වැඩි දියුණු කරයි.**
- **පසෙහි පාංශු ව්‍යුහය, වාතය සංසරණය සහ පසෙහි ජලය රඳවා ගැනීමේ හැකියාව වැඩි දියුණු කරයි.**
- පෝෂ්‍ය පදාර්ථ රඳවා තබා ගන්නා අතර ඒවා ශාක මුල්වලින් ඉවතට කාන්දු වීම වළක්වයි.
- ශාක වර්ධනයට අත්‍යවශ්‍ය ක්ෂුද්‍ර පෝෂක (කැල්සියම්, සල්ෆර්, මැග්නීසියම්, යකඩ, ආදිය) සහ සාර්ව පෝෂක (නයිට්‍රජන්, පොස්පරස් සහ පොටෑෂ්) යන දෙකම අඩංගු වේ.
- ක්ෂුද්‍ර ජීවීන් පසෙහි ඇති භෝග අපද්‍රව්‍ය බිඳවැටීම වේගවත් කරයි. මෙය පසෙහි වයනය වැඩි දියුණු කරන අතර පසේ රැඳෙන මූලද්‍රව්‍ය ද මුදා හැරේ.
- ක්ෂේත්‍ර භෝග, එළවලු, ගස් සහ පළතුරු භෝග වල අස්වැන්න සහ ගුණාත්මකභාවය වැඩි කිරීම.
- මූලික පොහොර සහ මතුපිට පොහොර යන දෙආකාරයෙන්ම පහසුවෙන් යෙදිය හැකිය.
- ක්ෂාරීය සහ ලවනමය/සෝඩික් පස වැඩි දියුණු කරයි.
- පාංශු ව්‍යුහය වැඩිදියුණු කිරීම මගින් මුල්වල වර්ධනයට උපකාරී වේ.
- සියලුම වර්ගවල ක්ෂේත්‍ර භෝග, එළවළු භෝග, පළතුරු උද්‍යාන, මුළුතැන්ගෙය ආශ්‍රිත වගාවන් සහ මල් වගාවන් සඳහා ප්‍රයෝජනවත් වේ.

කාර්ය මණ්ඩලය

ගල්ඔය



මානව සම්පත් සමාලෝචනය

ගෝලීයකරණය වූ ලෝකයේ අත්‍යවශ්‍ය ප්‍රාග්ධනය මිනිසා ය. එය අභියෝග මෙන්ම නව සහයෝගීතාවය සහ නැවුම් බුද්ධිය සඳහා අවස්ථාවන් ගෙන එයි. මානව සම්පත් දෙපාර්තමේන්තුව ඉදිරියට ගමන් කිරීමේදී යහපත් ව්‍යාපාර ප්‍රතිඵල කෙරෙහි අවධානය යොමු කරමින් එය සිදු කරනු ඇත. සේවක සේවා වැඩිදියුණු කිරීමට, කණ්ඩායම් ප්‍රවේශයක් භාවිතා කිරීමට, දෙපාර්තමේන්තු සමඟ ව්‍යාපාරික හවුල්කාර සබඳතා ගොඩනඟා ගැනීමට සහ පවතින සීමිත මානව සම්පත් තවදුරටත් ප්‍රයෝජනයට ගැනීමට ඇති අවස්ථාව පිළිබඳව මානව සම්පත් අංශය උනන්දු වේ.

මානව සම්පත් හා පරිපාලන දෙපාර්තමේන්තුවේ කාර්යයන්

ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගමේ කොඳු නාරටිය වනුයේ මානව සම්පත් දෙපාර්තමේන්තුවයි. එය ආයතනයේ කෘත්‍යාත්මක කේන්ද්‍රස්ථානය වේ. එය ආයතනයේ සියලුම කටයුතුවලදී ඉතා ලැදියාවෙන් යුතුව පෙරමුණ ගනී. පිටුපසින් සිට දිරිගන්වයි.

මානව සම්පත් දෙපාර්තමේන්තුව හැකි සෑම විටදීම අදාල පාදක දත්ත සමඟ සංසන්දනය කරමින් කාර්යය සාධන මිණුම් හා ශ්‍රම බලකායේ ජනගහණ ලක්ෂණ හා විවිධ වූ මානව සම්පත් ක්ෂේත්‍රවල නැඹුරුතා පිළිබඳ තොරතුරු සම්පිණ්ඩනය කරයි.

මානව සම්පත් දෙපාර්තමේන්තුව වශයෙන් ව්‍යාපාරික අවශ්‍යතා සැපිරෙන පරිදි සමාගමේ වටිනාම සම්පත කළමනාකරණය කරමින් ද පහත සඳහන් කාර්යයන් විවිධ ආකාරයෙන් හසුරුවමින් ද අපගේ සේවය සපයන්නෙමු.

- මානව සම්පත් සැලසුම්කරණය
- බඳවා ගැනීම් සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම
- සේවක සබඳතා
- වේතන කළමනාකරණය
- උපස්ථීම් හා ත්‍යාග
- සේවක පුහුණුව හා ප්‍රවර්ධනය
- සේවක සුභසාධනය
- සෞඛ්‍ය හා ආරක්ෂාව
- අනුකූලතාව
- පොදු පරිපාලනය
- නීති පැණවීම
- ප්‍රසම්පාදනය
- තොරතුරු තාක්ෂනය

අපගේ සේවා නියුක්තිය

පහත දැක්වෙන කාණ්ඩ අනුව 2018/19 මූල්‍ය වර්ෂය අවසානයේදී අප සමාගමේ සේවකයින් 936 ක් සේවයේ යෙදී සිටියහ. මීට අමතරව උක්දඬු අඹරන කාලය සඳහා කොන්ත්‍රාත් සේවකයින් 77 ක් සේවය කරන ලදී.

	ස්ථිර	කොන්ත්‍රාත්
විධායක කාර්ය මණ්ඩලය	51	18
විධායක නොවන කාර්ය මණ්ඩලය	259	608

විධායක කාණ්ඩයේ සාමාන්‍යාධිකාරී සිට කනිෂ්ඨ විධායක කළමනාකරණ ශ්‍රේණි දක්වා ඇති අතර ස්ථිර සහ කොන්ත්‍රාත් කාණ්ඩයේ SP1 සිට S5 දක්වා කාර්ය මණ්ඩල ශ්‍රේණි ඇත. තවද නිපුණ, අර්ධ නිපුණතා සහ නුපුහුණු ශ්‍රම කාණ්ඩය SP1 සිට P5 දක්වා ශ්‍රේණි වලින් සමන්විත වන අතර ඔවුන් ස්ථිර කොන්ත්‍රාත් සහ සෘතුමය කොන්ත්‍රාත් පදනම නියෝජනය කරයි.



සේවක සුභසාධනය

සමාගමේ සහයෝගය ඇතිව ආරම්භයේ සිට අඛණ්ඩව පවත්වාගෙන ආ පරිදි ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගමේ සුභ සාධක සංගමය පහත දක්වා ඇති අයුරින් සේවකයන් වෙත වඩාත් වටිනා ප්‍රතිලාභ රැසක් ලබා දේ.

- මරණාධාර
- ණය පහසුකම්
- දරුවන් සඳහා ශිෂ්‍යත්ව
- විවාහ දීමනා
- සුභසාධන අලෙවිසැළ මඟින් සිල්ලර බඩු
- ආපනශාලා පහසුකම්
- ක්‍රීඩා - උදා: අන්තර් දෙපාර්තමේන්තු ක්‍රිකට් තරඟාවලිය
- විනෝද අවස්ථා

  උදා: වාර්ෂික සුභද හමුව
  අළුත් අවුරුදු උත්සවය
  වාර්ෂික විනෝද චාරිකාව

සේවක පුහුණුව සහ ප්‍රවර්ධනය

සේවක පුහුණුව හා ප්‍රවර්ධනය යනු සේවක මඩුල්ලේ බහුවිධ ඉගැනුම් ආවරණය කරන පුළුල් මගකි. පුහුණුවක් යනු සේවකයන් නිරතව සිටින භූමිකාවන්හි කාර්යය සාධනය ඉහළ නැංවීම සඳහා ඉවහල්වන සුවිශේෂී වූ දැනුම හෝ නිපුණතා ඉගෙනීමට උපකාරීවන වැඩ සටහනකි. ප්‍රවර්ධනය ඊටත් වඩා පුළුල් වන අතර ඒ හරහා ආසන්නතම භූමිකාවෙන් ඔබ්බට ගමන් කරමින් සේවක වර්ධනය හා අනාගත කාර්යය සාධනය වෙත යොමු වේ.

අපි පොදුජන සමාගමක් වන බැවින් පසුගිය වසර තුළ අපගේ සේවක මඩුල්ලේ කාර්යය සාධනය ඉහළ මට්ටමක පවත්වා ගැනීම පිණිස බොහෝ පුහුණු හා ප්‍රවර්ධන වැඩසටහන් දියත් කරන ලදී. ඒ අතරින් වැඩසටහන් කිහිපයක් පහතින් දැක්වේ.



සේවක පුහුණුව සහ ප්‍රවර්ධනය

මානව සම්පත් තොරතුරු පද්ධතිය (එච්.ආර්. අයි.එස්.) භාවිතා කරන නිලධාරීන් සඳහා ගෘහස්ථ පුහුණු වැඩසටහනක් අප විසින් සංවිධානය කරන ලදී.

2018 ජූලි 7 වැනි දින සියලුම විධායක කාර්ය මණ්ඩලය සඳහා අම්පාර මොන්ටි හෝටලයේදී ඵලදායිතාව වැඩිදියුණු කිරීම සහ අභිප්‍රේරණය පිළිබඳ පුහුණු වැඩසටහනක් අප විසින් පවත්වන ලදී.



'ලෙස් ඉස් මෝ' සමූහ ව්‍යාපාරය විසින් සංවිධානය කරන ලද චිකිත්සක ජීවන රටාව වෙනස් කිරීම පිළිබඳ පුහුණු වැඩසටහනක් ජුනි මස 21 වන දින සිනමන් ලේක්සයිඩ් හෝටලයේදී පැවැත්වුණු අතර එයට විධායක නිලධාරීන් තිදෙනෙකු සහභාගී විය.

නැල්කෝ විසින් ස්කාගාර නිලධාරීන් සඳහා ජල පිරිපහදු කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන 2018 ජූලි 11 වන දින සමාගම් අධ්‍යක්ෂ මණ්ඩල කාමරයේදී පැවැත්වුනි.



2019 ජනවාරි 29 වන දින රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව සහ සී එස් බී එම් විසින් සංවිධානය කරන ලද, කොළඹ ව්‍යාපාර කළමනාකරණ පාසලේ ප්‍රධාන ශ්‍රවණාගාරයේ පැවති මානව සම්පත් සංසදයේ විශේෂ අවස්ථා පිළිබඳ පුහුණු වැඩසටහන සඳහා සහභාගී විය.

2019 මාර්තු 26 වැනි දින වරලත් පුද්ගල කළමනාකරණ ආයතනයේ (සී.අයි.පී.එම්.) මහනුවර මධ්‍යස්ථානයේ ප්‍රධාන ශ්‍රවණාගාරයේදී සේවක විෂමාචාර පිළිබඳ මානව සම්පත් කළමණාකරුගේ භූමිකාව පිළිබඳ පුහුණු වැඩසටහනකට සහභාගී වූ අතර එය පිරිස් කළමනාකරණ වරලත් ආයතනය විසින් සංවිධානය කරන ලදී.



- නිහුරාන මහා විද්‍යාලයේ වාර්ෂික නිවාසන්තර තරගාවලිය සඳහා කුසලානයක් පරිත්‍යාග කරන ලදී.
- දිළිඳු පවුලකට නව නිවසක් තනා දීම සඳහා ගල්මඩුව එකමුතු මරණාධාර සංගමයට පරිත්‍යාගයක් කරන ලදී.
- සඳහා මඩවලලන්ද ශ්‍රී බෝධි රුක්ඛාරාමය විහාරස්ථානයේ කයීන වීවර පූජාව වෙනුවෙන් තින්ත ආලේප කිරීම.
- ධර්මදේශනා වැඩසටහනක් සඳහා දමන සම්බෝධි විහාරය වෙත සීනි පරිත්‍යාග කරන ලදී.
- ළමා දින සැමරුම සඳහා දායකත්වයක් ලෙස නිහුරාන සෞඛ්‍ය මධ්‍යස්ථානය වෙත පරිත්‍යාගයක් කරන ලදී.
- වැඩිහිටි දින සැමරුම සඳහා දමන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත පරිත්‍යාගයක් කරන ලදී.
- නීතිඥ සංගමය විසින් පවත්වනු ලබන සිසු සරණ ශිෂ්‍යත්ව වැඩසටහන වෙත පරිත්‍යාගයක් කරන ලදී.
- දමන සත්සරණි කලා සංසදය විසින් සංවිධානය කරන ලද සංගීත ප්‍රසංගයට පරිත්‍යාගයක් කරන ලදී.
- දමන මිනිමුතු යෞවන සමාජය වෙත මැටි පහන් 1000 ක් පරිත්‍යාග කරන ලදී.
- නිහුරාන යෞවන සමාජය විසින් සංවිධානය කරන ලද දන්සල වෙත පරිත්‍යාගක් කරන ලදී.
- මඩවලලන්ද ශ්‍රී බෝධිරුක්ඛාරාම විහාරය විසින් සංවිධානය කරන ලද ලේ දන්දීමේ ව්‍යාපාරය සඳහා කිරි පැකට් පරිත්‍යාග කිරීම.
- නිහුරාන නාගරික වෙළඳ සුභසාධක සංගමය විසින් සංවිධානය කරන ලද අවුරුදු උලෙල සඳහා පරිත්‍යාගයක් කරන ලදී.

අනාගත ව්‍යාපෘති

ගල්ඔය



මෙගාවොට් 10ක බලාගාරයක් සහිත සීනි කර්මාන්ත ශාලාව වැඩිදියුණු කිරීම

මෙම ව්‍යාපෘතිය අදියර 5 කින් සමන්විත වන අතර සීනි, *ENA*, කාබනික පොහොර, CO_2 සහ විදුලිබල උත්පාදනය ලෙස දැක්විය හැක. බලශක්ති උත්පාදන ව්‍යාපෘතිය නවීකරණය කිරීමේ අවසන් අදියරේ අපි සිටිමු.

දැනට අදියර හතරක් සම්පූර්ණ කර ඇති අතර මෙගාවොට් 10ක විදුලි ධාරිතාවයක් උත්පාදනය කර ගැනීමට නියමිත අතර එයින් මෙගාවොට් 2.5–3 ක පමණ ප්‍රමාණයක් අප කර්මාන්තශාලාවේ හා නිවාස සංකීර්ණ අවශ්‍යතාවයන් සඳහා යොදා ගැනීමට අපේක්ෂා කරන අතර අතිරික්ත විදුලි බලය පැය 24 X දින 7ක් ලෙස ජාතික විදුලිබල පද්ධතියට ලබා දීමට සැලසුම් කෙරේ.

මෙම ව්‍යාපෘතියට දැනට කර්මාන්තශාලාවේ පවතින ඇඹරුම් යන්ත්‍ර, බොයිලේරු ටර්බයින හා අනෙකුත් යන්ත්‍ර නවීකරණ කටයුතු කිහිපයක් සිදුකර කර්මාන්තශාලාවේ ඇඹරීම් ධාරිතාව දිනකට උක් මෙට්‍රික්ටොන් 500 ක් බමණ ඇඹරීම සඳහා කටයුතු ආරම්භකර ඇති අතර මෙමගින් කර්මාන්තශාලා ධාරිතාවය 25% කින් හා උකහා ගැනීමේ ප්‍රතිශතය 0.2% කින් ඉහළ නැංවීමට හැකි වනු ඇත. මේ සඳහා රු. බිලියන 5 ක මුදලක් 2022 වර්ෂයේ මැද භාගයේදී ආයෝජනය කිරීමට අපි බලාපොරොත්තු වෙමු.



කර්මාන්තශාලා වැඩිදියුණු කිරීම්

මෙම ව්‍යාපෘතියට දැනට පවතින මෝල්, ක්‍රියාවලිය, බොයිලේරු සහ ටර්බයින වෙනස් කිරීම ඇතුළත් වන අතර එමඟින් උක් ඇඹරීමේ කාර්යක්ෂමතාව *25%* කින් සහ ප්‍රතිසාදනය *0.2%* කින් වැඩි කරයි.

ස්කාගාර තුළ; *ENA* නිෂ්පාදනය සඳහා ප්‍රධාන මෙහෙයුම් දෙකක් සිදු කෙරේ. මධ්‍යසාර පැසවීම ක්‍රියාවලියේදී, යීස්ට් ආහාරයක් ලෙස මොලැසස් පරිභෝජනය කරන අතර ප්‍රධාන නිෂ්පාදනය ලෙස *ENA* නිපදවයි. CO_2 අතුරු නිෂ්පාදනයක් ලෙස පරිණාමය වී ඇත. වර්තමානයේ CO_2 භාවිතයට නොගනී. නව බලාගාරය ස්ථාපනය කිරීමෙන් අතුරු නිෂ්පාදනයක් ලෙස පැසවීම අංශයෙන් උත්පාදනය වන CO_2 වායුව ග්‍රහණය කර ගැනීමට අවස්ථාවක් තිබේ. එම වායුව සිසිල් බීම, වෛද්‍ය සහ වෙනත් කාර්මික අරමුණු සඳහා භාවිතා කළ හැකිය. CO_2 වායු ග්‍රහණය කිරීමේ බලාගාරයට වායුව ග්‍රහණය කර ගැනීම, පිරිසිදු කිරීම, සම්පීඩනය, සිසිල් කිරීම ඇතුළත් වේ. CO_2 ග්‍රහණය කර ගැනීමේ බලාගාරය මඟින් ස්කාගාරයට අමතර ආදායමක් ලබා දෙන අතර දිනකට CO_2 වායුව කිලෝ ග්‍රෑම් 9,000 ක් පමණ අලෙවි කළ හැකි අතර, මෙම ව්‍යාපෘතිය මඟින් සමාගමට තිරසාර පාරිසරික වටිනාකමක් ලබා දෙනු ඇත. ව්‍යාපෘතියේ මූලික කටයුතු ආරම්භ කර ඇති අතර අපේක්ෂිත ආයෝජනය රු. මිලියන 250කි. එය CO_2 ඇසුරුම් කිරීම සඳහා වැය කිරීමට නියමිත අතර ගල්ඔය වැවිලි සමාගමට ඉන් ආදායමක් ලැබේ.

මත්පැන් ඇසුරුම් කම්හල

ගල්ඔය වැවිලි ස්කාගාර කර්මාන්ත ශාලාවට දිනකට ලීටර් *21,*500 ක් සහ වසරකට ලීටර් මිලියන 5ක් වැනි ශ්‍රේණිගත නිෂ්පාදන ධාරිතාවයකින් *ENA* (අතිරේක උදාසීන මධ්‍යසාර) නිෂ්පාදනය සඳහා වලංගු බලපත්‍රයක් ඇත. ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව බහු තීරු ආසවනය (*තීරු 7)* භාවිතා කර උසස් තත්ත්වයේ *ENA* ලබා ගන්නා ආකාරයට අපි කම්හල නිර්මාණය කර ඇත. නවතම විශ්ලේෂණ වාර්තා සනාථ කළේ *ENA* හි අවසාන නිෂ්පාදනයේ ප්‍රබලත්වය 96.5% ට වඩා වැඩි බවත් ගුණාත්මකභාවය සෑම ආකාරයකින්ම ආනයනය කරන *ENA* වලට සමාන බවත් ය.

මෙරට නිෂ්පාදනය කරන විදේශීය මත්පැන් සෑදීම සඳහා අවශ්‍ය ප්‍රමිතීන් අපගේ ENA නිෂ්පාදනය සතු වේ. සංවේදී දෘෂ්ටි කෝණයෙන් එය ලකුණු 8.0 ක පමණ ජාත්‍යන්තර ප්‍රමිති ශ්‍රේණිගත කිරීම සපුරා ඇත.

අප සතුව උසස් තත්ත්වයේ ENA ඇති බැවින්, අපට ශ්‍රී ලංකාව තුළ සාධාරණ මිලකට ඉතා උසස් මධ්‍යසාර නිෂ්පාදනය කළ හැකිය. මෙම ව්‍යාපෘතිය සඳහා ආයෝජනය රු. මිලියන 400 කි.

ඇල්කොහොල් පදනම් කරගත් අත් පිරිසිදුකාරක නිෂ්පාදනය

නූතන ලෝකයේ පැතිර යන විවිධ වූ වසංගත රෝග හේතුවෙන්, සනීපාරක්ෂක විසඳුම් සඳහා ඇති ඉල්ලුම දිනෙන් දින වැඩි වී තිබේ. එවැනි ආසාදන වැලැක්වීම සඳහා අත් පිරිසිදුකාරක ද්‍රව්‍ය ප්‍රධාන පූර්වාරක්ෂාවකි.

ගල්ඔය වැවිලි සමාගමට අම්පාර දිස්ත්‍රික්කයේ හිඟුරාන ප්‍රදේශයේ දිනකට ලීටර් 21,500 ක ධාරිතාවයෙන් යුත් ස්ප්‍රිතු (ENA) අප ස්කාගාරය ඇත. වර්තමාන රටේ අවශ්‍යතාවය සපුරාලීම සඳහා අපට මෙම ENA මඟින් උසස් තත්ත්වයේ අත් පිරිසිදුකාරක නිෂ්පාදනය කළ හැකිය.

දැඩි අධීක්ෂණයකින් සහ වෛද්‍ය විශේෂඥයින්ගේ උපදෙස් මත ගල්ඔය පරිශ්‍රයේදී අපගේ ENA භාවිතයෙන් අත් සනීපාරක්ෂක නිෂ්පාදනය කිරීමේ හැකියාව සහ සැලසුම අප සතුව ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව (2019 මාර්තු 31 දිනට)

ගල්ඔය

වර්ෂ 2019 මාර්තු 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා සීමාසහිත ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගමේ අධ්‍යක්ෂ මඩුල්ලේ වාර්තාව සහ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශය ස්වකීය සාමාජිකයන් වෙත මෙසේ ඉදිරිපත් කරන්නේ සතුටිනි.

මූලික ක්‍රියාකාරකම්

සීමාසහිත ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගමේ මූලික ක්‍රියාකාරකම් වන්නේ, උක් වගා කිරීම, උක් සීනි නිෂ්පාදනය කිරීම, සහ දේශීය වෙළඳපළ සඳහා එතනෝල් (Extra Neutral Alcohol) නිෂ්පාදනය කිරීම යි.

.

එම කාර්යයන් පිළිබඳ විග්‍රහයක් මෙම වාර්තාවේ පිටු අංක 7 සහ 8 හි ඇතුළත්, ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගමේ ප්‍රධාන විධායක නිලධාරීතුමාගේ පණිවුඩයේ සඳහන් වේ.

ව්‍යාපාරය හා අනාගත ප්‍රවර්ධන කටයුතු පිළිබඳ සමාලෝචනය

2019 මාර්තු 31 දින වන විට අප සමාගම උක් හෙක්ටයාර 3,380ක් වගා කර ඇති අතර අම්පාර සහ සියඹලාණ්ඩුව ප්‍රදේශ ආශ්‍රිතව තව දුරටත් උක් වගාව ව්‍යාප්ත කිරීමට අපේක්ෂිත ය.

ලාභ සහ අලාභ

2018/19 වර්ෂය සඳහා බදුවලට පෙර පාඩුව රුපියල් 1,814,145,920/= කි.

බදුකරණය

පෙර වසරේ රු.4,589,788/- ට සාපේක්ෂව 2018/19 වරිපනම් වර්ෂයේ ආදායම් බද්ද සඳහා වගකිව යුතු නොවේ.

දේපළ, පිරියත හා යන්ත්‍රෝපකරණ

මෙම මූල්‍ය ප්‍රකාශයේ සටහන 12 මඟින් දේපළ පිරියත හා යන්ත්‍රෝපකරණවලට අදාළ තොරතුරු ඇතුළත් කර ඇත.

ප්‍රකාශිත ප්‍රාග්ධනය

2019 මාර්තු 31 දිනට සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය රුපියල් 1,011,764,730/- ක් වන අතර ඊට සාමාන්‍ය කොටස් 101,176,473 ක් ද ඇතුළත්ය. (2017/18 **කොටස්** 101,176,473 කි).

සංචිත

2019 මාර්තු 31 දිනට සමස්ත සංචිත ප්‍රමාණයේ වටිනාකම රුපියල් 7,246,742,839/- කි (ඍණ). පසුගිය වසර හා සැසඳූ විට එය රුපියල් 5,429,166,673/- කි (සමුච්චිත පාඩුව).

කොටස් හිමියන්

කොටස් හිමියන්ට අපක්ෂපාති ලෙස සැලකීමත් ඔවුන්ගේ ධනය උපරිමය කිරීමත් සමාගමේ ප්‍රතිපත්තිය කි.

සේවා නියුක්ති ප්‍රතිපත්ති

සමාගමේ සේවා නියුක්ති ප්‍රතිපත්ති මඟින් සියලු පුද්ගලයන් හට එකසේ සළකනු ලබන අතර ස්ත්‍රී/පුරුෂභාවය, ජාතිකත්වය හෝ ආගම් භේද නොතකා සැමට සම අවස්ථා පිරිනමනු ලබන අතර ප්‍රශස්ථ සේවක සබඳතා වර්ධනය වනු ඇති බව සැලකේ.

ව්‍යවස්ථාපිත ගෙවීම්

ස්වකීය දැනුවත්භාවය ප්‍රකාරව හා විශ්වාසය පරිදි මේ වන තෙක් සියලු සේවකයන්ට හා රජයට ගෙවිය යුතු සියලු ව්‍යවස්ථාපිත ගෙවීම් සිදු කර ඇති බවට අධ්‍යක්ෂවරුන් සැහීමට පත් වේ.

පරිසර ආරක්ෂණය

පරිසරයට සිදුවන අහිතකර බලපෑම් අවම මට්ටමක පවත්වා ගනිමින් අදාළ ආයතන සමඟ සහයෝගීත්වයෙන් හා අණුකූලත්වය ආරක්ෂාවන පරිදි කටයුතු කිරීම සමාගමේ ප්‍රතිපත්තිය වේ.

අධ්‍යක්ෂ මඩුල්ල

2019 මාර්තු 31 දින දිනට සමාගමේ අධ්‍යක්ෂ මඩුල්ල පහත පරිදිය.

- ආචාර්ය කේ.බී. කොටගම - සභාපති
- කේ.ඒ.කේ.පී. ගුණවර්ධන - අධ්‍යක්ෂ
- ආර්.එම්.ජී.බී. රත්නායක - අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී
- ඩබ්.කේ.ඩී.ටී. අබේරත්න - අධ්‍යක්ෂ
- බී. එම්. ඩී. බී. බස්නායක - අධ්‍යක්ෂ
- ඩබ්. බටගොඩ - අධ්‍යක්ෂ
- එස්. ගිරිදරන් - අධ්‍යක්ෂ
- ඩී.එම්. එල්. බණ්ඩාරනායක - අධ්‍යක්ෂ
- එන්.එස්.වනසිංහ - අධ්‍යක්ෂ

අධ්‍යක්ෂවරුන් පත් කිරීම් සහ ඉල්ලා අස් වීම්

එන්.එස්.වනසිංහ මහතා 26.02.2019 දින සිට බලපැවැත්වෙන පරිදි අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කල අතර ඩී.එම්. එල්. බණ්ඩාරනායක මහතා 26.02.2019 දින සිට බලපැවැත්වෙන පරිදි අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදී.

ටී. වනිගසිංහ මහතා 13.02.2019 දින සිටත් එම්.එම්. ෆවුස් මහතා 15.02.2019 දින සිටත් බලපැවැත්වෙන පරිදි අධ්‍යක්ෂ මඩුල්ලෙන් ඉල්ලා අස් විය.

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

අධ්‍යක්ෂවරුන් විසින් ක්‍රමවත්ව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පවත්වනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල දී යෝජනා සම්මත කිරීමත්, අධ්‍යක්ෂ මඩුල්ල අතර යෝජනා සංසරණය කිරීමෙන් හා සියලුම අධ්‍යක්ෂවරුන් විසින් අනුමත කර අත්සන් තැබූ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා ඉදිරිපත් කිරීම හරහා අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ගනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට ප්‍රථම, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ වාර්තාව, මීළඟ රැස්වීමේ න්‍යාය පත්‍රය සහ මාසික කළමනාකරණ වාර්තා කල් තබා සියලුම අධ්‍යක්ෂවරුන් අතර සංසරණය කරනු ලැබේ.

මාණ්ඩලීය කමිටුව

මෙහෙයුම් හා පාලන කටයුතුවල විවිධ පැතිකඩයන් පිළිබඳව ප්‍රගති සමාලෝචනය සහ මඟ පෙන්වීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කමිටු පිහිටුවා ඇත.

විගණන කමිටුව

2019 මාර්තු 31 දින දිනට විගණන කමිටු සාමාජිකයන් පහත පරිදිය.

එස්. ගිරිදරන්	- සභාපති
බී. එම්. ඩී. බස්නායක	- සාමාජික
ඩබ්. බටගොඩ	- සාමාජික
එන්.එස්.වනසිංහ	- සාමාජික
ඩබ්.කේ.ඩී.ටී. අබේරත්න	- සාමාජික

2019 මාර්තු 31 දින පහත සඳහන් සාමාජිකයන් විගණන කමිටුවට පත් කරන ලදී.

එන්. වනසිංහ	- සාමාජික
දනේෂ් අබේරත්න	- සාමාජික

සමාගමේ විගණන කමිටුව විසින් බාහිර විගණකවරුන් ආයතනයට ලබා දුන් විගණන නොවන සේවාවන්වල ප්‍රමාණය හා ස්වරූපය පිළිබඳ සමාලෝචනයක් සිදු කරන ලදී. ඒ විගණකවරුන් වශයෙන් ඔවුන්ගේ ස්වාධීනත්වයට හානි වී නොමැති බව තහවුරු කරනු පිණිසය.

පිටු අංක 47 මඟින් විගණන කමිටු වාර්තාව ඉදිරිපත් කර ඇත.

අධ්‍යක්ෂවරුන්ගේ කොටස් හිමිකම්

2019 මාර්තු 31 දින වන විට කිසිදු අධ්‍යක්ෂවරයකු සමාගමේ කොටස් තබා නොතිබුණි.

අධ්‍යක්ෂවරුන්ගේ වැටුප

අධ්‍යක්ෂවරුන්ට කිසිදු චේතනයක් / ණය මුදලක් ගෙවා නැත. 81 වන පිටුවේ ඇති මූල්‍ය ප්‍රකාශයේ සටහන අංක 29 බලන්න.

ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පිටු අංක 61-72 න් දැක්වේ.

වාර්ෂික මහා සභා රැස්වීම

වාර්ෂික මහා සභා රැස්වීම 2020 අගෝස්තු 28 වන දින පස්වරු 6.30 ට කොළඹ 10, ටී.බී. ජයා මාවතේ, අංක 338 දරන තැන පිහිටි එක්සෙල් වර්ල්ඩ් "මාර්කෝපෝලෝ" හිදී පැවැත්වේ. වාර්ෂික මහා සභා රැස්වීම පිළිබඳ නිවේදනය පිටු අංක 85 හි දක්වා ඇත.

විගණකවරුන්

ඒ අනුව සහ 2007 අංක 07 දරණ සමාගම් පනතේ 154 (1) කොටස ප්‍රකාරව, ඊළඟ වර්ෂය වෙනුවෙන් සමාගමේ විගණකවරුන් වශයෙන් විගණකාධිපති දෙපාර්තමේන්තුව පත් කිරීමට වාර්ෂික මහා සභා රැස්වීමේ දී යෝජනා කරනු ඇත.

2007 අංක 7 දරණ සමාගම් පනතේ 155 (a) කොටස අනුව ඊළඟ වසර සඳහා පත්වන විගණකවරුන්හට ගෙවන වේතන නියම කිරීම සඳහා අධ්‍යක්ෂවරුන් හට බලය පවරන යෝජනාවක් ද වාර්ෂික මහා සභා රැස්වීමේ දී යෝජනා කරනු ඇත.

විගණකවරුන් හට ගෙවනු ලබන ගාස්තු මූල්‍ය ප්‍රකාශයේ සටහන අංක 9 මගින් අනාවරණය කරනු ලැබේ. අධ්‍යක්ෂවරුන්ගේ අවබෝධය පරිදි, ඉහතින් දැක්වූ දෑ හැරුණු විට විගණකවරුන් සමඟ සමාගම කිසිදු සබඳතාවක් (විගණකවරයෙක් ලෙස හැරුණු විට) නොදක්වයි. විගණකවරුන් ද සමාගම කෙරෙහි කිසිදු බැඳියාවක් නැත.

අධ්‍යක්ෂ මණ්ඩල නියමය පරිදි

අධ්‍යක්ෂ

එල්.ඕ.එල්.සී. ආයතනික සේවා (පුද්ගලික) සමාගම
ලේකම්වරු

24.07.2020 - කොළඹ

අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් පිළිබඳ ප්‍රකාශය

ගල්ඔය

2007 අංක 07 දරන සමාගම් පනතට සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ සම්මතයන්ට අනුව සකස්කර ඉදිරිපත් කරන ලද 2019 මාර්තු 31 න් අවසන් වන වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ වලට අදාළව අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් පහත ප්‍රකාශනයේ දක්වා ඇත.

මූල්‍ය ප්‍රකාශ වලට අදාළව විගණකවරුන්ගේ වගකීම් මෙම වාර්තාවේ 41 වන පිටුවේ ඇතුළත් කර ඇති විගණන වාර්තාවේ සඳහන් වේ. 2007 අංක 07 දරන සමාගම් පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව අධ්‍යක්ෂවරුන් විසින් සෑම මූල්‍ය වර්ෂයක් වෙනුවෙන්ම මූල්‍ය ප්‍රකාශ සකස්කර වාර්ෂික මහා සභා රැස්වීම වෙත ඉදිරිපත් කළ යුතු අතර ඊට ඇතුලත් වන්නේ;

1 මූල්‍ය වර්ෂය සඳහා සමාගමේ හා අනු සමාගම්වල ලාභ අලාභ පිළිබඳ සත්‍ය හා සාධාරණ මත පිළිඹිබු වන විස්තීර්ණ ආදායම් ප්‍රකාශයක්;

2 මූල්‍ය වර්ෂය සඳහා සමාගම හා අනු සමාගම් රඳවාගත් ඉපැයුම් පිළිබඳ සත්‍ය හා සාධාරණ මත පිළිඹිබු වන සම කොටස්වල වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශයක්;

3 මුදල් වර්ෂය සඳහා ව්‍යාපාරය තුළට හා ඉන් පිටතට දිශාමුඛ වූ මූල්‍ය ප්‍රවාහය පිළිබඳ සත්‍ය හා සාධාරණ මත පිළිඹිබු වන මුදල් ප්‍රවාහ ප්‍රකාශයක් සහ;

4 මූල්‍ය වර්ෂයේ අවසානය වන විට සමාගම හා අනු සමාගම් පවත්නා තත්ත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ මත පිළිබිඹු වන මූල්‍ය තත්ත්ව ප්‍රකාශයක්.

තවද, ඒවා පණතට අනුකූල වේ.

ඉහත සඳහන් මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම පිළිබඳව අධ්‍යක්ෂවරුන් දරන මත පහත පරිදිය:

1. උචිත මූලධර්ම අවිරෝධී ලෙස තෝරාගෙන භාවිත කර තිබේ. මූර්ත අපගමනයන් පවතී නම් ඒවා අනාවරණය කර හා පැහැදිලි කර තිබේ.

2. සියලුම යෝග්‍ය ගිණුම්කරණ සම්මතයන් අදාළ පරිදි අනුගමනය කර තිබේ.

3. තීන්දු සහ ඇස්තමේන්තු සාධාරණ හා විවක්ෂණශීලී ය.

ස්වකීය මෙහෙයුම් දියත් කිරීම සඳහා ප්‍රමාණවත් තරම් සම්පත් පවතින බව අධ්‍යක්ෂවරුන්ගේ මතය වන අතර මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේ දී අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම භාවිත කර තිබේ.

තවද, සමාගමේ මූල්‍ය තත්ත්වය වැඩි නිරවද්‍යතාවයකින් යුතුව අනාවරණය කිරීම සඳහාත්, සමාගම් පනත ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම සහතික කිරීම සඳහාත්, ප්‍රමාණවත් පරිදි ගිණුම් වාර්තා නඩත්තු කරන බව සහතික කිරීමේ වගකීම අධ්‍යක්ෂවරුන් සතු වේ.

සමාගමේ වත්කම් සුරක්ෂිත කිරීම සඳහා නිසි පියවර ගැනීම අධ්‍යක්ෂවරුන්ගේ වගකීම වේ. ඒ වෙනුවෙන් වංචා හා අනෙකුත් අක්‍රමිකතා හඳුනා ගැනීමේ හා වැළැක්වීමේ අරමුණ ඇතිව යෝග්‍ය අභ්‍යන්තර පාලන පද්ධති ස්ථාපනය කිරීම සඳහා නිසි අවධානය යොමු කළ යුතු වේ.

අධ්‍යක්ෂවරුන් විසින් මූල්‍ය ප්‍රකාශ සකස් කළ යුතු අතරම විගණකවරුන්ට අවශ්‍ය ඕනෑම පියවරක් ගැනීම සඳහාත්, විගණන මතය ඉදිරිපත් කිරීමට පහසුවන පරිදි ඕනෑම පරීක්ෂණයක් දියත් කිරීම සඳහාත් අවශ්‍ය සියලු ඉඩ ප්‍රස්ථා සැලසිය යුතු වේ.

මෙම ප්‍රකාශයේ දක්වා ඇති පරිදි ඔවුන් තම වගකීම් ඉටු කර ඇති බව අධ්‍යක්ෂවරුන්ගේ අදහසයි.

අනුකූලතා වාර්තාව

සමාගම සහ එහි පරිපාලිත සමාගම් විසින් ගෙවිය යුතු සියළුම බදු, තීරුබදු සහ අයබදු, සමාගමේ සේවකයින් සහ එහි අනුබද්ධ සමාගම් වෙනුවෙන් ගෙවිය යුතු සහ සමාගමේ සේවකයන් වෙනුවෙන් හා සම්බන්ධයෙන් ගෙවිය යුතු සියලුම දායක මුදල්, සහ සමාගම සහ එහි පරිපාලිත සමාගම් විසින් ගෙවිය යුතු බව දන්නා සියලුම ව්‍යවස්ථාපිත හිඟ මුදල් ශේෂ පත්‍රයේ දිනය වන විට ඔවුන් උපරිම වශයෙන් දන්නා පරිදි ගෙවා අවසන් කර හෝ ලබා දී ඇති බව අධ්‍යක්ෂවරුන් විසින් සනාථ කරනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි

සභාපති
දිනය 2020.07.24

විගණන කමිටු වාර්තාව

ගල්ඔය

කමිටුවේ කාර්යයභාරය

අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ස්වකීය සොයාගැනීම් වාර්තා කරන විගණන කමිටුවේ කාර්යයභාරය වන්නේ, සමාගමේ මූල්‍ය වාර්තාකරණයේ අවංකභාවය, සමාගමේ බාහිර හා අභ්‍යන්තර විගණන ක්‍රියාවලිය සහ සමාගම සඳහා ප්‍රබල අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් පවත්වාගෙන යාම මෙන්ම, සමාගම පිළිබඳව අවදානම කළමනාකරණය කිරීම හා නීතිය හා නියාමන අවශ්‍යතාවලට සමාගම අනුකූල වන්නේ ද යන්න පිළිබඳව විමර්ශනය කිරීමයි.

සංයුතිය

2019 මාර්තු 31 දිනට අධ්‍යක්ෂ මණ්ඩලය මගින් පත්කළ ඊට වගවන විගණන කමිටුව පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත වේ;

එස්. ගිරිදරන් මහතා	-	කමිටුවේ සභාපති
බී. එම්. ඩී. බී. බස්නායක මහතා	-	සාමාජික
ඩබ්. බටගොඩ	-	සාමාජික
ඩබ්.කේ.ඩී.ටී. අබේරත්න මහතා	-	සාමාජික
එන්.එස්.වනසිංහ මහතා	-	සාමාජික

මූල්‍ය වාර්තාකරණය

අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇති වගකීම් ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් ආයතනයේ මූල්‍ය වාර්තාකරණය අධීක්ෂණය කිරීමත්, මූල්‍ය ප්‍රකාශනය සමාලෝචනය කිරීමත්, එය ප්‍රකාශයට පත් කිරීමට ප්‍රථම විවාදයට ලක් කර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීමත් සඳහා කමිටුව පිහිටුවා තිබේ.

ගිණුම් ප්‍රතිපත්ති සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ සම්මතවලට අනුකූල වන්නේද යන්න පිළිබඳව සහතික කිරීම සඳහාත් විගණන කමිටුව මූල්‍ය ප්‍රකාශ සමාලෝචනය කිරීමේ නියැලේ.

සමාගමේ මෙහෙයුම් කටයුතු හා අනාගත විභවතා පිළිබඳව කළමනාකාරීත්වය සමඟ කමිටුව නිරන්තරයෙන් සාකච්ඡා කරනු ලබන අතර මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේ දී අදාළ සියලු කාරණා සැලකිල්ලට බඳුන්කර ඇති බවට සහතික වේ.

පාලනය හා අවදානම

සමාගමේ අභ්‍යන්තර පාලන පද්ධතියේ ඵලදායීතාවය කමිටුව විසින් සමාලෝචනය කරනු ලබයි. කමිටුව විසින් ප්‍රධාන ව්‍යාපාර හා පාලන අවදානම් මෙන් ම ආයතනය තුළ පවතින පාලන පරිසරය පිළිබඳ ඇගයීමක් සිදුකර නිරීක්ෂණය කළ දුර්වලතා සම්බන්ධයෙන් ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයට උපදෙස් දෙනු ලැබේ.

බාහිර විගණකවරුන්

විගණන කමිටුව විසින් බාහිර විගණන නිලධාරීන්ගේ ස්වාධීනත්වය සහ විගණන ක්‍රියාවලියේ ඵලදායීතාවය ඇගයීමට ලක් කරනු ලබයි.

විගණනයේ විෂය පථයට අදාළව සහ විගණනය අවසානයේ කළමනාකරණ ලිපිය සාකච්ඡා කිරීම සඳහා කමිටුව බාහිර විගණකවරුන් හමුවෙයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතීන් සමඟ පවතින අනුකූලතාවය සම්බන්ධයෙන් මතයක් ප්‍රකාශ කිරීමේ වගකීම දරන බාහිර විගණකවරුන් සමඟ විගණනයට ලක් කළ මූල්‍ය ප්‍රකාශ සමාලෝචනය කිරීම ද විගණන කමිටුව විසින් සිදු කරනු ලබයි.

විගණන කමිටුව විසින් විගණන වර්ෂයට අදාළ බාහිර විගණන නිලධාරීන්ගේ ස්වාධීනත්වය සමාලෝචනය කරයි. තවද, ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වන සංශෝධනයට අනුව, 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ ලියාපදිංචි කළ හෝ එසේ සළකනු ලබන හා එකී පනත ප්‍රකාරව රාජ්‍ය හෝ පොදු ව්‍යාපාර හෝ ප්‍රාදේශීය අධිකාරීවල කොටස්වලින් සියයට 50ක් හෝ ඊට වඩා වැඩි ප්‍රමාණයක් එම ආයතන සතු වන විට ඒවායේ විගණන කටයුතු සිදු කිරීම විගණකාධිපති දෙපාර්තමේන්තුව යටතට ගැනෙන බව අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කරන මහා සභා රැස්වීමේ දී කොටස් හිමියන්ගේ අනුමැතිය ලබා ගැනීමට යටත්ව, 2019/2020 වර්ෂය සඳහා විගණකාධිපති දෙපාර්තමේන්තුවෙන් විගණකවරුන් පත් කිරීම නිර්දේශ කරන ලදී.

නිගමනය

සමාගමේ මූල්‍ය තත්ත්වය ප්‍රමාණවත් තරම් සමාලෝචනය වී තිබේද යන්න හඳුනා ගැනීමේ දී සමාගමේ බාහිර විගණකවරුන් විසින් සම්පාදනය කළ වාර්තා සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයේ සහතික වීම කමිටුව විසින් සළකා බලනු ලැබේ.

සභාපති - විගණන කමිටුව
දිනය 2020.07.24

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } පිඑල්ඒ/ඩී/ජීඕපිඑල්/01/2018/07 මගේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2020 ජනවාරි 13 දින

සභාපති

සීමාසහිත ගල්ඔය වැව්ලි (පුද්ගලික) සමාගම

සීමාසහිත ගල්ඔය වැව්ලි (පුද්ගලික) සමාගමේ 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

සීමාසහිත ගල්ඔය වැව්ලි (පුද්ගලික) සමාගමේ 2019 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හා අලාභ හා වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සමාගමේ 2019 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 කරුණක් අවධාරණය කිරීම

මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 5 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරන අතර , ඒ අනුව 2019 මාර්තු 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා රු. 1,817,576,166ක ශුද්ධ අලාභයක් ලබා තිබීම හා එදිනට සමාගමේ මුළු වත්කම් ඉක්මවා රු. 6,234,978,109ක වගකීම් ප්‍රමාණයක් ඇති හෙයින් සමාගමේ අඛණ්ඩ පැවැත්ම අවිනිශ්චිත වේ.

කෙසේ වෙතත්, කළමනාකාරිත්වය විසින් සැලසුම් සහගත ආයෝජන සහ ක්‍රියාකාරී සැලැස්මක් සකස්කර ඇති අතර එමඟින් අනාගතයේදී ධනාත්මක මුදල් ප්‍රවාහයක් සහ ලාභයක් ජනනය වනු ඇතැයි කළමනාකරණය අපේක්ෂා කරන අතර, සිදුවී ඇති පාඩු පියවා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එම සැලැස්ම අධීක්ෂණය කරනු ලැබේ. ඒ අනුව එතනෝල් බලාගාරය සඳහා ආයෝජනය කිරීම සහ සමාගමේ වතුයාය අපේක්ෂිත ධාරිතා මට්ටමට ළඟාවීම නිසා නිෂ්පාදන මට්ටම ඉහළයාම සහ බලශක්ති උත්පාදනය සඳහා නව ව්‍යාපෘතියක් හඳුන්වාදීම මඟින් අපේක්ෂිත ලාභය සහ ධනාත්මක මුදල් ප්‍රවාහය ජනනය කිරීමට සැලසුම් කර ඇති අතර සමාගම විසින් තීරණ ගැනීමේදී මෙම සැලසුම් මඟින් ලාභදායිතාව සහ මුදල් ප්‍රවාහයන්වලට වන බලපෑම පිළිබඳ අවධානය යොමුකර ඇති අතර අධ්‍යක්ෂකවරුන්ගේ අදහස වන්නේ සමාගමේ කටයුතු අඛණ්ඩව ඉදිරියට පවත්වාගෙන යාහැකි බවයි.

1.3 තත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 51 වන ඡේදය අනුව වත්කමක අවශේෂ වටිනාකම හා ජීව කාලය සෑම මුදල් වර්ෂයකම සමාලෝචනය කර පවතින ඇස්තමේන්තු වලින් වෙනස් වන්නේ නම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 8 අනුව ඇස්තමේන්තු වෙනසක් ලෙස ගිණුම් ගත කල යුතු වුවත් සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද හා දැනට භාවිතා කරනු ලබන පිරිවැය රු.237,335,416 ක් වටිනා යන්ත්‍රෝපකරණ, ගෘහ භාණ්ඩ, වාහන හා කෘෂිකාර්මික උපකරණ නැවත අගය කර ගිණුම් වලට ගෙන නොතිබුණි.

(ආ) සමාගමේ අඩමාණ ණය වෙන්කිරීමේ ප්‍රතිපත්තිය අනුව උක් වගා බිම් සකස් කිරීම වෙනුවෙන් ලබා දුන් ණය සඳහා රු. 35,457,048 ක් හා අනෙකුත් කෘෂිකාර්මික කටයුතු වෙනුවෙන් ලබා දුන් ණය සඳහා රු. 45,405,332 ක් වශයෙන් අඩමාණ ණය සඳහා රු.80,862,380 ක ප්‍රතිපාදනයක් සිදු කල යුතු වුවත් අදාල ප්‍රතිපත්තිය නොසලකා සමාගම විසින් අඩමාණ ණය ලෙස රු. 69,635,106 ක් වෙන් කර තිබීම හේතුවෙන් අඩමාණ ණය වෙන්කිරීම් රු.11,227,274 ක් අඩුවෙන් දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම,පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මහඟරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම් ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම්, චේතනාන්විත මහහැරීම් හෝ අභ්‍යන්තර පාලනයන් මහහැරීම් වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙලිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරවිකිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරවිකිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

- 2007 අංක 7 දරන සමාගම් පනතේ 163 (1) (ඇ) වගන්තියේ සහ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සමාගම පවත්වාගෙන ගොස් තිබුණි.

- සමාගමේ මූල්‍ය ප්‍රකාශන, 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියෙහි අවශ්‍යතාවයන්ට අනුකූල වේ.
- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පණතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සමාගම සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව	විස්තරය
2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය	
(i) 6.5.1 ඡේදය	මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත කෙටුම්පත් වාර්ෂික වාර්තාව සමඟ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කල යුතු වුවත් සමාගම විසින් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ මාස 05 ක් ප්‍රමාද වී 2019 ඔක්තොම්බර් 30 දින වන අතර කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි.
(ii) 9.3.1 ඡේදය	සෑම ආයතනයකටම අදාලව කාර්ය මණ්ඩලය බඳවා ගැනීමේ පටිපාටියක් සකස් කර යුතු වුවත් සමාගම සඳහා අනුමත බඳවා ගැනීමේ පටිපාටියක් සකස් නොකර සමාලෝචිත වර්ෂය තුළදී බඳවාගැනීම් සිදුකර තිබුණි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

  (අ) සමාගම විසින් මූල්‍ය ආයතන වලින් ලබාගෙන තිබූ කල්බදු පහසුකම් සඳහා සමාලෝචිත වර්ෂයේදී ගෙවිය යුතු කල්බදු වාරික නියමිත දිනයන්හිදී නොගෙවීම හේතුවෙන් ඒ සඳහා අමතර පොළිය වශයෙන් රු. 5,812,203 ක් ගෙවීමට සිදුවී තිබුණි.

(ආ) ගල්ඔය වැවිලි පුද්ගලික සමාගමේ සේවක සුබසාධක සංගමය වෙත ලබාදී තිබූ සිනි වෙනුවෙන් ලැබිය යුතු වසර 03 කට වඩා කල් ගත වී තිබූ රු.383,000 ක ශේෂය අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාගමේ අමුද්‍රව්‍ය හා සේවා සැපයුම්කරුවන් වෙත ලබාදී තිබූ වසර 03 ට වඩා පැරණි පිළිවෙලින්රු. 3,951,090 හා රු. 2,831,338 ක් වූ අත්තිකාරම් විගණිත දිනය වන විටත් පියවා ගැනීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි.

(ඈ) 2018/2019 ගිණුම් වර්ෂය වන විට සමාගමේ උක් වගාකල හැකි බිම් ප්‍රමාණය හෙක්ටයාර 6208 ක් වුවද උක් වගාකර තිබුණේ හෙක්ටයාර 5999 ක පමණි. 2018/2019 ගිණුම් වර්ෂයේ හෙක්ටයාරයකට සාමාන්‍ය උක් ඵලදාව මෙට්ට්‍රික් ටොන් 53 ක් වන අතර උක් වගා නොකළ හෙක්ටයාර 208 ක් මත අහිමි වී තිබූ සාමාන්‍ය උක් ඵලදාව මෙට්ට්‍රික් ටොන් 11,024 ක් වන අතර එමඟින් සිනි මෙට්ට්‍රික් ටොන් 738.6 ක්, එතනෝල් ලීටර් 151,580 ක් හා කොම්පෝස්ට් මෙට්ට්‍රික් ටොන් 220.5 ක් පමණ නිෂ්පාදනයක්ද අහිමි වීතිබුණි.

(ඉ) කර්මාන්තශාලාවට අවශ්‍ය බල ශක්තිය සිනි නිෂ්පාදන ක්‍රියාවලියෙන් ඉවතලන බැගෑස් ආධාරයෙන් නිපදවන අතර එය ප්‍රමාණවත් නොවූ පසු ජාතික විදුලි බලය යොදාගනිමින් යන්ත්‍ර ක්‍රියාත්මක කරයි. 2014/2015 ගිණුම් වර්ෂය වන විට මෙගා වොට් පැය 3,020 ක් වූ කර්මාන්තශාලා බලශක්ති උත්පාදනය 2018/2019 ගිණුම් වර්ෂය වන විට මෙගා වොට් පැය 1,774 ක් දක්වා අඩු වී තිබුණි. මේ සඳහා වාර්ෂික උක් ඇඹරුම් ප්‍රමාණය අඩු වීම හා කර්මාන්තශාලාවේ අකාර්යක්ෂමතාව බලපා තිබූණද අදාළ තත්වයන් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කළමනාකරණය අපොහොසත් වී තිබුණි. ඒහේතුවෙන් විකල්ප බලශක්තීන් සඳහා අමතර පිරිවැයක් දැරීමට දසමාගමට සිදු වී තිබුණි.

3. වෙනත්විගණනනිරීක්ෂණ

(අ) 2014/2015 ගිණුම් වර්ෂය වන විට සමාගම විසින් ලබා ගෙන තිබූණය ප්‍රමාණය රු.මිලියන 2177 ක් වූ අතර ඒ සඳහා ගෙවා තිබූණය පොළියරු.මිලියන 529 ක් වූ අතර එය 2018/2019 ගිණුම් වර්ෂය වන විට ලබාගෙන තිබූණය ප්‍රමාණය රු. මිලියන 7400 ක් ද ක් වාසියයට 239 කින්ද ගෙවා තිබූ පොළිය රු.මිලියන 1803 ක් දක්වා සියයට 240 කින්ද වැඩි වී තිබුණි. සමාගමේ මෙහෙයුම් කටයුතු පවත්වා ගැනීම සහ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරා ගැනීම වෙනුවෙන් දිගින්දිගටම ණය ලබාගැනීම හේතුවෙන් සමාගමේ මූල්‍ය තත්වයඅයහපත් තත්වයකට පත්ව තිබුණි. එමෙන්ම 2006/2007 ගිණුම් වර්ෂයේ සිටම සමාගම අලාභ ලබමින් පවත්වාගෙන ගොස් ඇති අතර 2006/2007 වර්ෂයේ රු. මිලියන 219 ක් වූ එම අලාභය 2018/2019 ගිණුම් වර්ෂය වන විට අලාභය රු. මිලියන 1814 ක් දක්වා වැඩිවී තිබුණි.

(ආ) සමාගමේ අබලි ද්‍රව්‍ය ඉවත් කිරීමේ අරමුණින් 2018 නොවැම්බර් 15 දින මිල ගණන් කැඳවා තෝරාගන්නා ලද ගැණුම්කරුවන් සඳහා ලංසු පිරිනමා තිබූ නමුත් එම අබලි යකඩ භාවිතයට සුදුසු තත්වයේ නොමැති බව සඳහන් කරමින් ටෙන්ඩර් පත්‍රිකාවේ කොන්දේසි පරිදි නියමිත කාල සීමාව තුල අදාල අබලි ද්‍රව්‍ය ඉවත් කර නොගැනීම හේතුවෙන් ලංසු ක්‍රියාවලිය අසාර්ථක වී තිබුණි. එසේම වසර ගණනාවක සිට කර්මාන්තායතනය තුළ ඒකරාශී වූ මෘදු වානේ, වාත්තු යකඩ, තඹ, පිත්තල සහ මල නොබැඳුනු වානේ පසට යට වීම, වල් උවදුරු වලට ලක්වීම ආදී තත්ත්වයන්ට පත්වීම හා ඩෙංගු රෝගය ව්‍යාප්ත වීමට ඇති ඉඩකඩ හේතුවෙන් මෙම යකඩ කර්මාන්තශාලා පරිශ්‍රයෙන් ඉවත් නොකිරීමට එරෙහිව ප්‍රදේශයේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා විසින් දඩ මුදල් පැනවීමට කටයුතු කර තිබුණු අතර නිසි කාල සීමාව තුළ එම ද්‍රව්‍ය අලෙවි නොකිරීම හේතුවෙන් සමාගමට ලබා ගැනීමට තිබූ අමතර ආදායමක්ද අහිමි වී තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ

ආදායම් ප්‍රකාශය

ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම

ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

මාර්තු 31න් අවසන් වර්ෂය සඳහා,	Note	2019 (රු)	2018 (රු)
අයභාරය	**6**	**2,023,627,800**	1,243,023,570
විකුණුම් පිරිවැය		**(1,469,011,844)**	(957,558,213)
දළ ලාභය		**544,615,956**	285,465,357
අනෙකුත් ආදායම්	**7**	**32,524,960**	41,371,403
පරිපාලන වියදම්		**(597,794,535)**	(476,285,540)
බදු සහ පොළියට පෙර ලාභ/(අලාභ)		**(10,653,620)**	(149,448,781)
මූල්‍ය ආදායම්		**37,462**	30,210
මූල්‍ය වියදම්		**(1,803,529,762)**	(1,193,519,762)
ශුද්ධ මූල්‍ය වියදම්	**8**	**(1,803,492,300)**	(1,193,489,552)
බදුවලට පෙර පාඩුව	**9**	**(1,814,145,920)**	(1,342,938,332)
ආදායම් බදු වියදම්	**10**	**-**	(4,589,788)
වර්ෂය සඳහා පාඩුව		**(1,814,145,920)**	(1,347,528,120)
අනෙකුත් විස්තීර්ණ ආදායම්			
කිසි විටෙකත් ලාභ හෝ අලාභ ලෙස නැවත වර්ගීකරණය නොකරන අයිතම			
නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම මත ආයු ගණක ලාභය හෝ පාඩුව		**(3,430,246)**	(4,911,133)
බදුවලට පෙර අනෙකුත් විස්තීර්ණ ආදායම		**(3,430,246)**	(4,911,133)
වර්ෂය සඳහා පූර්ණ විස්තරාත්මක ආදායම		**(1,817,576,166)**	(1,352,439,253)
කොටසකට පාඩුව (රුපියල්)	**11**	**17.93**	13.32

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල අනිවාර්ය අංගයකි.
වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යාවලින් අඩු කිරීම් දක්වයි.

මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය

ගල්ඔය වැව්ලි (පුද්ගලික) සමාගම
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

මාර්තු 31න් අවසන් වර්ෂය සඳහා,	සටහන්	2019 (රු)	2018 (රු)
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත සහ උපකරණ	**12**	**1,944,006,104**	2,120,298,125
යටිතල පහසුකම් සංවර්ධනය	**13**	**57,721,152**	61,269,718
ඉඩම් හා ගොඩනැගිලි භාවිත කිරීමේ අයිතිය	**14**	**235,200,000**	245,000,000
ප්‍රාග්ධන නොනිමි වැඩ	**15**	**110,171,565**	11,002,668
අස්පෘශ්‍ය වත්කම්	**16**	**2,629,969**	1,304,326
ගොවීන්ට ලබා දුන් ණය	**17**	**128,308,993**	113,960,321
		2,478,037,783	2,552,835,158
ජංගම වත්කම්			
ජෛව විද්‍යාත්මක වත්කම්	**18**	**14,508,709**	20,710,760
තොග	**19**	**913,557,408**	719,275,368
ගොවීන්ට ලබා දුන් ණය	**17**	**287,704,611**	176,165,585
වෙළෙඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ	**20**	**82,799,228**	122,824,008
අනුබද්ධ පාර්ශ්වයන්ගෙන් ලැබිය යුතු ප්‍රමාණ	**21**	**3,153,670**	2,772,105
ආපසු ලැබිය යුතු ආදායම් බදු		**13,131,199**	2,579,077
මුදල් සහ ඒ සමාන දෑ	**22**	**28,597,348**	5,509,030
මුළු ජංගම වත්කම්		**1,343,452,174**	1,049,835,933
මුළු වත්කම්		**3,821,489,956**	3,602,671,091
හිමිකම් හා වගකීම්			
හිමිකම්			
ප්‍රකාශිත ප්‍රාග්ධනය	**23**	**1,011,764,730**	1,011,764,730
සමුච්චිත අලාභය		**(7,246,742,839)**	(5,429,166,673)
මුළු හිමිකම්		**(6,234,978,109)**	(4,417,401,943)
ජංගම නොවන වගකීම්			
පොළී සහිත ණය හා ණය ගැනුම්	**25**	**3,757,712,047**	3,702,703,173
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්	**24**	**50,727,388**	39,401,774
මූල්‍ය කල්බදු බැඳීම්	**26**	**130,254,893**	170,113,017
මුළු ජංගම නොවන වගකීම්		**3,938,694,328**	3,912,217,964
ජංගම වගකීම්			
පොළී සහිත ණය හා ණය ගැනුම්	**25**	**3,643,102,170**	2,848,358,129
මූල්‍ය කල්බදු බැඳීම්	**26**	**39,294,950**	37,943,951
වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ	**27**	**260,694,520**	168,496,162
අනුබද්ධ පාර්ශ්වයන්ට ගෙවිය යුතු ප්‍රමාණ	**28**	**1,936,830,544**	886,548,864
බැංකු අයිරා	**22**	**237,851,553**	166,507,964
මුළු ජංගම වගකීම්		**6,117,773,738**	4,107,855,071
මුළු හිමිකම් හා වගකීම්		**3,821,489,956**	3,602,671,091

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි.වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යාවලින් අඩු කිරීම් දක්වයි.. මෙම මූල්‍ය ප්‍රකාශය 2007 අංක 07 දරන සමාගම් පනතේ අවශ්‍යතාවයන්ට අනුකූල බව මම සහතික කරමි.

.....

මූල්‍ය ප්‍රධානී
එම්. ඒ. සී. මූණසිංහ මහතා

මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම හා ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම් වේ. අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා සහ වෙනුවෙන් අනුමත කොට අත්සන් කරන ලදී;

.....

අධ්‍යක්ෂ
(ආර්.එම්.ජී.කේ. බී. රත්නායක මහතා)

.....

අධ්‍යක්ෂ
(ගිරිදරන් සීනිවාසන් මහතා)

2019 සැප්තැම්බර් 16

හිමිකම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය

ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම

හිමිකම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය

	ප්‍රකාශිත ප්‍රාග්ධනය (රු)	රඳවාගත් ඉපැයුම් (රු)	එකතුව (රු)
2017 අප්‍රේල් 01 දිනට ශේෂය	1,011,764,730	(4,076,727,421)	(3,064,962,691)
වර්ෂය සඳහා අලාභය	-	(1,347,528,120)	(1,347,528,120)
වර්ෂය සඳහා අනෙකුත් විස්තීර්ණ ආදායම්	-	(4,911,133)	(4,911,133)
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම්	-	(1,352,439,253)	(1,352,439,253)
2018 මාර්තු 31 දිනට ශේෂය	**1,011,764,730**	**(5,429,166,673)**	**(4,417,401,943)**
වර්ෂය සඳහා අලාභය	-	**(1,814,145,920)**	**(1,814,145,920)**
වර්ෂය සඳහා අනෙකුත් විස්තීර්ණ ආදායම්	-	**(3,430,246)**	**(3,430,246)**
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම්	**-**	**(1,817,576,166)**	**(1,817,576,166)**
2019 මාර්තු 31 දිනට ශේෂය	**1,011,764,730**	**(7,246,742,839)**	**(6,234,978,109)**

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි.
වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යාවලින් අඩු කිරීම් දක්වයි.

මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය

ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම

මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය

මාර්තු 31න් අවසන් වර්ෂය සඳහා,	**2019** රුපියල්	2018 රුපියල්
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් උපයන ලද මූල්‍ය ප්‍රවාහ		
බදුවලට පෙර අලාභය	**(1,814,145,920)**	(1,342,938,332)
පහත සඳහන් කරුණු වෙනුවෙන් ගැලපීම්:		
මූල්‍ය ආදායම්	**(37,462)**	(30,210)
මූල්‍ය වියදම්	**1,803,529,762**	1,193,519,762
දේපළ පිරියත හා උපකරණ මත ක්ෂය	**251,874,884**	185,070,757
අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය කිරීම	**524,357**	340,297
කල්බදු අයිතිය ක්‍රමක්ෂය කිරීම	**9,800,000**	9,800,000
යටිතල පහසුකම් සංවර්ධන උපකරණ මත ක්‍රමක්ෂය කිරීම	**33,877,450**	36,199,707
ගොවි ණය කපා හැරීම	**9,762,172**	-
විශ්‍රාම පාරිතෝෂික සඳහා වෙන් කිරීම්	**11,386,138**	9,397,592
කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය	**306,571,381**	91,359,572
කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම		
තොග අඩුවීම්/(වැඩිවීම්)	**(194,282,041)**	(306,536,064)
ජෛව වත්කම් අඩුවීම්/(වැඩිවීම්)	**6,202,51**	1,465,571)
වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑවල වැඩිවීම	**40,024,781**	103,107,722)
අනුබද්ධ පාර්ශවයන්ගෙන් ලැබිය යුතු දෑවල අඩුවීම්/(වැඩිවීම්)	**(381,566)**	(395,709)
ගොවීන්ට ලබා දුන් ණය අඩුවීම්/(වැඩිවීම්)	**(135,649,870)**	27,563,325
වෙළඳ සහ අනෙකුත් ගෙවියයුතු දෑවල වැඩිවීම්/(අඩුවීම්)	**92,198,358**	91,800,973
අනුබද්ධ පාර්ශවයන් වෙත ගෙවියයුතු දෑවල අඩුවීම්/(වැඩිවීම්)	**5,154,264**	97,104,483
මෙහෙයුම්වලින් ජනනය වූ මුදල්	**119,837,359**	105,469,872
ආදායම් බදු ගෙවීම්	**(10,552,122)**	(6,478,988)
විශ්‍රාම පාරිතෝෂික ගෙවීම්	**(3,490,770)**	(2,235,404)
ගෙවූ මූල්‍ය වියදම්	**(758,402,348)**	(814,242,656)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලැබුණු/ (භාවිතා වූ) ශුද්ධ මූල්‍ය ප්‍රවාහය	**(652,607,881)**	(717,487,176)
ආයෝජන ක්‍රියාකාරකම් තුළින් ජනනය වූ මූල්‍ය ප්‍රවාහය		
ලැබුණු පොළී ආදායම්	**37,462**	30,210
දේපළ, පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම්	**(75,582,863)**	(1,370,270,128)
අස්පෘශ්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	**(1,850,000)**	(1,307,708)
යටිතල පහසුකම් නවාංග	**(30,328,884)**	(35,640,622)
ඉදිරියට යන ප්‍රාග්ධන ක්‍රියාකාරකම්වල ආයෝජන	**(99,168,897)**	906,452,001
ආයෝජන ක්‍රියාකාරකම් තුළ භාවිතා වූ ශුද්ධ මූල්‍ය ප්‍රවාහය	**(206,893,181)**	(500,736,246)
මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් ජනනය වූ මූල්‍ය ප්‍රවාහය		
බදු වගකීම් වල ශුද්ධ වැඩිවීම්/(අඩුවීම්)	**(38,507,125)**	92,442,990
අනුබද්ධ සමාගම්වලින් ණයට ගැනුම්වලින් ලැබීම්	**1,059,000,000**	1,335,919,008
අනුබද්ධ සමාගම්වලට ණය ආපසු ගෙවීම්	**(522,191,126)**	(244,985,645)
අනුබද්ධ නොවන සමාගම්වලින් ණය ගැනුම් වලින් ලැබීම්	**480,320,000**	200,927,371
අනුබද්ධ නොවන සමාගම්වලට ණය ආපසු ගෙවීම්	**(167,375,959)**	(77,349,844)
මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් ජනනය වූ ශුද්ධ මූල්‍ය ප්‍රවාහය	**811,245,790**	1,306,953,880
වසර තුළ මුදල් හා ඊට සමාන වෙනත් දෑ වල ශුද්ධ වෙනස්වීම්	**(48,255,271)**	88,730,457
වසර ආරම්භයේ දී පැවති මුදල් හා ඊට සමාන වෙනත් දෑ	**(160,998,935)**	(249,729,394)
වසර අවසානයේ මුදල් හා ඊට සමාන වෙනත් දෑ (සටහන 22)	**(209,254,205)**	(160,998,935)

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි.
වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යාවලින් අඩු කිරීම් දක්වයි.

මූල්‍ය ප්‍රකාශනයේ සටහන්

ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම
මූල්‍ය ප්‍රකාශණයේ සටහන්

1. ආයතනික තොරතුරු

1.1 වාර්තා කරන ස්ථිතිය
ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම යනු 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ 2006 වසරේ ඔක්තෝබර් 11 දින ස්ථාපනය කරන ලද සීමාසහිත වගකීම් දරන ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ සමාගමකි. සමාගමේ ලියාපදිංචි කාර්යාලය අංක 481, ටී.බී. ජයා මාවත, කොළඹ 10 යන ලිපිනයේ පිහිටා ඇති අතර සමාගමේ ව්‍යාපාරික කාර්යාලය හිඟුරානේ කර්මාන්තශාලා සංකීර්ණයේ පිහිටා ඇත.

1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් ස්වභාවය
සමාගම සීනි සහ මොලැසස් නිෂ්පාදනයේ සහ විදුලි බලය උත්පාදනයේ නිරතව සිටියි.

1.3 ආසන්නතම සහ අවසාන පරිපාලක ව්‍යවසාය
සමාගමේ ප්‍රධාන කොටස් හිමිකරු වන්නේ 2019 මාර්තු 31 දිනට සාමාන්‍ය කොටස් වලින් 51% කට හිමිකම් කියන ශ්‍රී ලංකා රජයයි. අප සමාගම එල්.ඕ.එල්.සී. සමූහය පීඑල්සී සහ බ්‍රවුන්ස් සහ සමාගමේ පීඑල්සී සමාගමේ හවුල්කාර ආයතනයකි. 2019 මාර්තු 31 දින වන විට එල්. ඕ.එල්.සී. සමූහය පී එල් සී සතුව සාමාන්‍ය කොටස් 26.95%ක් ද බ්‍රවුන්ස් සහ සමාගම (පී.එල්.සී.) සතුව සාමාන්‍ය කොටස් 22.05% ක් ද පැවතිණි.

1.4 නිකුත් කිරීම සඳහා බලය පවරන දිනය
2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමාසහිත ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගමේ මූල්‍ය ප්‍රකාශ (සංසන්දන සහිතව) නිකුත් කිරීමට වර්ෂ 2019ක් වූ සැප්තැම්බර් මස 16 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාව පරිදි බලය පැවරී ඇත.

2. මූල්‍ය ප්‍රකාශ සැකසීමේ පදනම

2.1 අනුකූලතාවය පිළිබඳ ප්‍රකාශය
සමාගමෙහි මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, ලාභ අලාභ සහ අනෙකුත් විස්තීර්ණ ආදායම් පිළිබඳ ප්‍රකාශය, හිමිකම් වෙනස් වීම පිළිබඳ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය හා ඊට අදාළ සටහන් යනාදියෙන් සමන්විත සමාගමේ මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා වරළත් ගණකාධිකාරීන්ගේ ආයතනය නියම කළ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS සහ SLFRS) වලට අනුව සහ 2007 අංක 07 දරන සමාගම් පනතට අනුකූලව සකස් කොට ඇත.

2.2 ගිණුම්කරණ පදනම
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි දක්වා ඇති පහත සඳහන් භෞතික අයිතම ගණනය කිරීමේ දී හැරුණු විට සමාගමෙහි මූල්‍ය ප්‍රකාශය ඓතිහාසික පිරිවැය ක්‍රමය අනුව සකස් කර ඇත.

- ජීව විද්‍යාත්මක වත්කම් (දැනට වගා කර ඇති උක්) ගණනය කරනු ලබන්නේ සාධාරණ අගයෙන් විකුණුම් පිරිවැය අඩු කිරීමෙනි.
- විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් ගණනය කරනු ලබන්නේ අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ බැඳීම්වල වර්තමාන වටිනාකම අනුව ය.

2.3 කෘත්‍යාත්මක ව්‍යවහාර මුදල
සමාගමේ කෘත්‍යාත්මක ව්‍යවහාර මුදල වන ශ්‍රී ලංකා රුපියල් වලින් මෙම මූල්‍ය ප්‍රකාශය ඉදිරිපත් කර ඇත. ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති සියලු මූල්‍ය තොරතුරු ආසන්න රුපියලට වටයා ඇත.

2.4 ගිණුම්කරණ ඇස්තමේන්තු, විනිශ්චයන් සහ උපකල්පන භාවිතය
ශ්‍රී ලංකා වරළත් ගණකාධිකාරීන්ගේ ආයතනය නිකුත් කළ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS සහ SLFRS) වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කරන විට ගිණුම්කරණ ප්‍රතිපත්ති උපයෝගී කර ගැනීම සහ ප්‍රකාශිත ආදායම, වියදම, වත්කම් සහ වගකීම් ප්‍රමාණයන් කෙරෙහි බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පනයන් කිරීමට කළමනාකාරිත්වයට සිදු වේ. මෙම ඇස්තමේන්තුවලට වඩා සත්‍ය ප්‍රතිඵල වෙනස් විය හැකිය. ඇස්තමේන්තු සහ උපකල්පනයන් ඓතිහාසික අත්දැකීම් සහ විවිධ හේතු මත සාධාරණ යැයි හැඟෙන වෙනත් සාධක මත පදනම්ව සිදු කරන ඒවා වේ. එබැවින්, සැබෑ අත්දැකීම් හා ප්‍රතිඵල මෙම විනිශ්චයන් සහ උපකල්පනයන්ට වඩා වෙනස් විය හැකිය.

ඇස්තමේන්තු සහ ඊට අදාළ උපකල්පන අඛණ්ඩව සමාලෝචනය කරනු ලැබේ. ගිණුම්ගත ඇස්තමේන්තුවලට අවශ්‍ය සංශෝධන එම කාලය සඳහා පමණක් හෝ අනාගතයට ද බලපායි නම් ඇස්තමේන්තු සංශෝධනය කරන කාලය තුළ දී ඒවා හඳුනාගනු ලැබේ.

ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම
මූල්‍ය ප්‍රකාශණයේ සටහන්

අ. ක්ෂයවන වත්කම්වල ඵලදායී ආයු කාලය

වාර්තා කරනු ලබන සෑම දිනකට ම ක්ෂයවන වත්කමක ඵලදායී ආයු කාලය, එම වත්කමෙහි අපේක්ෂිත උපයෝගීතාවය මත පදනම් වෙමින් කළමනාකාරීත්වය විසින් ඇස්තමේන්තු ගත කරයි. සමහර දේපළ, පිරියත හා උපකරණවල ඵලදායී ජීව කාලය වෙනස් වීමට තුඩු දිය හැකි තාක්ෂණික යල් පැනීම් මෙම ඇස්තමේන්තුවල පවත්නා අවිනිශ්චිතතාවන් හා සබැඳේ.

ආ. විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් ගණනය කිරීම

විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් පිළිබඳ කළමනාකාරීත්වයේ ඇස්තමේන්තුව, ඒ හා බැඳුනු උද්ධමන අනුපාතිකය, මරණ අනුපාතිකය, වට්ටම් අනුපාතිකය සහ අනාගත වැටුප් වැඩිවීම් අපේක්ෂා කිරීම යනාදී තීරණාත්මක උපකල්පනයන් රැසක් මත පදනම්ව ඇත. මෙම උපකල්පණයන් හි වෙනස්වීම් නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් ප්‍රමාණය සහ වාර්ෂික නිශ්චිත ප්‍රතිලාභ වියදම් සඳහා, තීරණාත්මක ලෙස බලපානු ඇත.

ඇ. ජීව විද්‍යාත්මක වත්කම්

දැනට වගා කර ඇති උක්වල සාධාරණ වටිනාකම මැනීමේදී කළමනාකාරීත්වය එය ඇස්තමේන්තු කරන අතර සාධාරණ වටිනාකම නිර්ණය කිරීම සඳහා විනිශ්චය අවශ්‍ය වේ. වගා කර ඇති උක්වල වෙළඳපල මිල දේශීය වෙළඳපොලෙන් ලබා ගන්නා අතර සමාගම වගා කර ඇති උක්වල ගුණාත්මය සහ බර ආඝන්න වශයෙන් ගණනය කරනු ලැබේ.

ඈ. හානිකරණය

හානිවීම් ගණනය කිරීමේ දී සෑම වත්කමකින් ම හෝ මුදල් උත්පාදනය කරන ඒකකයකින් අයකර ගත හැකි ප්‍රමාණය අනාගතයේ දී අපේක්ෂා කරනු ලබන මූල්‍ය ප්‍රවාහය මත පදනම් වන අතර ඒවා වට්ටම් කිරීම සඳහා සුදුසු පොළී අනුපාතිකයන් භාවිතා කරයි. අනාගත මෙහෙයුම් ප්‍රතිඵල පුරෝකථනය කිරීමේ දී කළමනාකාරීත්වය ස්වකීය විනිශ්චයන් මත පදනම් වෙමින් සමහර උපකල්පන වලට එළඹේ.

2.5 ප්‍රවර්තන (අකණ්ඩ) ව්‍යාපාරයක් ලෙස සැලකීම

සමාගම ප්‍රවර්තන ව්‍යාපාරයක් ලෙස පවත්වාගෙන යාමට ඇති හැකියාව පිළිබඳව අධ්‍යක්ෂවරුන් විසින් තක්සේරු කර ඇති අතර පුරෝකථනය කළ හැකි අනාගතයක් සඳහා ප්‍රමාණවත් තරම් සම්පත් පවතින බවට ද සෑහීමට පත් වේ. එබැවින් මෙම මූල්‍ය ප්‍රකාශ ව්‍යාපාරික අඛණ්ඩ බව සැළකිල්ලට ගෙන සකස් කර ඇත.

3. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති ආයතනය විසින් මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කර ඇති සෑම කාල වකවානුවක දී ම එකසේ භාවිතා කර තිබේ.

3.1 විදේශ විනිමය ගනුදෙනු

විදේශ මුදල් වලින් කෙරෙන ගනුදෙනු, ගනුදෙනු කටයුතු සිදුවන දිනය වන විට පවතින විදේශ විනිමය අනුපාතිකය අනුව ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කෙරේ. ශේෂ පත්‍ර දිනට විදෙස් මුදල් වලින් පවත්නා සියලුම මූල්‍ය වත්කම් සහ වගකීම් තත්කාලීනව බලපවත්නා වූ විදේශ විනිමය අනුපාතිකය අනුව ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කෙරේ. මූල්‍ය වත්කම් මත සිදුවන විදේශ මුදල් ලාභ හෝ පාඩුව වන්නේ වාර්තා කරනු ලබන කාල වකවානුව ආරම්භයේ පවතින ව්‍යවහාර විනිමය ක්‍රමක්ෂය කිරීමේ දී හා වාර්තා කරනු ලබන කාල වකවානුව අවසානයේ දී පැවති විදේශ විනිමය අනුපාතිකය අනුව ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කර ක්‍රමක්ෂය කිරීමේ දී සිදු වන වෙනස යි.

විදෙස් මුදල්වල ඓතිහාසික පිරිවැය මත ගණනය කරනු ලබන විදේශ මුදල් වලින් නම් කර ඇති මූල්‍ය නොවන වත්කම් සහ වගකීම් මුල් ගනුදෙනුව සිදු කළ දිනයේ දී පැවති විදේශ විනිමය අනුපාතිකයට අනුව ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කෙරේ. සාධාරණ අගය මත ගණනය කරනු ලබන විදෙස් මුදල්වලින් නම් කර ඇති මූල්‍ය නොවන වත්කම් හා වගකීම් සාධාරණ අගය නිර්ණය කරනු ලබන දිනට බලපවත්නා වූ අනුපාතිකය අනුව ප්‍රතිපරිවර්තනය කරනු ලැබේ.

එලෙස විකිණීම සඳහා ඇති කොටස් ආයෝජන නැවත බෙදා හැරීමේදී පැන නගින වෙනස්කම් හැර විදෙස් මුදල් ප්‍රතිපරිවර්තනය කිරීමේදී ඇතිවන විදෙස් මුදල් ඍනතා ලාභාලාභ ප්‍රකාශනයෙහි දක්වයි. මූල්‍ය වගකීමක් වීදේශ මෙහෙයුමක ශුද්ධ ආයෝජනයේ ආරක්ෂණයක් ලෙස හෝ වෙනත් විස්තීර්ණ ආදායමක් තුළ පිළිගත් සුදුසුකම් ලබන මුදල් ප්‍රවාහ ආරක්ෂණ ලෙස නියම කෙරේ. විදෙස් විනිමය ලැබීම් හෝ පාඩු ශුද්ධ පදනම්න් ලාභාලාභ ගිණුමේ සටහන් කරනු ලබයි.

3.2 වත්කම් හා ඒවා ඇගයීමේ පදනම

3.2.1. දේපළ, පිරියත හා උපකරණ

3.2.1.1 හඳුනා ගැනීම සහ මැනීම

දේපළ, පිරියත හා උපකරණවල සමුච්චිත ක්ෂය හෝ සමුච්චිත හානිකරණය පිරිවැයෙන් අඩු කොට ගණනය කර ඇත. වත්කම් මිල දී ගැනීමට දැරූ වියදම හා ඒවා මිල දී ගැනීම මඟින් අපේක්ෂා කරන ලද භාවිතාවන් වලට යෝග්‍ය තත්ත්වයට ගෙන ඒම සඳහා දැරූ සෘජු වියදම් දේපළ, පිරියත හා උපකරණවල පිරිවැයට ඇතුළත් වේ. ස්වයං නිෂ්පාදිත වත්කමක් නම් එය අදාළ කාර්යයට සුදුසු තත්ත්වයට ගෙන ඒමට දැරූ හඳුනා ගත හැකි සියලු පිරිවැය එනම් ද්‍රව්‍ය, සෘජු ශ්‍රමය යනාදිය සඳහා දැරූ වියදම් ඇතුළත් වේ. මේ සඳහා කොටස් ගැලවීමට, ඉවත් කිරීමට සහ උපකරණ ස්ථාපිත කර ඇති ස්ථානයේ නැවත ප්‍රතිස්ථාපනය කිරීමට යන වියදම ද ඇතුළත් වේ.
සියලු දේපළ, පිරියත හා උපකරණ ආරම්භයේ දී පිරිවැය මත හඳුනාගනු ලැබේ.

3.2.1.2 ආයතික පිරිවැය

දේපළ, පිරියත හා උපකරණවල ධාරණ ප්‍රමාණය සමාගම විසින් හඳුනාගනු ලබන්නේ යම් අයිතමයක කොටසක් ප්‍රතිස්ථාපනය කිරීමේ දී එම අයිතමය මඟින් මූර්තිමත්වන අනාගත ආර්ථික ප්‍රතිලාභ සමාගම වෙත ලැබෙන බව පෙනෙන විට දී හා ඊට දැරිය යුතු වියදම විශ්වසනීය ලෙස මිණිය හැකි විටදී ය. ප්‍රතිස්ථාපනය කරනු ලබන කොටස්වල ධාරණ ප්‍රමාණ එම වත්කම්වල පිරිවැයෙන් හඳුනා ගනී. ලාභලාභ ප්‍රකාශය මඟින් දේපළ, පිරියත හා උපකරණ සඳහා දරා ඇති දෛනික සේවා වියදම් හඳුනා ගනු ලබයි.

3.2.1.3 වත්කම් ලෙස හඳුනා නොගැනීම

ආරම්භයේ දී දේපළ, පිරියත හා උපකරණ සහ ඕනෑම වැදගත් කොටසක් ලෙස හඳුනාගත් අයිතමයන් බැහැර කිරීමේ දී හෝ බැහැර කිරීම හෝ භාවිතා කිරීම තුළින් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරන අවස්ථාවලදී ඒවා වත්කම් ලෙස හඳුනා නොගනී. එසේ වත්කම් ලෙස හඳුනා නොගනී නම් එතුළින් ජනනය වන ඕනෑම ලාභයක් හෝ පාඩුවක් (වත්කමේ ධාරණ ප්‍රමාණය හා ශුද්ධ බැහැර කිරීම් අතර වෙනස මඟින් ගණනය කරනු ලැබේ) විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ ඇතුළත් කරනු ලැබේ. වත්කමේ ශේෂ වූ වටිනාකම, ජීව කාලය සහ ක්ෂය කිරීමේ ක්‍රමවේදය සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේ දී ම සමාලෝචනය කරන අතර පෙරදිසි මූල්‍ය ප්‍රකාශය සමඟ යෝග්‍ය පරිදි ගලපනු ලබන්නේ, තීරකයන් වෙත ලබා දෙන මූල්‍ය ප්‍රකාශයෙහි ඉදිරිපත් කරන තොරතුරුවල අදාළතාවය හා විශ්වසනීයත්වය ඉහළ නැංවීමට ය.

3.2.1.4 ක්ෂයවීම්

වත්කමක පිරිවැය, එහි ශේෂ වටිනාකමින් අඩු කිරීම මත ගණනය කරනු ලැබේ. දේපළ, පිරියත හා උපකරණවල සෑම උපාංගයක ම ක්ෂයවීම් සරළ මාර්ග ක්‍රමය අනුව ඇස්තමේන්තුගත සඵල කාලය සඳහා ලාභාලාභ ප්‍රකාශය තුළ හඳුනා ගැනේ. යම් වත්කමක ක්ෂයවීම ආරම්භ වන්නේ එම වත්කම ප්‍රයෝජනයට ගැනීමට යෙද වූ දින සිටය. ක්ෂයවීම අවසන් වන්නේ එය බැහැර කරන මුල්ම දින සිටය. කල්බදු කාලය අවසන් වීමත් සමඟම, සමාගම නිශ්චිතවම වත්කමේ හිමිකරු වන බව දන්නා විට හැරෙන්නට කල්බදු යටතේ ඇති වත්කම් කල්බදු කාලය හෝ සඵල ආයු කාලය යන දෙකෙන් කෙටි කාලය පුරාවට ක්ෂයවීම් ගණනය කරනු ලැබේ. කේවල වත්කම්වල වැදගත් අංගවල වටිනාකම තක්සේරු කරන අතර, වත්කමක අවශේෂ වලට වඩා යම් අංගයක සඵල කාලය වෙනස් වේ නම්, එම අංගයේ ක්ෂය වීම් වෙනම ගණනය කරනු ලැබේ.

ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම
මූල්‍ය ප්‍රකාශණයේ සටහන්

වත්මන් සහ සංසන්දනාත්මක වසර සඳහා ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය පහත පරිදි වේ.

දේපළ, පිරියත හා උපකරණ	වසර ගණන
ගොඩනැගිලි	වසර 30
කර්මාන්ත ශාලාවේ පිරියත හා යන්ත්‍ර	වසර 12
යන්ත්‍රෝපකරණ ගොණුව	වසර 04
ජල පිරිපහදු ඒකකය	වසර 12
ගෘහ භාණ්ඩ හා මෙවලම්	වසර 05
කාර්යාල උපකරණ	වසර 04
කෘෂි උපකරණ සහ ආම්පන්න	වසර 08
නිල නිවාසවල උපකරණ	වසර 08
කර්මාන්ත ශාලාවේ උපකරණ	වසර 08
ට්‍රැක්ටර් සහ ට්‍රේලර්	වසර 06
උක් නෙළන යන්ත්‍ර	වසර 04
යතුරු පැදි	වසර 04
පරිගණක උපකරණ	වසර 04
ජංගම දුරකථන	වසර 04
ජී පී එස් උපකරණ	වසර 04
අස්පෘශ්‍ය වත්කම්	වසර 04
ස්කාගාරය හා යන්ත්‍රෝපකරණ	වසර 20

3.2.1.5 බදු ඉඩම් සහ ගොඩනැඟිලි ක්‍රමක්ෂය කිරීම

කල් බදු අයිතීන්, කල් බදු කාලය අවසන් වන කාලය සහ වත්කමෙහි අපේක්ෂිත ඵලදායී ආයු කාලය යන දෙකෙන් කෙටි කාලය පුරාවට සමාන ප්‍රමාණයන්ගෙන් ක්‍රමක්ෂය කරනු ලැබේ.

වත්කම් පන්තිය	වසර ගණන
ඉඩම් සහ ගොඩනැඟිලි	අවුරුදු 30 ට
නිත්‍ය ඉඩම් සංවර්ධනය	අවුරුදු 30 ට

3.2.1.6 අස්පෘශ්‍ය වත්කම්

වත්කමට ආරෝපිත වූ අනාගත ආර්ථික ප්‍රතිලාභ සමාගම වෙත ගලා එනු ඇතැයි පෙනෙන විට හා වත්කමෙහි පිරිවැය විශ්වසනීය ලෙස ගණනය කළ හැකි විට එම පිරිවැය මඟින් අස්පෘශ්‍ය වත්කම් ආරම්භයේ දී හඳුනා ගනු ලබයි.

සියලුම පරිගණක මෘදුකාංගවල වියදම් හා දෘඩාංග භාවිතය සඳහා අත්‍යවශ්‍ය වන එමෙන්ම ඒ බව පැහැදිළිව හඳුනා ගත හැකි හා විශ්වසනීය ලෙස මිල කළ හැකි අනාගත ආර්ථික ප්‍රතිලාභ ජනනය කරනු ඇතැයි අපේක්ෂාවෙන් භාවිතා කිරීම සඳහා සමාගම විසින් ලබා ගන්නා බලපත්‍රවල වියදම්, අස්පෘශ්‍ය වත්කම් යටතට ගැනේ. හානිකරණ පාඩු හා සමුච්චිත ක්‍රමක්ෂය කිරීම්වලින් අඩුකර පිරිවැය වශයෙන් මෙම අස්පෘශ්‍ය වත්කම් මූල්‍ය ප්‍රකාශවල ඇතුළත් කරයි.

3.2.2 ජෛව වත්කම්

පැළ තවාන හා උක් වගාවන් ජෛව වත්කම් වශයෙන් සැළකේ.

උක් වගාවන්වල වටිනාකම සාධාරණ අගය මත විකුණුම් පිරිවැය අඩුකර ගණනය කරනු ලබන්නේ දේශීය වෙළඳපල ක්‍රියාවලීන් මත පදනම් වෙමින් සහ වෙනස්කම් ප්‍රකාශකිරීම සඳහා අවශ්‍ය අවස්ථාවන්හිදී ගැලපීම් සිදු කිරීමෙන් ය. උක් වගාවන්වල සාධාරණ අගය මත විකුණුම් පිරිවැයට අස්වනු නෙළීම, අස්වනු පැටවීම සහ ප්‍රවාහනය සඳහා වැඩිවන පිරිවැය ඇතුළත් වේ. විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ දැනට වගාකර ඇති උක්වල සාධාරණ වටිනාකමෙහි වෙනස හඳුනාගෙන ඇත.
උක් තවාන් සඳහා ආරම්භක පිරිවැය දැරීමෙන් අනතුරුව සුළු ජීව විද්‍යාත්මක පරිවර්තනයක් සිදු වූ බව සළකා පිරිවැය මත පදනම් වෙමින් තවාන්වල වත්කම් ගණනය කරනු ලැබේ. තව ද එම ජීව විද්‍යාත්මක පරිවර්තනය මිල කෙරෙහි සැළකිය යුතු බලපෑමක් ඇති කරන බවට අපේක්ෂා නොකෙරේ. එම පිරිවැයට සෘජු හා වක්‍ර රෝපණ පිරිවැය ඇතුළත් වේ.

3.2.2 ෛජෙව වත්කම් (තවදුරටත්.....)

වර්ධනය වන පැල තවාන් තවාන් සකස් කිරීමට අවශ්ය ද්‍රව්‍ය හා ශ්‍රමය සඳහා දැරූ වියදම සහ අනෙකුත් සෘජු පොදු කාර්ය වියදම්වල යෝග්‍ය අනුපාතිකයන් තවාන් වියදමට ඇතුළත් වේ.

3.2.3 ණය ගැණුම් පිරිවැය

අපේක්ෂිත භාවිතය හෝ අලෙවිය සඳහා සූදානම් කිරීමට සැළකිය යුතු කාලයක් වැය වන අත්පත්කර ගැනීම්, ඉදි කිරීම් හෝ වත්කම් සේ භාවිතා කිරීමට යෝග්‍ය දෑ නිෂ්පාදනය කිරීම සඳහා සෘජුව ම දායක වන ණය ගැණුම් පිරිවැය එම වත්කම්වල කොටසක් ලෙස ප්‍රාග්ධනිත කරනු ලැබේ.

එසේ ප්‍රාග්ධනිත නොකරන ණය ගැනීම්වල පිරිවැය අදාළ කාලය තුළ දරන වියදම් ලෙස හඳුනාගෙන විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට බැර කරනු ලැබේ. ප්‍රාග්ධනකරණය සඳහා යෝග්‍ය ණය ගැණුම් පිරිවැය ප්‍රමාණය ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිති අංක – 23 ‘ණය ගැනීමේ පිරිවැය’ අනුව නිර්ණය කරනු ලැබේ.

ක්ෂේත්‍ර සංවර්ධන කටයුතු සඳහා භාවිතා කරනු ලබන විශේෂිත ණයවලට අදාළ ණය ගැනීමේ වියදම් එම ක්ෂේත්‍රවල පවත්නා නොමේරූ වගාවන්වලට දැරූ වියදම් වල කොටසක් ලෙස ප්‍රාග්ධනිත කර ඇත. වාණිජමය අස්වනු නෙළීම සඳහා බෝගය සූදානම්ව පවතින විට දී ප්‍රාග්ධනකරණය නතර කරනු ලැබේ. එලෙස ප්‍රාග්ධනකරණය කළ ප්‍රමාණය හා එහි දී භාවිතා කළ අනුපාතික මූල්‍ය ප්‍රකාශ සටහන් මඟින් අනාවරණය කරනු ලැබේ. අත්පත් කරගැනීම්, ඉදිකිරීම් හෝ වත්කම් සේ භාවිතා කිරීමට යෝග්‍ය දෑ නිෂ්පාදනය කිරීමට සෘජුව ම දායක නොවන ණය ගැනීමේ වියදම් සළුල පොළී ක්‍රමය භාවිතයෙන් ලාභාලාභ ප්‍රකාශය තුළ හඳුනා ගැනේ.

3.2.4 ස්ථාවර ඉඩම් සංවර්ධන වියදම්

ස්ථාවර ඉඩම් සංවර්ධන වියදම් යනු සුවිශේෂී යටිතල පහසුකම් සංවර්ධනයේ දී හෝ කල්බදු අයිතිය යටතේ පවතින ඉඩම්වලට නව ප්‍රවේශ මාර්ග ඉදිකිරීමේ දී දැරීමට සිදුවන වියදම්ය.
ඉදිරියට පවතින කල්බදු කාලය සඳහා මෙම වියදම් ක්‍රමක්ෂය කර ප්‍රාග්ධනිත කර තිබේ.

3.2.5 අවසන් නොකළ ප්‍රාග්ධන වැඩ

මිල දී ගැනීම් හා ඉදිකිරීම් සඳහා දරන වියදම් සහ ඊට අදාළ අනෙකුත් වියදම් අවසන් නොකළ ප්‍රාග්ධන වැඩ සඳහා වන වියදම් නම් වේ. ස්ථාවර ස්වරූපයෙන් හෝ ව්‍යාපාරයේ ඉපයීම් ධාරිතාව ඉහළ නැංවීම සඳහා ඇරඹූ නමුත් අවසන් නොකළ ප්‍රාග්ධන වැඩ වෙනුවෙන් දැරූ වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සළකා ඇත.

මෙකී ප්‍රාග්ධන වැඩ පළමු වරට භාවිතා කරන අවස්ථාවේ දී හෝ එම වත්කම සම්බන්ධයෙන් බලය පැවරෙන විට දී අදාළ වත්කම් ගිණුම්වලට ඒවා මාරු කරනු ලැබේ.

3.2.6` කල් බදු

අ) මූල්‍ය කල් බදු

මූල්‍ය කල්බදු ලෙස වර්ග කරනු ලබන්නේ කල් බදුවල සියලු ලැබීම් හා අවදානම් සමාගම විසින් වැඩි වශයෙන් භාරගනු ලබන කල් බදුය. ආරම්භක හඳුනාගැනීමේ දී, දේපළ පිරියත හා උපකරණ ලෙස පවතින කල්බදු වත්කම් ඒවායේ සාධාරණ අගය හා අවම කල්බදු ගෙවීම් වල වර්තමාන වටිනාකම අතරින් අඩු අගයට අනුව ගණනය කරනු ලබයි. ආරම්භක හඳුනාගැනීමෙන් අනතුරුව, එම වත්කම්වලට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අනුකූල වන පරිදි, එකී වත්කම් ගිණුම්ගත කෙරේ. මූල්‍ය කල්බදු යටතේ ඇති අවම බදු ගෙවීම්, ගෙවිය යුතු වගකීම්වල අඩු කිරීම් සහ මූල්‍ය වියදම් අතර අනුපාතනය කරනු ලැබේ. වගකීම්වල පවත්නා ශේෂය මත නිත්‍ය ආවර්ත පොළී අනුපාතිකයන් පවරනු පිණිස බදු කාලය තුළ දී එළඹෙන සෑම කාලපරිච්ඡේදයක් සඳහා ම මූල්‍ය වියදම් වෙන් කරනු ලැබේ.

ආ). මෙහෙයුම් කල්බදු

කල්බදු කාලසීමාව තුළ දී බදු දීමනාකරු විසින් කල් බදුවල සියලු අවදානම් හා ප්‍රතිලාභ වැඩි වශයෙන් හා ඵලදායී ලෙස දරනු ලබන විට ඒවා මෙහෙයුම් කල්බදු ලෙස වර්ග කරනු ලැබේ.

මෙහෙයුම් කල්බදු යටතේ සිදුකරන ගෙවීම් කල්බදු කාලය පුරාවට සරළ මාර්ග ක්‍රමය හෝ කල්බදුවලින් උකහා ගන්නා ප්‍රතිලාභවල කාල රටාව වඩාත් නියෝජනය වන ආකාරයේ වෙනත් පදනමකින් ලාභාලාභ ප්‍රකාශයේ වියදමක් ලෙස හඳුනා ගනු ලැබේ.

3.2.7 මූල්‍ය නොවන වත්කම් - හානිකරණය

කිසියම් හානිකරණයක් සිදු වූ බවට සලකුණු පවතී ද යන්න නිර්ණය කිරීම සඳහා සෑම වාර්තාකරණයක දී ම ලේඛනගත භාණ්ඩ හැරුණුකොට සමාගමේ මූල්‍ය නොවන වත්කම්වල ඉදිරියට ගෙන ආ පිරිවැය ප්‍රමාණය සමාලෝචනය කරනු ලැබේ. එවැනි සළකුණු පවතී නම් එම වත්කම්වලින් අත්කර ගත හැකි ප්‍රමාණ ඇස්තමේන්තුගත කරනු ලැබේ. වත්කමක ඉදිරියට ගෙන ආ පිරිවැය ප්‍රමාණය හෝ එහි මුදල් උත්පාදන ඒකකය මඟින් අත්කර ගත හැකි ප්‍රමාණය ඉක්මවා යන විට එය හානිකරණ පාඩුවක් ලෙස හඳුනාගනු ලබයි. මුදල් උත්පාදන ඒකකයක් යනු අනෙකුත් වත්කම්වලින් බොහෝ දුරට ස්වාධීන වූ, මූල්‍ය ප්‍රවාහය ජනනය කරන හඳුනාගත හැකි කුඩාම වත්කම් කාණ්ඩය වේ. හානිකරණ, පාඩු ලාභ අලාභ ප්‍රකාශයේ හඳුනාගැනේ.

3.3 මූල්‍ය මෙවලම්

3.3.1 මූල්‍ය වත්කම්

සමාගම මූල්‍ය මෙවලම්වල ගිවිසුම්කර ප්‍රතිපාදන වල පාර්ශ්වකරුවෙක් වන විට සමාගමේ මූල්‍ය තත්ව ප්‍රකාශය තුළ මූල්‍ය වත්කම් හඳුනාගනී. වත්කමෙන් ගලා එන මුදල් ප්‍රවාහයන් වල ගිවිසුම්ප්‍රකාර අයිතිය කල් ඉකුත් වූ විට හෝ මූල්‍ය වත්කම්වලට අදාළ මූල්‍ය ප්‍රවාහ ලැබීමට ඇති ගිවිසුම්ප්‍රකාර අයිතිය පවරන ගනුදෙනුවක් හරහා මූල්‍ය වත්කම් ආශ්‍රිත සියලුම අවදානම් හා ලැබීම්වල අයිතිය සැලකිය යුතු තරමින් පවරන විට ඒවා මූල්‍ය වත්කම් ලෙස හඳුනා නොගනී. සමාගම විසින් සකස් කරන ලද හෝ රඳවාගත්, පවරන ලද මූල්‍ය වත්කම් වලට අදාළ ඕනෑම පොළියක්, වෙනම වත්කමක් හෝ වගකීමක් ලෙස හඳුනාගනී. මූල්‍ය වත්කම් හා වගකීම් හිලව් කරනු ලබන අතර අවශ්‍යම අවස්ථාවන් හී දී පමණක් මූල්‍ය තත්ව ප්‍රකාශයේ දැක්වෙන ශුද්ධ වටිනාකම ශුද්ධ පදනමින් නිරවුල් කිරීමට හෝ එකවිටම වත්කම් අත්කර ගැනීමට හා වගකීම් නිරවුල් කිරීමට සමාගමට නීත්‍යානුකූල අයිතියක් ඇත.

අ) ණය සහ ලැබිය යුතු දෑ

ණය සහ ලැබිය යුතු දෑ යනු සක්‍රිය වෙළඳපළ තුළ අප්‍රකාශිත ස්ථිර හෝ නිශ්චයනීය ගෙවීම් සහිත මූල්‍ය වත්කම් ය. ආරම්භයේ දී එවැනි වත්කම් සාධාරණ අගය මත සහ අනෙකුත් සෘජු ලෙස දායකවන සියලුම පිරිවැය මඟින් හඳුනාගනු ලැබේ. ඉන් අනතුරුව ණය සහ ලැබිය යුතු දෑ ඵලදායී පොළී ක්‍රමය අනුව හානිකරණ පාඩු ඇත්නම් අඩුකර ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කරනු ලැබේ.

ණය සහ ලැබිය යුතු දෑ යටතට පහත දෑ අයත් වේ.

i. වෙළෙඳ කටයුතුවලින් ලැබිය යුතු දෑ

ලැබිය යුතු බොල් ණය හා අවිනිශ්චිත දෑ වෙනුවෙන් වෙන් කළ ප්‍රතිපාදනවල ශුද්ධ මුදල අය කර ගැනීම සඳහා ඇස්තමේන්තු කරන ප්‍රමාණවලින් වෙළෙඳ හා වෙනත් ලැබිය යුතු දෑ ප්‍රකාශ කරනු ලැබේ. ලැබිය යුතු දෑ සම්බන්ධ මුල් කොන්දේසිවලට අනුව සමාගමට ලැබිය යුතු සියල්ල අයකර ගැනීමට නොහැකි බවට වාස්තවික සාක්ෂ්‍ය පවතින විට අවිනිශ්චිත ණය වෙනුවෙන් ප්‍රතිපාදනයක් වෙන් කරනු ලැබේ. බොල් ණය හඳුනා ගත් විට කපා හරිනු ලැබේ.

ආ) මුදල් සහ මුදල් සමාන කොටස්

මුදල් සහ මුදල් සමාන කොටස්, අතේ සහ බැංකුවල ඇති මුදල් සහ සාධාරණ වටිනාකමේ වෙනස්කම් වල නොසැලකිය යුතු අවදානමකට යටත් වන මාස තුනකට අඩු මුල් කල්පිරීමක් සහිත කෙටි කාලීන මුදල් බැඳීම් සපුරාලීමේ අරමුණින් පවත්වනු ලබන අනෙකුත් අධික ද්‍රවශීල මූල්‍ය වත්කම්වලින් සමන්විත වේ.

ඉල්ලුම මත ආපසු ගෙවිය හැකි සහ සමූහ මුදල් කළමනාකරණයේ අනිවාර්ය අංගයක් වන බැංකු අයිරා මුදල් ප්‍රවාහ ප්‍රකාශණ සඳහා මුදල් සහ මුදල් සමාන කොටස්වල අංගයක් ලෙස ඇතුළත් වේ.

3.4 ඉන්වෙන්ට්‍රි

පිරිවැය හා අයකර ගතහැකි වටිනාකම අතරින් අඩු අගයට අනුව ඉන්වෙන්ට්‍රි අගය කරනු ලැබේ. නිමැවුම් භාණ්ඩ ලේඛණ හා නිම නොකළ වැඩ පිළිබඳ සළකා බැලූ විට සාමාන්‍ය මෙහෙයුම් ධාරිතාව මත පදනම් වෙමින්, නිෂ්පාදන පොදු කාර්යයවල යෝග්‍ය අනුපාතිකයක් වියදමට ඇතුළත් වේ. ශුද්ධ අයකරගත හැකි වටිනාකම යනු ව්‍යාපාරයේ සාමාන්‍ය ක්‍රියාකාරීත්වය තුළ ඇස්තමේන්තුගත විකුණුම් මිලෙන්, ඇස්තමේන්තුගත වැඩ අවසන් කිරීමේ වියදම් හා විකුණුම් පිරිවැය අඩු කළ විට ලැබෙන අගය වේ.

ඉන්වෙන්ට්‍රි ඒවායේ වත්මන් තත්ත්වයට හා දැනට පවතින ස්ථානයට ගෙන ඒමට වැය වන වියදම පහත දැක්වෙන සූත්‍රයට අනුව ගණනය කරනු ලැබේ.

යෙදවුම් ද්‍රව්‍ය, අමතර කොටස් හා පාරිභෝගික ද්‍රව්‍ය - බර තැබූ සාමාන්‍ය පදනමින් සත්‍ය වියදම් ලෙස

නිෂ්පාදිත භාණ්ඩ සහ නොනිමි නිෂ්පාදන (සීනි) - සෘජු අමුද්‍රව්‍ය, හා සෘජු ශ්‍රම වියදම හා නිෂ්පාදන පොදු කාර්යය පිරිවැයේ යෝග්‍ය අනුපාතිකයන්ගෙන් අතුරු නිෂ්පාදන (මොලැෂස්) වල විකුණුම් මිල අඩුකිරීමෙන්

මොලැෂස්වල වටිනාකම විකුණුම් මිල අනුව ගණනය කෙරේ.

3.5 මූල්‍යමය වගකීම්

ආරම්භයේ දී, ණය සුරැකුම් සහ ණය හා ණයට ගැනීම් ඒවා ආරම්භ කළ දිනයන්ට අනුව සමාගම විසින් හඳුනා ගනී. අනෙකුත් සියලු මූල්‍යමය වගකීම්, ආරම්භයේ දී ගනුදෙනු කළ දිනට අනුව හඳුනා ගනී. සමාගම මූල්‍ය මෙවළම්වල එකඟතා විධිවිධානවල පාර්ශ්වයක් බවට පත්වන දිනය එම දිනය වේ. ගිවිසුගත බැඳීම් අත්හළ, අවලංගු කළ හෝ කල් ඉකුත් වූ මූල්‍යමය වගකීම් - සමාගම විසින් ගණනය කිරීම් සඳහා හඳුනා නොගනී.

ව්‍යුත්පන්න නොවන වගකීම් වෙනත් මූල්‍යමය වගකීම් ලෙස සමාගම විසින් වර්ග කරනු ලැබේ. එවැනි මූල්‍යමය වගකීම්, මුල දී සාධාරණ අගයට, අදාළ අනෙකුත් සෘජු ගනුදෙනු වල වියදම් එකතු කිරීමෙන් ගණනය කරනු ලැබේ. ඉන් අනතුරුව, සඵල පොළී අනුපාතික ක්‍රමය යටතේ, ක්‍රමක්ෂය පිරිවැය ලෙස මෙම මූල්‍යමය වගකීම් ගණනය කරනු ලැබේ. වෙනත් මූල්‍යමය වගකීම්වලට ණය හා ණය ගැනීම්, බැංකු අයිරා සහ නිකුත් කළ ණයකර ඇතුළත් වේ.

3.5.1 වෙනත් වගකීම් හා ප්‍රතිපාදන

3.5.1.1 පොදු

මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කළ වගකීම් යනු ඉල්ලා සිටින විට දී මූල්‍ය තත්ත්ව ප්‍රකාශය ප්‍රකාශයට පත් කළ දිනයේ සිට වසරක් තුළ ගෙවිය යුතු වගකීම්ය. ජංගම නොවන වගකීම් යනු, මූල්‍ය තත්ත්ව ප්‍රකාශය ප්‍රකාශයට පත් කරන දින සිට වසරකට පසු ගෙවිය යුතු ශේෂයයි. මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ දී හඳුනා ගනු ලැබූ සියලුම වගකීම් ගණනය කරනු ලැබේ. අතීත සිද්ධින්වල ප්‍රතිඵලයක් ලෙස සමාගමට/ සමූහ ව්‍යාපාරයට නීත්‍යානුකූල හෝ සම්ප්‍රයුක්ත බැඳීමක් පවතින විට ප්‍රතිපාදන හා වගකීම් ගණනය කරනු ලබන අතර, එකී බැඳීම් නිරවුල් කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභ වැයකළ යුතු වේ.

3.5.2 සේවක ප්‍රතිලාභ

3.5.2.1 නිශ්චිත දායකත්ව සැලසුම්

නිශ්චිත දායකත්ව සැලස්මක් යනු, පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ සැලැස්මක් වන අතර ඒ යටතේ යම් ආයතනයක් වෙනත් ආයතනයක් වෙත ස්ථිර දායකත්වයක් ගෙවනු ලබන නමුත් තවදුරටත් ගෙවීම් කිරීම සඳහා නීත්‍යානුකූල හෝ සාධනීය බැඳීමක් නොපවතී. නිශ්චිත දායකත්ව සැලසුම්වලට බැර කරනු ලබන අදාළ දායකත්වයන් මඟින් සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාරත්ව අරමුදලට සුදුසුකම් ලබන සියලුම සේවකයන් ආවරණය කරනු ලබන අතර අවශ්‍ය විට දී ඒවා මූල්‍ය ප්‍රකාශවල වියදමක් ලෙස හඳුනා ගනු ලැබේ.

3.5.2.2 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්

නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මක් යනු, නිශ්චිත දායකත්ව සැලස්මක මෙන් ම පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ සැලැස්මකි. වාර්තා කරන දිනට, නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශවල හඳුනා ගන්නා වගකීම් නිශ්චිත ප්‍රතිලාභ බැඳීමේ වර්තමාන අගය වේ. නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් වාර්තා කරන දිනට ශ්‍රී ලංකා ගිණුම්කරණ

ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම
මූල්‍ය ප්‍රකාශණයේ සටහන්

ප්‍රමිති අංක 19 මඟින් නිර්දේශ කර ඇති පරිදි ඒකක ණය ක්‍රමයට අනුව සුදුසුකම් ලත් ආයුගණකවරයෙකු විසින් සිදු කරනු ලැබේ. සෑම වසරකදීම ආයුගණක තක්සේරු සිදු කිරීමට සමාගම බලාපොරොත්තු වේ.

නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්වල වත්මන් අගය නිර්ණය කරනු ලබන්නේ, ප්‍රතිලාභ සම්බන්ධයෙන් ගෙවීම් කරනු ලබන මුදල්වලට අදාළ පොළී අනුපාතික භාවිතයෙන් වගකීම් කාලසීමාවලට දළ වශයෙන් සමාන වන පරිනත වීමේ කාල සීමා සහිත අනාගත මූල්‍ය ප්‍රවාහ වට්ටම් කිරීමෙනි. මූල්‍ය ප්‍රකාශවල සියලුම සේවකයන්ගේ සේවා කාලයේ පළමු වසරේ සිට විශ්‍රාම පාරිතෝෂික ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන මූල්‍ය ප්‍රකාශ තුළින් සලසා තිබේ.

කෙසේ නමුත් 1983 අංක 12 දරන විශ්‍රාම පාරිතෝෂික පනත යටතේ සේවකයෙකුට ගෙවීම් සිදු කිරීමේ වගකීම එළඹෙන්නේ වසර පහක අඛණ්ඩ සේවය සම්පූර්ණ කළ විට පමණි. මෙම වගකීම සඳහා බාහිර ප්‍රභවයකින් අරමුදල් සම්පාදනය කර නොමැත. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 19 අනුගමනය කරමින් නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් නිසා පැණ නගින සියලු ආයුගණක ලාභ හා පාඩු ඒවා පැණ නැගුනු වහාම අනෙකුත් විස්තීර්ණ ආදායම් තුළින් ඉතා ඉක්මණින් හඳුනා ගනී. මෙය නැවත සලකා බැලීමේ බලපෑම සහිතව සමාගම විසින් සම්මත කර ඇත.

3.5.2.3 කෙටි කාලීන ප්‍රතිලාභ

කෙටි කාලීන සේවක ප්‍රතිලාභ හා බැඳීම් වට්ටම් නොකර ගණනය කරනු ලබන අතර, අදාළ සේවාවන් ලබා දෙන විට වැය කරනු ලැබේ.

3.6 ප්‍රතිපාදන

අතීත සිද්ධියක ප්‍රතිඵලයක් වශයෙන් හට ගැනෙන, විශ්වසනීය ලෙස ඇස්තමේන්තුගත කළ හැකි නෛතික හෝ සම්මුතික බැඳීමක් පවතී නම් එය ප්‍රතිපාදනයක් ලෙස හඳුනා ගන්නා අතර, එකී බැඳීම නිරවුල් කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභ වැය කිරීමට අවශ්‍ය විය හැක.

3.7 අයභාරය

ආයතනයේ ශුද්ධ අයභාරයේ පිරිවැටුම් බදු සහ වෙළඳ වට්ටම් ඉවත් කර ඇත. දළ අයභාරය මඟින් සමාගමේ බාහිර ගනුදෙනුකරුවන්ට ලබා දෙන භාණ්ඩ හා සේවාවන්වල බිල්පත් වටිනාකම නිරූපනය වේ.

3.7.1 ආදායම් හඳුනාගැනීම

සමාගම වෙත ගලා එන බවට සහතික වන ආර්ථික ප්‍රතිලාභ ප්‍රමාණය, අයභාරය හා ඒ ආශ්‍රිත පිරිවැය විශ්වාසනීය අන්දමින් මිණිය හැකි ප්‍රමාණය අනුව අයභාරය හඳුනාගනු ලැබේ. සමාගම වෙත ලැබුණු හා ලැබිය යුතු දේවල සාධාරණ අගය, වෙළඳ වට්ටම් හා එකතු කළ අගය මත බදුවල ශුද්ධ අගය හා සමාගමේ විකුණුම්වල ශුද්ධ අගය අනුව අයභාරය ගණනය කරනු ලැබේ.

අ) භාණ්ඩ අලෙවිය

සාමාන්‍ය ක්‍රියාකාරිත්වය තුල දී භාණ්ඩ අලෙවියෙන් ලැබෙන අයභාරය සමාගම වෙත ලැබුනු හා ලැබිය යුතු දේවල සාධාරණ අගය, ශුද්ධ ලැබීම්, වෙළඳ වට්ටම් හා තොග අඩු කිරීම් මඟින් ගණනය කරනු ලැබේ. අයභාරය හඳුනාගනු ලබන්නේ සුවිශේෂ අවදානම් හා ලැබීම් වල අයිතිය ගනුදෙනුකරුවන් වෙත පවරා දී ඇති බව, අදාළ කාරණය සම්බන්ධයෙන් අයකරගැනීම් සිදු කළ හැකි බව, භාණ්ඩ ආශ්‍රිත පිරිවැය හා ඒවායේ අනාගත ලැබීම් විශ්වසනීය ලෙස ඇස්තමේන්තු ගත කළ හැකි වූ භාණ්ඩ සම්බන්ධයෙන් තවදුරටත් කළමණාකාරිත්වයේ මැදිහත් වීමක් නොමැති බව සහ අයභාරයේ ප්‍රමාණය විශ්වසනීය ලෙස මිණිය හැකි බව යනාදිය පිලිබඳව ක්‍රියාත්මක වෙළෙඳ ගිවිසුමක ස්වරූපයෙන් යුතුව විශ්වාසදායක සාක්ෂි පවතින විටදීය.

3.8 වෙනත් ආදායම්

ආයුගණක පදනමින් වෙනත් ආදායම් හඳුනා ගැනේ.

අ) සමූහ ව්‍යාපාරය සතුව තිබූ දේපළ, පිරියත හා උපකරණ බැහැර කිරීම්වලින් ලද ලාභ / පාඩු

දේපළ පිරියත හා උපකරණ හා අනෙකුත් ජංගම නොවන වත්කම් බැහැර කිරීමෙන් ලද ලැබීම්, එම වත්කම්වල ධාරණ ප්‍රමාණ බැහැර කිරීම සඳහා කළ විකුණුම් හා ඒ ආශ්‍රිත අනෙකුත් වියදම් අඩුකර ලාභාලාභ ප්‍රකාශයේ සඳහන් කර ඇත. නැවත වටිනාකම තක්සේරු කළ දේපළ පිරියත හා උපකරණ බැහැර කිරීමේ දී එම වගකීමට අදාළ ශේෂය නැවත තක්සේරු කිරීමේ දී ඉතිරිව පවතින ප්‍රමාණය සෘජුව ම රඳවාගත් ඉපැයුම් වලට පැවරේ.

ගල්ඔය වැව්ලි (පුද්ගලික) සමාගම
මූල්‍ය ප්‍රකාශණයේ සටහන්

ආ) ගොවි ණයවලින් ලද පොළී ආදායම

ගොවීන්ට ලබාදුන් ණයවලින් ලැබෙන පොළී ආදායම, ලාභාලාභ ප්‍රකාශයේ හා අනෙකුත් විස්තීරණ ආදායම් ප්‍රකාශයේ උපචිත පදනමින් හඳුනා ගනු ලැබේ.

3.9 මූල්‍යමය ආදායම

අයකර ගැනීමේ හැකියාව සැකසහිත නොවේ නම් කාලීන පදනම මත (වත්කම මත සුළු ආදායම සැලකිල්ලට ගනිමින්) උපචිත පොළිය ලෙස මූල්‍යමය ආදායම හඳුනාගනු ලැබේ.

3.10 වියදම් හඳුනාගැනීම

විශේෂිත ආදායම් අයිතමවල ඉපැයීම් හා දැරිය යුතු වියදම අතර සෘජු සබඳතාවක් පවතින බවට සලකා ලාභාලාභ ප්‍රකාශයේ වියදම් හඳුනා ගනු ලැබේ. සමාගම ක්‍රියාත්මක වීමේ දී හා දේපළ පිරියත හා උපකරණ කාර්යක්ෂම ලෙස ක්‍රියා කරන පරිදි නඩත්තු කිරීමේ දී දැරිය යුතු පිරිවැය ලාභ ලබන වර්ෂයක් බවට පත් වීමේ දී ආදායමෙන් බැර කර ඇත. ලාභාලාභ ප්‍රකාශ ඉදිරිපත් කිරීම සඳහා පිරිවැය ක්‍රමයේ ශ්‍රිතය මඟින් සමාගමේ කාර්යසාධන මූලිකාංග පිළිබඳ සාධාරණ ඉදිරිපත් කිරීමක් නියෝජනය වන බව අධ්‍යක්ෂකවරුන්ගේ මතය වන අතර එබැවින් එම ඉදිරිපත් කිරීමේ ක්‍රම භාවිතා කර ඇත.

ප්‍රාරම්භක හා පූර්ව මෙහෙයුම් පිරිවැය ලාභාලාභ ප්‍රකාශයේ හඳුනාගෙන ඇත. අලුත්වැඩියා කිරීම් හා නවීකරණය කිරීම් වසරේ වියදම් සඳහන් කරනු ලබන විස්තීරණ ආදායම් ප්‍රකාශයට බැර කරනු ලැබේ.

3.11 බදු වියදම්

බදු වියදම් සමන්විත වන්නේ ජංගම, විලම්භීත හා අනෙකුත් ව්‍යවස්ථාපිත බදු වලිනි. භිමිකම් වෙනස්වීම් පිලිබඳ ප්‍රකාශය මඟින් සෘජුව හඳුනාගන්නා අයිතමවලට සම්බන්ධ වන බදු වියදම් ප්‍රමාණය හැරුණු කොට, විස්තීරණ ආදායම් ප්‍රකාශය මඟින් බදු වියදම් හඳුනා ගැනේ.

3.11.1 ජංගම බදු

ජංගම බදු යනු, වාර්තා කරන දිනට, ප්‍රඥප්ත හෝ උපයෝගී ප්‍රඥප්ත බදු අනුපාතිකවලට අනුව වර්ෂය සඳහා බදු ගෙවිය යුතු ආදායම හෝ පාඩුව වෙනුවෙන් ගෙවීමට හෝ ලැබීමට අපේක්ෂිත බදුය. ආදායම් බදු සඳහා ප්‍රතිපාදන පදනම් වන්නේ මූල්‍ය ප්‍රකාශවල වාර්තා වන ආකාරයට සහ 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ ප්‍රතිපාදනවලට අනුව ගණනය කරන ආකාරයට ආදායම් හා වියදම් මූලිකාංග මත ය.

වර්තමාන හා ඊට පෙර කාලසීමාවන් සඳහා ජංගම බදු වත්කම් හා වගකීම් දේශීය ආදායම් කොමසාරිස් ජෙනරාල් වෙත ගෙවිය යුතු හෝ/වෙතින් අයකර ගැනීමට අපේක්ෂිත ප්‍රමාණ ලෙස ගණනය කරනු ලැබේ.

3.11.2 විලම්භීත බදු

විලම්භීත බදු හඳුනාගනු ලබන්නේ මූල්‍ය වාර්තාකරණ අවශ්‍යතා හෝ බදුකරන අවශ්‍යතා සඳහා වත්කම් හා වගකීම්වල ඉදිරියට ගෙන ආ පිරිවැය ප්‍රමාණ අතර තාවකාලික හිඟ ප්‍රමාණ ලබා දීම සඳහා ශේෂපත්‍ර ක්‍රමය භාවිතයෙනි. තාවකාලික හිඟ ප්‍රමාණවලට අදාළ වන අනුපාතිකවලට අනුව විලම්භීත බදු ගණනය කරනු ලැබේ.

හඳුනාගත් විලම්භීත බදු වගකීමට වඩා ඉදිරියට ගෙනා බදු පාඩු වැඩි නම් මූල්‍ය ප්‍රකාශ මඟින් විලම්භීත බදු වගකීම් හඳුනාගනු නොලැබේ.

3.12 කොටසකට ඉපැයුම් / (පාඩුව)

සමාගම විසින් සාමාන්‍ය කොටස් සඳහා කොටසකට මූලික ඉපැයුම (ඊ පී එස්) ඉදිරිපත් කරයි. සමාගමේ සාමාන්‍ය කොටස් හිමිකරුවන්ට ලැබිය යුතු ලාභය හෝ පාඩුව අදාළ කාල සීමාව තුළ හිඟව පවතින බරතැබූ සාමාන්‍ය කොටස් සංඛ්‍යාවෙන් බෙදීමෙන් ඊ පී එස් ගණනය කරනු ලැබේ.

4. වාර්තා කරන දිනට නිකුත් කරන ලද නමුත් බලාත්මක නොවන නව ගිණුම්කරණ ප්‍රමිතීන්

2019 මාර්තු **31** වාර්තාකරණ කාලය සඳහා අනිවාර්ය නොවන සහ සමූහය විසින් කලින් සම්මත කර නොගත් ඇතැම් නව ගිණුම්කරණ ප්‍රමිතීන් සහ අර්ථකථන ප්‍රකාශයට පත් කර ඇත. මෙම නව ප්‍රමිතීන් සහ අර්ථ නිරූපණයන්හි බලපෑම පිළිබඳ සමූහයේ තක්සේරුව පහත දැක්වේ.

i). එස් එල් එෆ් ආර් එස් (SLFRS) 16 කල්බදු

එස් එල් එෆ් ආර් එස් 16 මූලික වශයෙන් බදුකරුවන් විසින් සිදුකරන ගිණුම්කරණයට බලපානු ඇති අතර ශේෂ පත්‍රයේ සියලුම කල්බදු පාහේ පිළිගැනීමට හේතු වනු ඇත. ප්‍රමිතිය මඟින් මෙහෙයුම් සහ මූල්‍ය කල්බදු අතර පවතින වෙනස ඉවත් කරන අතර වත්කම් හඳුනාගැනීම (බදු අයිතමය භාවිතා කිරීමේ අයිතිය) මෙන්ම සියලුම කල්බදු කොන්ත්‍රාත්තු සඳහා කුලී ගෙවීමට මූල්‍ය වගකීමක් හඳුනාගැනීම අවශ්‍ය වේ. කෙටි කාලීන සහ අඩු වටිනාකමින් යුත් කල්බදු සඳහා විකල්ප නිදහස් කිරීමක් පවතී.

ලාභ හෝ අලාභ ප්‍රකාශය, බදු දීමේ මුල් වසරවල සාමාන්‍යයෙන් වැඩි වන සහ පසු වසරවල අඩු වන මුළු වියදමට ද බලපානු ඇත. අතිරේක වශයෙන්, මෙහෙයුම් වියදම් පොලී සහ ක්ෂයවීම්වලින් ප්‍රතිස්ථාපනය කරනු ඇත, එබැවින් ඊ බී අයි ටී ඩී ඒ (EBITDA) වැනි ප්‍රධාන මිනික වෙනස් වනු ඇත.

කල්බදු වගකීමේ ප්‍රධාන කොටස සඳහා මුදල් ගෙවීම් මූල්‍යකරණ ක්‍රියාකාරකම් තුළ වර්ගීකරණය කර ඇති බැවින් මෙහෙයුම් මුදල් ප්‍රවාහයන් වැඩි වනු ඇත. මෙහෙයුම් මුදල් ප්‍රවාහ ලෙස අකණ්ඩව ඉදිරිපත් කළ හැක්කේ පොළිය පිළිබිඹු කරන ගෙවීම්වල කොටස පමණි.

බදුකරුවන් විසින් සිදුකරන ගිණුම්කරණය සැලකිය යුතු ලෙස වෙනස් නොවේ. කල්බදු නිර්වචනය පිළිබඳ නව මග පෙන්වීමේ ප්‍රතිඵලයක් ලෙස යම් යම් වෙනස්කම් ඇති විය හැක. එස් එල් එෆ් ආර් එස් 16 යටතේ, ගිවිසුමක් යනු, හෝ ඊට අඩංගු වන්නේ ගිවිසුම සලකා බැලීම සඳහා හුවමාරු කාල සීමාවක් සඳහා හඳුනාගත් වත්කමක් භාවිතා කිරීම පාලනය කිරීමට අයිතිය ප්‍රකාශ කරන කල් බදු දීමනාව කි.

සමූහය 2019 ජනවාරි 01 හෝ ඉන් පසුව ආරම්භ වන මූල්‍ය කාලසීමාවන් සඳහා බලපැවැත්වෙන එස් එල් එෆ් ආර් එස් 16 භාවිතා කිරීමෙන් ඉන්ධන කෙරෙහි ඇති වෙන බලපෑම තක්සේරු කිරීමේ ක්‍රියාවලියක යෙදී සිටී.

ii). එල් කේ ඒ එස් (LKAS) 28 හි සංශෝධන, 'ආශ්‍රිත සහ හවුල් ව්‍යාපාරවල ආයෝජන', ආශ්‍රිත සහ හවුල් ව්‍යාපාර සඳහා දිගුකාලීන අවශ්‍යතා

එස් එල් එෆ් ආර් එස් (SLFRS) 9 භාවිතා කර කොටස් ක්‍රමය භාවිතා නොකරන ආශ්‍රිත හෝ හවුල් ව්‍යාපාරයක දිගුකාලීන අවශ්‍යතා සඳහා සමාගම් වගවන බව මෙම සංශෝධන පැහැදිලි කරයි.

මෙම සංශෝධනය 2019 ජනවාරි 01 වැනිදා හෝ ඉන් පසුව ආරම්භ වන වාර්ෂික කාලසීමාවන් සඳහා බලාත්මක වේ.

iii). එස් එල් එෆ් ආර් එස් (SLFRS) 9 මූල්‍ය මෙවලම්වලට සංශෝධන - සෘණ වන්දි සහිත පෙරගෙවුම් ලක්ෂණ

මූල්‍ය වගකීමක් හඳුනාගත නොහැකි වන පරිදි වෙනස් කරන ලද ක්‍රමක්ෂ කළ පිරිවැයකින් මනිනු ලබන විට ලැබීමක් හෝ පාඩුවක් ලාභ හෝ අලාභය තුළ වහාම හඳුනාගත යුතු බව මෙම සංශෝධනය මඟින් තහවුරු කරයි.

ලාභය හෝ අලාභය ගණනය කරනු ලබන්නේ ආරම්භයේදී ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් සහ ආරම්භයේදී බලපැවැත්වුන පොලී අනුපාතිකයෙන් වට්ටම් කරන ලද විකරණය කල මුදල් ප්‍රවාහයන් අතර වෙනස ලෙසිනි. මෙයින් අදහස් කරන්නේ එල් කේ ඒ එස් 39 වෙතින් ප්‍රායෝගික වෙනසක් විය හැකි මෙවලමේ ඉතිරි ආයු කාලය පුරා වෙනස පැතිරවිය නොහැකි බවයි.

මෙම සංශෝධනය 2019 ජනවාරි 01 හෝ ඊට පසුව ආරම්භ වන වාර්ෂික කාලසීමාවන් සඳහා බලාත්මක වේ.

iv).අයි එෆ් ආර් අයි සී (IFRIC) 23, 'ආදායම් බදු පිරියම පිළිබඳ අවිනිශ්චිතතාව'

ආදායම් බදු පිරියම සම්බන්ධයෙන් අවිනිශ්චිතතාවයක් පවතින විට එල් කේ ඒ එස් 12 'ආදායම් බදු' හඳුනාගැනීමේ සහ මිනුම් අවශ්‍යතා අදාළ වන ආකාරය මෙම අයි එෆ් ආර් අයි සී පැහැදිලි කරයි.

අවිනිශ්චිත බදු පිරියම යනු බදු අධිකාරිය විසින් එම පිරියම පිළිගනු ලබන්නේද යන්න පිළිබඳව අවිනිශ්චිතතාවයක් පවතින ආයතනයක් විසින් යොදන ඕනෑම බදු පිරියමකි. නිදසුනක් වශයෙන්, නිශ්චිත වියදමක් සඳහා අඩු කිරීමක් ඉල්ලා සිටීමට හෝ බදු වාර්තාවක නිශ්චිත ආදායම් අයිතමයක් ඇතුළත් නොකිරීමට තීරණයක් බදු නීතිය යටතේ පිළිගැනීම අවිනිශ්චිත නම් එය අවිනිශ්චිත බදු පිරියම කි.

බදු අය කළ හැකි ලාභය හෝ අලාභය, වත්කම් සහ වගකීම්වල බදු පදනම්, බදු පාඩු සහ බැර සහ බදු අනුපාත ඇතුළුව අයිතමයක සැලකීම සම්බන්ධයෙන් අවිනිශ්චිතතාවයක් පවතින ආදායම් බදු ගිණුම්කරණයේ සියලුම අංශ සඳහා අයි එෆ් ආර් අයි සී 23 අදාළ වේ.

මෙම සංශෝධනය 2019 ජනවාරි 01 හෝ ඊට පසුව ආරම්භ වන වාර්ෂික කාලසීමාවන් සඳහා බලාත්මක වේ.

v). 2015-2017 වාර්ෂික වැඩිදියුණු කිරීම්

මෙම සංශෝධනවලට පහත ප්‍රමිතීන්වල සුළු වෙනස්කම් ඇතුළත් වේ.

I. එස් එල් එෆ් ආර් එස් (SLFRS) 3, 'ව්‍යාපාර සංයෝජන' - සමාගමක් ව්‍යාපාරයේ පාලනය ලබා ගන්නා විට හවුල් සහයෝගීතාව සඳහා කලින් තිබූ අවශ්‍යතා නැවත මැන බලයි.

II. එස් එල් එෆ් ආර් එස් (SLFRS) 11, 'හවුල් විධිවිධාන' - සමාගමක් ව්‍යාපාරයේ හවුල් පාලනයක් ලබා ගන්නා විට හවුල් මෙහෙයුමක් සඳහා කලින් දැරූ උනන්දුව නැවත මනින්නේ නැත.

III. එල් කේ ඒ එස් (LKAS) 12, 'ආදායම් බදු' - ලාභාංශ ගෙවීම්වල සියලුම ආදායම් බදු ප්‍රතිවිපාක සඳහා සමාගමක් එකම ආකාරයකින් වග වේ.

IV. එල් කේ ඒ එස් (LKAS) 23, 'ණය ගැනීමේ පිරිවැය' - වත්කම් එහි අපේක්ෂිත භාවිතයට හෝ විකිණීමට සූදානම් වූ විට වත්කමක් සංවර්ධනය කිරීම සඳහා මුලින් කරන ලද ඕනෑම ණය ගැනීමක් සාමාන්‍ය ණය ගැනීම්වල කොටසක් ලෙස සමාගමක් සලකයි.

මෙම සංශෝධනය 2019 ජනවාරි 1 හෝ ඊට පසුව ආරම්භ වන වාර්ෂික කාලසීමාවන් සඳහා බලාත්මක වේ.

vi). එල් කේ ඒ එස් (LKAS) 19 හි සංශෝධන, 'සැලසුම් සංශෝධනය, කප්පාදු කිරීම හෝ පියවීම මත සේවක ප්‍රතිලාභ'

පහතින් දැක්වෙන මෙම සංශෝධන සඳහා ආයතනයක් අවශ්‍ය වේ;
I. සැලසුම් සංශෝධනයකින්, කප්පාදුවකින් හෝ පියවීමකින් පසු ඉතිරි කාලය සඳහා වත්මන් සේවා පිරිවැය සහ ශුද්ධ පොළී තීරණය කිරීම සඳහා යාවත්කාලීන උපකල්පන භාවිතා කිරීම; හා

II. වත්කම් සීලිමේ බලපෑම හේතුවෙන් එම අතිරික්තය කලින් හඳුනා නොගත්තද, අතීත සේවා පිරිවැයේ කොටසක් ලෙස ලාභ හෝ අලාභ, හෝ පියවීමේදී ඇති වූ ලාභයක් හෝ පාඩුවක්, අතිරික්තයක යම් අඩුවීමක් හඳුනා ගැනීම.

vii). එස් එල් එෆ් ආර් එස් (SLFRS) 3 හි සංශෝධන - ව්‍යාපාරයක අර්ථ දැක්වීම

මෙම සංශෝධනය ව්‍යාපාරයක නිර්වචනය සංශෝධනය කරයි. අයි ඒ බී එස් (IABS) වෙත ලැබුණු ප්‍රතිපෝෂණවලට අනුව, වර්තමාන මාර්ගෝපදේශ යෙදීම සාමාන්‍යයෙන් ඉතා සංකීර්ණ යැයි සලකනු ලබන අතර, එය බොහෝ ගනුදෙනු ව්‍යාපාරික සංයෝජන ලෙස සුදුසුකම් ලැබීමට හේතු වේ.

මෙම සංශෝධනය 2019 ජනවාරි 1 හෝ ඊට පසුව ආරම්භ වන වාර්ෂික කාලසීමාවන් සඳහා බලාත්මක වේ.

ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම
මූල්‍ය ප්‍රකාශණයේ සටහන්

viii). ද්‍රව්‍යයේ නිර්වචනය මත එල් කේ ඒ එස් 1 සහ එල් කේ ඒ එස් 8 වෙත සංශෝධන

එල් කේ ඒ එස් 1 වෙත මෙම සංශෝධන, 'මූල්‍ය ප්‍රකාශන සහ ඉදිරිපත් කිරීම, එල් කේ ඒ එස් 8. ගිණුම්කරණ ප්‍රතිපත්ති' ගිණුම් ඇස්තමේන්තු සහ දෝෂ වල වෙනස්කම්, සහ අනෙකුත් එස් එල් එෆ් ආර් එස් වලට අනුරූප සංශෝධන.

I. මූල්‍ය වාර්තාකරණය සඳහා එස් එල් එෆ් ආර් එස් සහ සංකල්පීය රාමුව පුරා ද්‍රව්‍ය පිළිබඳ ස්ථාවර නිර්වචනයක් භාවිතා කිරීම
II. ද්‍රව්‍යයේ නිර්වචනය පැහැදිලි කිරීම පැහැදිලි කිරීම; හා
III. භෞතික නොවන තොරතුරු පිළිබඳ එල් කේ ඒ එස් 1 හි සමහර මාර්ගෝපදේශ ඇතුළත් කිරීම.

මෙම සංශෝධනය 2020 ජනවාරි 01 හෝ ඊට පසුව ආරම්භ වන වාර්ෂික කාලසීමාවන් සඳහා බලාත්මක වේ.

තවමත් එලදායි නොවන වෙනත් ප්‍රමිතීන් නොමැති අතර වත්මන් හෝ අනාගත වාර්තාකරණ කාල පරිච්ඡේදවල සහ අපේක්ෂා කළ හැකි අනාගත ගනුදෙනුවල දී ආයතනයට ද්‍රව්‍යමය බලපෑමක් ඇති කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

5. අකණ්ඩ ව්‍යාපාරයක් බවට උපකල්පනය කිරීමේ යෝග්‍ය බව

2019 මාර්තු 31 න් අවසන් වන වර්ෂයේදී සමාගම රු. 1,817,576,166/- ක පාඩුවක් දරන ලද අතර (ඊට පෙර වසරේදී පාඩුව රු. 1,352,439,253/- කි) එදින වන විට මුළු වත්කම් ඉක්මවා දැරූ වගකීම් ප්‍රමාණය රු. 6,234,978,109/- කි. (ඊට පෙර වසර සඳහා අගය රු. 4,5417,401,943/-). මෙම තත්වයන් මඟින් පෙන්නුම් කරන්නේ ප්‍රවර්තන (අකණ්ඩ) ව්‍යාපාරයක් ලෙස පැවතීමේ අවිනිශ්චිතභාවයයි.

කෙසේ නමුත් අනාගතයේ දී ධන මූල්‍ය ප්‍රවාහයක් මෙන්ම ලාභ උත්පාදනය කළ හැකි ක්‍රියාත්මක සැලැස්මක් සමාගම විසින් සකස්කර ඇති අතර එතෙක් දැරූ පාඩු පියවා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එම සැලැස්මේ ප්‍රගතිය සමාලෝචනය කරනු ඇත. සැලසුම්ගත ස්කාගාරය වෙනුවෙන් ආයෝජනය කිරීම සහ උක් වගාවන් බලාපොරොත්තු වූ සක්‍යතා මට්ටම වෙත ලඟා වීම ඔස්සේ නිෂ්පාදනය ඉහළ නැංවීම හා සම උත්පාදන බලාගාරයට අපේක්ෂිත නව ව්‍යාපෘතිය මඟින් අපේක්ෂිත ලාභ හා ධන මූල්‍ය ප්‍රවාහ අත්කර ගත හැකි වනු ඇත. සමාගමේ අඛණ්ඩභාවය පිළිබඳ තීරණය කිරීමේදී, සමාගම විසින් ලාභදායීතාවන් හා මූල්‍ය ප්‍රවාහ කෙරෙහි එමඟින් ඇති කරන බලපෑම පිළිබඳව ඇගයීමට ලක්කර ඇත. ඒ අනුව සමාගමට ප්‍රවර්තන ව්‍යාපාරයක් ලෙස ක්‍රියාත්මක විය හැකි බව අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය වේ.

	මාර්තු 31න් අවසන් වර්ෂය සඳහා,	**2019 (රු)**	2018 **(රු)**
6	**අයභාරය**		
	සීනි අලෙවිය	**799,977,800**	1,243,023,570
	ENA අලෙවිය	**1,223,650,000**	-
		2,023,627,800	1,243,023,570
7	**අනෙකුත් ආදායම්**		
	පිරිසිදු නොකළ සීනි අලෙවි කිරීමෙන් ලද ආදායම	**8,623,920**	10,735,666
	මොලැසස් අලෙවි කිරීමෙන් ලද ශුද්ධ ආදායම	**10,294,556**	5,397,533
	ගොවි ණය වලින් ලද පොළී ආදායම	**10,831,001**	25,188,403
	ජලය අලෙවි කිරීමෙන් ලද ආදායම	**1,942,502**	-
	සුන්බුන් අබලි ද්‍රව්‍ය අලෙවි කිරීමෙන් ලද ආදායම	**806,531**	49,801
	වෙනත් විවිධ ආදයම්	**26,450**	-
	ජෙව කොම්පෝස්ට් ශුද්ධ ආදායම	**32,52,960**	41,371,403
8	**ශුද්ධ මූල්‍ය ව්‍යදම්**		
8.1	**මූල්‍ය ආදායම්**		
	පොළී ආදායම් - ප්‍රති ආයෝජන හා ඉනිරි කිරීම්	**37,462**	30,210
		37,462	30,210
8.2	**මූල්‍ය ව්‍යදම්**		
	විවිධ ආයතන වෙතින් ණය සඳහා පොළිය		
	එල් ඕ එල් සී සමූහය පී එල් සී	**176,794,324**	101,460,220
	එල්ඕඑල්සී ෆැක්ටර්ස් සමාගම	**898,167,629**	532,703,871
	බ්‍රවින්ස් සහ සමාගම (පී.එල්.සී.)	**133,349,133**	111,632,714
	කොමර්ෂල් ලීසිං සහ මූල්‍ය සමාගම (පී.එල්.සී.)	**53,712,587**	49,581,017
	මහජන බැංකුව (පී.එල්.සී.)	**42,013,907**	170,882
	ලංකා බැංකුව (පී.එල්.සී.)	**1,973,006**	8,412,381
	සාක්‍යා කැපිටල් ප්‍රයිවට් ලිමිටඩ්	**287,499,996**	287,499,996
	කොමර්ෂල් ට්‍රස්ට් ටෙක්නොලොජීස් ප්‍රයිවට් ලිමිටඩ්	**123,500,004**	36,903,730
	සෙලාන් බැන්ක් පී එල් සී	**6,976,188**	-
	එල් ඕ එල් සී ෆිනෑන්ස් පී එල් සී	**16,127,761**	-
	වෙනත් පොළී		
	මූල්‍ය කල්බදු බැඳීම් මත පොලී	**39,319,971**	40,340,964
	බැංකු අයිරා මත පොළී	**24,095,254**	24,813,987
		1,803,529,762	1,193,489,552
	ශුද්ධ මූල්‍ය ආදායම්/ව්‍යදම්	**(1,803,492,300)**	(1,193,489,552)

	මාර්තු 31න් අවසන් වර්ෂය සඳහා,	**2019 (රු)**	2018**(රු)**
9	**බදුකරණයට පෙර පාඩුව**		
	පහත දැක්වෙන සියළු ව්‍යදම් අයකරන ලද්දව දක්වා ඇත		
	දේපළ පිරියත හා උපකරණ ක්ෂය වීම්	**251,874,884**	185,070,757
	අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය	**524,357**	340,297
	යටිතල පහසුකම් ක්ෂයවීම්	**33,877,450**	36,199,707
	ඉඩම් හා ගොඩනැගිලි භාවිතා කිරීමේ අයිතිය මත ක්‍රමක්ෂය	**9,800,000**	9,800,000
	පෞද්ගලික ව්‍යදම් (සටහන 9.1)	**474,022,724**	366,463,380
	බාහිර විගණකවරුන් සඳහා ව්‍යදම්	**275,000**	-
	ගොවි ණය මත හානිකරණය	**9,762,172**	-
9.1	**පෞද්ගලික ව්‍යදම්**		
	වැටුප් සහ වේතන	**237,686,816**	186,763,800
	නිශ්චිත දායකත්ව සැලසුම් ව්‍යදම් (ඊ පී එෆ්/ඊ ටී එෆ්)	**31,877,889**	27,627,383
	නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් ව්‍යදම් - විශ්‍රාම ප්‍රතිලාභ	**14,816,385**	14,308,725
	අනෙකුත් කාර්යමණ්ඩල ව්‍යදම්	**189,641,634**	137,763,471
		474,022,724	366,463,380
	සේවක සංඛ්‍යාව	**1,013**	924

	මාර්තු 31න් අවසන් වර්ෂය සඳහා,	2019 (රු)	2018 (රු)
10	**ආදායම් බදු වියදම්**		
	ජංගම බදු වියදම්		
	ප්‍රවර්තන වසරේ ලාභය මත ආදායම් බදු වියදම (සටහන 10.1)	-	4,589,788
		-	4,589,788
10.1	**ප්‍රවර්තන වසරේ ගිණුම්කරණ ලාභය සහ බදු සැසඳීම**		
	බදුකරණයට පෙර පාඩුව	**(1,814,145,920)**	(1,342,938,332)
	ව්‍යාපාර නොවන ආදායම	**(10,868,463)**	(25,218,613)
	ප්‍රතික්ෂේපිත මුළු වියදම්	**1,593,723,511**	283,438,855
	අනුමත මුළු අඩු කිරීම්	**(505,033,020)**	(524,492,439)
	බදු අලාභය	**(736,323,891)**	(1,609,210,529)
	ව්‍යාපාර නොවන ආදායම	**10,868,463**	25,218,613
	බදු අලාභ උපයෝජනය කිරීම	**(10,868,463)**	(8,826,514)
	බදු අය කළ හැකි ආදායම	-	16,392,098
	28% අනුපාතිකයට අනුව ආදායම් බදු	-	4,589,788
		-	4,589,788
10.2	**ඉදිරියට ගෙනා බදු අලාභය**	**6,268,247,845**	4,667,863,830
	වර්ෂය තුළ පැන නගින බදු අලාභය	**736,323,891**	1,609,210,529
	වර්ෂය තුළ බදු අලාභ උපයෝජනය කිරීම	**(10,868,463)**	(8,826,514)
	වර්ෂය අවසානයේ බදු අලාභය	**6,993,703,274**	6,268,247,845
10.3	**හඳුනා නොගත් විලම්භීත බදු වත්කම්**		
	පහත අයිතමයන් සම්බන්ධයෙන් විලම්භීත බදු වත්කම් හඳුනාගෙන නොමැත.		
	දේපළ පිරියත හා උපකරණ	**(1,261,033,131)**	(1,053,567,912)
	විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්	**50,727,388**	39,401,774
	බදු අලාභ	**6,993,703,274**	6,268,247,845
	අඩුකළ හැකි කාලීන හිඟයන්	**5,783,397,531**	5,254,081,707
	අදාල බදු අනුපාතිකය	**28%**	28%
	විලම්භීත බදු වත්කම්	**1,619,351,309**	1,471,142,878
		1,619,351,309	1,471,142,878

අඩුකළ හැකි කාලීන හිඟයන්, පවතින බදු නීති පද්ධතිය යටතේ කල් ඉකුත් නොවේ. මෙම අයිතමයන් යටතේ විලම්භීත බදු වත්කම් හඳුනාගෙන නොමැත. ඊට හේතුව අනාගත බදු අය කළ හැකි ලාභ ලැබීමට එරෙහිව සමාගමට ප්‍රතිලාභ උපයෝජනය කිරීමේ හැකියාවක් නොපවතින බැවිනි.

11 කොටසක පාඩුව

කොටසක පාඩුව ගණනය කර ඇත්තේ සමාගමේ කොටස් හිමියන් වෙත ආරෝපණය කළ හැකි වර්ෂයේ ශුද්ධ පාඩුව වර්ෂය තුළ නොපියවූ සාමාන්‍ය කොටස් සංඛ්‍යාවේ බර තැබූ සාමාන්‍ය අගයෙන් බෙදීමෙනි.

	2019	2018
වර්ෂය සඳහා පාඩුව (රුපියල්)	**1,814,145,920**	1,347,528,120
නිකුත්කළ සාමාන්‍ය කොටස්වල බර තැබූ සාමාන්‍ය අගය	**101,176,473**	101,176,473
කොටසක පාඩුව (රුපියල්)	**17.93**	13.32

12 දේපළ, පිරියත හා උපකරණ

විියදම	2017 අප්‍රේල් 01 දිනට ශේෂය(රු)	එකතුකිරීම් (රු)	2018 මාර්තු 31 දිනට ශේෂය (රු)	2018 අප්‍රේල් 1 දිනට ශේෂය (රු)	එකතුකිරීම් (රු)	බැහැර කිරීම් (රු)	2019 මාර්තු 31 දිනට ශේෂය (රු)
සිත්නක්කර							
ගොඩනැගිලි	34,793,703	136,279,418	171,073,121	171,073,121	24,101,236	-	**195,174,357**
ස්ථාවර ඉඩම් සංවර්ධන පිරිවැය	63,348,553	-	63,348,553	63,348,553	-	-	**63,348,553**
කර්මාන්තශාලා පිරියත හා යන්ත්‍රෝපකරණ	878,429,652	-	878,429,652	878,429,652	24,389,268	-	**902,818,920**
යන්ත්‍රෝපකරණ බලඇණිය	17,119,925	-	17,119,925	17,119,925	-	-	**17,119,925**
ජල පිරිපහදු ඒකකය	5,426,456	-	5,426,456	5,426,456	1,684,030	-	**7,110,486**
ගෘහභාණ්ඩ සහ මෙවලම්	6,232,781	688,129	6,920,910	6,920,910	1,375,394	-	**8,296,304**
කාර්යාලීය උපකරණ	2,997,805	6,903,875	9,901,680	9,901,680	2,055,743	-	**11,957,423**
කෘෂිකාර්මික ආම්පන්න	27,096,969	7,684,688	34,781,657	34,781,657	9,902,520	-	**44,684,177**
නිල නිවාස උපකරණ	7,217,822	863,180	8,081,002	8,081,002	342,778	-	**8,423,780**
කර්මාන්තශාලා උපකරණ	54,590,592	24,132,536	78,723,128	78,723,128	7,939,038	-	**86,662,167**
ට්‍රැක්ටර සහ ට්ලෙර්	152,517,026	2,117,867	154,634,893	154,634,893	794,680	-	**155,429,573**
උක් අස්වනු නෙළන යන්ත්‍රය	2,060,000	-	2,060,000	2,060,000	-	-	**2,060,000**
මෝටර් බයිසිකල්	319,480	-	319,480	319,480	-	-	**319,480**
පරිගණක උපාංග	8,803,471	611,998	9,415,469	9,415,469	430,040	-	**9,845,509**
ජංගම දුරකථන	750,060	565,638	1,315,698	1,315,698	129,000	-	**1,444,698**
ජී.පී.එස්. උපකරණ	2,104,500	-	2,104,500	2,104,500	-	-	**2,104,500**
ඝ්කාගාරය හා යන්ත්‍රෝපකරණ	-	1,027,438,048	1,027,438,048	1,027,438,048	2,439,135		**1,029,877,183**
	1,263,808,795	1,207,285,378	2,471,094,173	2,471,094,173	75,582,863	-	**2,546,677,905**
බදුකර							
උක් අස්වනු නෙළන යන්ත්‍රය	159,036,027	-	159,036,027	159,036,027	-	-	**159,036,027**
මෝටර රථවාහන	18,299,336	32,000,000	50,299,336	50,299,336	-	-	**50,299,336**
ට්‍රැක්ටරය සමඟ අතුරුයත්ගෑමේ යන්ත්‍රය	27,048,757	-	27,048,757	27,048,757	-	-	**27,048,757**
ට්‍රැක්ටර	25,050,000	130,984,750	156,034,750	156,034,750	-	-	**156,034,750**
	229,434,120	162,984,750	392,418,870	392,418,870	-	-	**392,418,870**
ඉදිරියට ගෙන ආ පිරිවැය	1,493,242,915	1,370,270,128	2,863,513,042	2,863,513,042	75,582,863	-	**2,939,095,905**

සමුච්චිත ක්ෂය	2017 අප්‍රේල් 01 දිනට ශේෂය(රු)	වසර සඳහා ගාස්තු	2018 මාර්තු 31 දිනට ශේෂය (රු)	2018 අප්‍රේල් 1 දිනට ශේෂය (රු)	වසර සඳහා ගාස්තු	බැහැර කිරීම් (රු)	2019 මාර්තු 31 දිනට ශේෂය (රු)
සිත්නක්කර							
ගොඩනැගිලි	4,454,602	1,159,790	5,614,392	5,614,392	6,123,809	-	**11,738,201**
ස්ථාවර ඉඩම් සංවර්ධන පිරිවැය	8,446,473	2,111,618	10,5598,092	10,5598,092	2,111,618	-	**12,669,710**
කර්මාන්තශාලා පිරියත හා යන්ත්‍රෝපකරණ	275,834,607	73,202,471	349,037,079	349,037,079	74,456,490	-	**423,493,569**
යන්ත්‍රෝපකරණ බලඇණිය	14,638,127	827,266	15,465,393	15,465,393	827,266	-	**16,292,659**
ජල පිරිපහදු ඒකකය	1,773,939	452,205	2,226,143	2,226,143	463,899	-	**2,690,043**
ගෘහභාණ්ඩ සහ මෙවලම්	4,485,414	875,607	5,361,021	5,361,021	776,266	-	**6,137,287**
කාර්යාලීය උපකරණ	931,542	1,439,022	2,370,564	2,370,564	2,737,486	-	**5,108,044**
කෘෂිකාර්මික ආම්පන්න	8,344,256	3,821,173	12,165,429	12,165,429	5,197,445	-	**17,362,874**
නිල නිවාස උපකරණ	3,671,055	650,441	4,321,497	4,321,497	735,620	-	**5,057,117**
කර්මාන්තශාලා උපකරණ	16,122,886	7,909,678	24,032,564	24,032,564	10,335,802	-	**34,368,366**
ට්‍රැක්ටර සහ ට්ලෙර්	103,833,284	23,577,148	127,410,432	127,410,432	23,703,771	-	**151,114,202**
උක් අස්වනු නෙළන යන්ත්‍රය	2,060,000	-	2,060,000	2,060,000	-	-	**2,060,000**
මෝටර් බයිසිකල්	319,480	-	319,480	319,480	-	-	**319,480**
පරිගණක උපාංග	7,881,877	674,064	8,555,941	8,555,941	538,431	-	**9,094,372**
ජංගම දුරකථන	742,484	22,694	765,178	765,178	679,521	-	**1,444,698**
ජී.පී.එස්. උපකරණ	876,875	526,125	1,403,000	1,403,000	526,125	-	**1,929,125**
ඝ්කාගාරය, පිරියත හා යන්ත්‍රෝපකරණ	-	-	-	-	51,398,787	-	**51,398,787**
	454,416,902	117,249,303	571,666,205	571,666,205	180,612,327	-	**752,278,532**
කුල් බදු							
උක් අස්වනු නෙළන යන්ත්‍රය	61,624,764	31,622,842	93,247,606	93,247,606	31,622,842	-	**124,870,448**
මෝටර රථවාහන	13,920,187	5,267,634	19,187,821	19,187,821	9,111,514	-	**28,299,335**
ට්‍රැක්ටරය සමඟ අතුරුයත්ගෑමේ යන්ත්‍ර	11,490,847	4,925,186	16,416,034	16,416,034	4,925,186	-	**21,341,220**
ට්‍රැක්ටර	16,691,459	26,005,792	42,697,251	42,697,251	25,603,014	-	**68,300,266**
	103,727,258	67,821,454	171,548,712	171,548,712	71,262,557	-	**242,811,269**
සමුච්චිත ක්ෂය	558,144,160	185,070,757	743,214,918	743,214,918	251,874,884	-	**995,089,801**
ඉදිරියට ගෙන ආ ශේෂය	935,098,754		2,120,298,125	2,120,298,125		-	**1,944,006,104**

12.1 පූර්ණ වශයෙන් ක්ෂය වූ දේපළ, පිරියත හා යන්ත්‍රෝපකරණ

වාර්තා කරන දිනය වන විට උපයෝජනය කරනු ලබන නමුත් පූර්ණ වශයෙන් ක්ෂය වූ දේපළ, පිරියත හා යන්ත්‍රෝපකරණවල පිරිවැය පහත පරිදිය;

මාර්තු 31 දින වන විට	**2019 (රු)**	2018 (රු)
ජේ.ඕ.බී. යන්ත්‍ර	**13,810,861**	13,810,861
ගෘහභාණ්ඩ සහ මෙවලම්	**4,434,098**	3,845,071
කාර්යාලීය උපකරණ	**438,063**	433,563
ට්‍රැක්ටර සහ ට්ලෙර්	**156,671,526**	12,466,050
උක් අස්වනු නෙළන යන්ත්‍රය	**34,604,660**	34,604,660
මෝටර් බයිසිකල්	**319,480**	319,480
පරිගණක උපාංග	**8,383,496**	7,177,946
ජංගම දුරකථන	**1,444,698**	750,060
කෘෂිකාර්මික ආම්පන්න	**478,115**	246,097
නිල නිවාස උපකරණ	**2,450,978**	2,416,892
කර්මාන්තශාලා උපකරණ	**1,369,330**	1,014,403
ට්‍රැක්ටරය සමඟ අතුරුයත්ගෑමේ යන්ත්‍රය	**7,348,011**	7,348,011
මෝටර රථවාහන	**18,229,336**	5,228,800
	250,051,652	89,666,394

13 යටිතල පහසුකම් සංවර්ධනය

යටිතල පහසුකම් සංවර්ධනය යටතට සඵල ආයුකාලය වසර හතරක් වන මාර්ග, ජලාපවාහන කාණු, බෝක්කු හා අගල් සංවර්ධනය කිරීම් අයත් වේ.

	2018 අප්‍රේල් 01 දිනට ශේෂය (රු)	එකතු කිරීම්/මාරු කිරීම් (රු)	2019 මාර්තු 31 දිනට ශේෂය (රු)
පිරිවැය			
යටිතල පහසුකම් සංවර්ධනය	263,163,012	30,328,884	**293,491,896**
	263,163,012	30,328,884	**293,491,896**

	2018 අප්‍රේල් 01 දිනට ශේෂය (රු)	ක්‍රමක්ෂය	2019 මාර්තු 31 දිනට ශේෂය (රු)
සමුච්චිත ක්‍රමක්ෂය			
යටිතල පහසුකම් සංවර්ධනය	201,893,294	33,877,450	**235,770,744**
	201,893,294	33,877,450	**235,770,744**
ඉදිරියට ගෙන ආ ශේෂය	61,269,718		**57,721,152**

13.1 පූර්ණ වශයෙන් ක්ෂය වූ යටිතල පහසුකම් සංවර්ධන කටයුතු

මේ වන විටත් භාවිතයේ පවතින පූර්ණ වශයෙන් ක්ෂය වූ යටිතල පහසුකම් සංවර්ධන කටයුතු සඳහා වූ වියදම් පහත පරිදිය:

මාර්තු 31 දිනට	**2019 (රු)**	2018 (රු)
යටිතල පහසුකම් සංවර්ධනය	**137,239,884**	124,085,834
එකතුව	**137,239,834**	124,085,834

14 ඉඩම් හා ගොඩනැගිලි භාවිතයට ඇති අයිතිය

	2018 අප්‍රේල් 01 දිනට ශේෂය (රු)	එකතු කිරීම්/මාරු කිරීම් (රු)	2019 මාර්තු 31 දිනට ශේෂය (රු)
වියදම්			
ඉඩම් හා ගොඩනැගිලි භාවිතට ඇති අයිතිය	294,000,000	-	**294,000,000**
	294,000,000	-	**294,000,000**

	2018 අප්‍රේල් 01 දිනට ශේෂය (රු)	ක්‍රමක්ෂය	2019 මාර්තු 31 දිනට ශේෂය (රු)
සමුච්චිත ක්‍රමක්ෂය			
ඉඩම් හා ගොඩනැගිලි භාවිතට ඇති අයිතිය	(49,000,000)	(9,800,000)	**(58,800,000)**
	(49,000,000)	(9,800,000)	**(58,800,000)**
ඉදිරියට ගෙන ආ ශේෂය	245,000,000		**235,200,000**

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජය සමඟ එලඹුණු හවුල්කාර එකඟතාවට අනුව අම්පාර හිඟුරානේ කර්මාන්තශාලා සංකීර්ණයේ පිහිටි ඉඩම් හා ගොඩනැගිලිවල කල්බදු අයිතිය සමාගම අත්පත් කරගන්නා ලදී. මෙම ඉඩම් හා ගොඩනැගිලි වර්ෂ 2009 අගෝස්තු මස 28 දිනෙන් ඇරඹී වසර 30 ක කාලයක් සඳහා බදු දී ඇති අතර ඉන් ඉදිරියට ක්‍රමක්ෂය වේ.

මාර්තු 31 දිනට	**2019 (රු)**	2018 (රු)
15 අවසන් නොකළ ප්‍රාග්ධන වැඩ		
15.1 ස්කාගාරය ඉදි කිරීම		
වසර ආරම්භයේදී ශේෂය	-	915,454,669
දේපළ, පිරියන හා උපකරණ වලට මාරුකිරීම්	-	(915,454,669)
වසර අවසානයේ දී ශේෂය	-	-
15.2 හමන අළු පාලන පද්ධතිය / බලාගාර ඉදි කිරීම		
වසර ආරම්භයේදී ශේෂය	**11,002,668**	2,000,000
එකතු කිරීම්	**43,258,809**	9,002,668
වසර අවසානයේ දී ශේෂය	**54,261,477**	11,002,668
15.3 ගොඩනැගිලි		-
එකතු කිරීම්	**1,796,485**	-
වසර අවසානයේ දී ශේෂය	**1,796,485**	
15.4 ජල පිරිපහදු ඒකකය		
එකතු කිරීම්	**50,044,015**	-
වසර අවසානයේ දී ශේෂය	**50,044,015**	-
15.5 ඊ එන් ඒ ටැංකිය		
එකතු කිරීම්	**3,215,543**	-
වසර අවසානයේ දී ශේෂය	**3,215,543**	-
15.6 සියම්බලාන්ඩුව මිලදී ගැනීමේ මධ්‍යස්ථානය		
එකතු කිරීම්	**854,044**	-
වසර අවසානයේ දී ශේෂය	**854,044**	-
	110,171,565	**11,002,668**

16 අස්පෘශ්‍ය වත්කම්

	2018 අප්‍රේල් 01 දිනට ශේෂය (රු)	එකතු කිරීම් (රු)	2019 මාර්තු 31 දිනට ශේෂය (රු)
වියදම්	5,802,384	1,850,000	**7,652,384**
පරිගණක මෘදුකාංග	5,802,384	1,850,000	**7,652,384**

	2018 අප්‍රේල් 01 දිනට ශේෂය (රු)	ක්‍රමක්ෂය	2018 මාර්තු 31 දිනට ශේෂය (රු)
සමුච්චිත ක්‍රමක්ෂය			
පරිගණක මෘදුකාංග	(4,498,058)	(524,357)	**(5,022,415)**
	(4,498,058)	(524,357)	**(5,022,415)**
ඉදිරියට ගෙන ආ ශේෂය	1,304,326		**2,629,969**

16.1 පූර්ණ වශයෙන් ක්ෂය වූ අස්පෘශ්‍ය වත්කම්

වාර්තා කරන දිනය වන විට උපයෝජනය කරනු ලබන පූර්ණ වශයෙන් ක්ෂය වූ අස්පෘශ්‍ය වත්කම්වල පිරිවැය

මාර්තු 31 දිනට	**2019 (රු)**	2018 (රු)
පරිගණක මෘදුකාංග	**4,154,951**	4,154,951
එකතුව	**4,154,951**	4,154,951

	මාර්තු 31 දිනට	**2019 (රු)**	2018(රු)
17	ගොවීන්ට ලබා දුන් ණය	**485,648,710**	349,998,840
	අඩු කිරීම් - හානිකරණය	**(69,635,106)**	(59,872,934)
		416,013,604	290,125,906
	වසරක් සඳහා අදාළ වන ප්‍රමාණය	**287,704,611**	176,165,585
	වසරකට පසු අදාළ වන ප්‍රමාණය	**197,944,099**	173,833,255
	අඩු කිරීම් - හානිකරණය	**(69,635,106)**	(59,872,934)
		128,308,993	113,960,321
		416,013,604	290,125,906
18	**ජෛව විද්‍යාත්මක වත්කම්**		
	උක් පැල තවාන් හා වගාවන්	**14,508,709**	20,710,760
		14,508,709	**20,710,760**
19	**ඉන්වෙන්ට්‍රි**		
	අමුද්‍රව්‍ය	**22,243,501**	1,642,169
	නිමි භාණ්ඩ - සීනි	**66,203,200**	-
	- මොලැසස්	**314,470,138**	488,305,955
	- ඊ එන් ඒ	**413,220,915**	142,266,705
	ජෛව කොම්පෝස්ට්	**2,838,055**	-
	අමුද්‍රව්‍ය වාණිජ උක්	**4,344,950**	-
	අමතර කොටස් සහ පරිභෝජ්‍ය ද්‍රව්‍ය	**90,236,650**	87,060,538
		913,557,408	719,275,368
20	**අලෙවි කටයුතු සහ අනෙකුත් ලැබිය යුතු දෑ**		
	අලෙවියෙන් **ලැබිය යුතු දෑ (සටහන 20.1)**	**622,095**	1,273,382
	අනෙකුත් ලැබිය යුතු දෑ (සටහන 20.2)	**82,177,133**	121,550,626
		82,799,228	122,824,008
20.1	**වෙළෙඳාම තුළින් ලැබිය යුතු දෑ**		
	ලංකා සීනි (පෞද්ගලික) සමාගම - පැල්වත්ත	**-**	242,737
	ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය	**79,045**	79,045
	සේවක සුභසාධනය සහ මරණාධාර සමිතිය	**527,000**	951,600
	සීමාසහිත වටවල කිරි නිෂ්පාදන සමාගම	**16,050**	-
		622,095	1,273,382
20.2	**අනෙකුත් ලැබිය යුතු දෑ**		
	අත්තිකාරම්	**38,861,897**	97,363,634
	කළින් ගෙවීම්	**5,880,012**	4,331,593
	ගොවි ණය අයවීම් -පොහොර සහ රසායනික ද්‍රව්‍ය	**37,435,224**	16,855,871
	අය විය යුතු ජාතිය ගොඩනැගීමේ බදු	**-**	2,999,529
		82,177,133	121,550,626

	මාර්තු 31 දිනට,	2019 (රු)	2018 (රු)
21	**අනුබද්ධ පාර්ශ්වයන්ගෙන් අය විය යුතු ප්‍රමාණ**		
	ගල්ඔය වැව්ලි (පුද්ගලික) සමාගම	**15,545,850**	15,164,284
	අඩු කිරීම්: සම්බන්ධිත පාර්ශ්වයන්ගෙන් ලැබිය යුතු දෑ සඳහා හානිකරණය	**(12,392,179)**	(12,392,179)
		3,153,670	2,772,105
22	**මුදල් හා ඊට සමාන වෙනත් දෑ**		
22.1	**නිතකර මුදල් හා ඊට සමාන වෙනත් දෑ**		
	අතැති මුදල්	**578,913**	454,492
	බැංකු තැන්පතු	**28,018,436**	5,054,538
		28,597,348	5,509,030
22.2	**අනිතකර මුදල් හා ඊට සමාන වෙනත් දෑ**		
	බැංකු අයිරා	**(237,851,553)**	(166,507,964)
		(209,254,205)	(160,998,935)

23	**ප්‍රකාශිත ප්‍රාග්ධනය**			
	නිකුත් කළ හා ගෙවා නිම කළ	**හිමිකම් %**	**කොටස් ගණන**	**වටිනාකම**
	සාමාන්‍ය කොටස්			
	ශ්‍රී ලංකා රජය	51%	51,600,000	516,000,000
	ලංකා ඔරික්ස් ලීසිං සමාගම (පී.එල්.සී.)	27%	27,267,058	272,670,580
	බ්‍රවුන්ස් සහ සමාගම (පී.එල්.සී.)	22%	22,309,412	223,094,120
	අනෙකුත් කොටස් හිමියන්	0%	3	30
	එකතුව		101,176,473	1,011,764,730

සමාගම වරින් වර නිකුත් කරන ලාභාංශ ලැබීම සඳහා මෙන්ම සමාගම විසින් පවත්වනු ලබන රැස්වීම් වලදී එක් කොටස් හිමිකමක් වෙනුවෙන් එක් ඡන්දයක් භාවිතා කිරීම සඳහා සමාගමේ සාමාන්‍ය කොටස් හිමිකරුවන් සුදුසුකම් ලබති.

	2019 මාර්තු 31 දිනට,	**2019 (රු)**	2018 (රු)
24	**විශ්‍රාම පාරිතෝෂික බැඳීම්**		
	නොගෙවූ පාරිතෝෂිකවල වත්මන් වටිනාකම	**50,727,388**	39,401,774
	බැඳීම්වල මුළු වර්තමාන වටිනාකම	**50,727,388**	39,401,774
	නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්වල වත්මන් අගයේ වෙනස්වීම		
	වර්ෂය ආරම්භයේ දී ශේෂය	**39,401,774**	27,328,453
	වර්තමාන සේවා පිරිවැය	**7,051,943**	6,118,177
	පොළී පිරිවැය	**4,334,195**	3,279,414
	ආයුගණක (ලැබීම්)/ පාඩු	**3,430,246**	4,911,133
	ගෙවූ ප්‍රතිලාභ	**(3,490,770)**	(2,235,404)
	වර්ෂාවසාන ශේෂය	**50,727,388**	39,401,774
	ලාභාලාභ ප්‍රකාශය මඟින් හඳුනාගත් වියදම්		
	වර්තමාන සේවා පිරිවැය	**7,051,943**	6,118,177
	බැඳීම් මත පොළිය	**4,334,195**	3,279,414
		11,386,138	9,397,592
	වෙනත් විස්තීර්ණ ආදායම්වල හඳුනාගත් වියදම්		
	ආයුගණක (ලැබීම්)/ පාඩු	**3,430,246**	4,911,133
		3,430,246	4,911,133

වෘත්තීය සුදුසුකම් ලත් ආයුගණකවරුන් වන ඇක්චූරියල් ඇන්ඩ් මැනේජ්මන්ට් කන්සල්ටන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් ප්‍රක්ෂිප්ත ඒකක ණය ක්‍රමය යටතේ 2019 මාර්තු 31 දිනට පාරිතෝෂික වගකීම්වල ආයුගණක වටිනාකම ගණනය කරන ලදී. 2019 මාර්තු 31 දිනට සමාගමේ ගිණුම්කරණ විධිවිධාන අවශ්‍යතා මේ වාර්තාවේ නිර්දේශය මත තීරණය කර ඇත. ඉහත දැක්වෙන සංඛ්‍යාංකී අනුව පහත සඳහන් මූලික උපකල්පන වෙත එළඹුනි.

මාර්තු 31 දිනට,	**2019**	2018
(i) වට්ටම් අනුපාතිකය	11%	11%
(ii) වැටුප් වර්ධක අනුපාතිකය		
විධායක කාර්ය මණ්ඩලය	9%	9%
විධායක නොවන කාර්ය මණ්ඩලය	9%	9%
(iii) විශ්‍රාම යන වයස	අවුරුදු 55	අවුරුදු 55

(සටහන් අංක 24 තවදුරටත්),

සංවේදිතා විශ්ලේෂණය

වෙනස් වූ විචල්‍යය (අනෙකුත් සියළුම උපකල්පන නොවෙනස්ව පවතී)	නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් වල වර්තමාන අගය (රු)
වට්ටම් අනුපාතිකය සියයට එකකින් (+1%) ඉහළ යාම	49,072,566
වට්ටම් අනුපාතිකය සියයට එකකින් (-1%) පහළ යාම	52,526,006
වැටුප් වැඩිවීමේ අනුපාතිකය සියයට එකකින් (+1%) ඉහළ යාම	52,661,894
වැටුප් වැඩිවීමේ අනුපාතිකය සියයට එකකින් (-1%) පහළ යාම	48,918,507

	මාර්තු 31 දිනට,	**2019** (රු)	2018 (රු)
25	**පොළී සහිත ණය හා ණය ගැනීම්**		
	අනුබද්ධ පාර්ශ්වයන්ගෙන් (සටහන 25.1)	**6,845,817,373**	6,309,008,499
	බැංකු වලින් (සටහන 25.2)	**257,600,000**	185,000,032
	ගොවි ණය ප්‍රතිපූරණය (සටහන 25.3)	**297,396,844**	57,052,770
		7,400,814,217	6,551,061,302
	පොළී සහිත ණය හා ණය ගැනීම් වල වෙනස්වීම් අනුබද්ධ පාර්ශ්වයන් වෙතින්		
	වර්ෂය ආරම්භයේදී පැවති ශේෂය	**6,309,008,499**	5,218,075,136
	වර්ෂය තුළදී ණය ලබා ගැනීම්	**1,059,000,000**	1,335,919,008
	වර්ෂය තුළදී ආපසු ගෙවීම්	**(522,191,126)**	(244,985,645)
	වර්ෂාවසාන ශේෂය	**6,845,817,373**	6,309,008,499
	අනුබද්ධ නොවන පාර්ශ්වයන් වෙතින්		
	වර්ෂය ආරම්භයේදී පැවති ශේෂය	**185,000,032**	94,335,576
	වර්ෂය තුළදී ණය ලබා ගැනීම්	**200,000,000**	150,000,000
	වර්ෂය තුළදී ආපසු ගෙවීම්	**(127,400,032)**	(59, 355,544)
	වර්ෂාවසාන ශේෂය	**257,600,000**	185,000,032
	ගොවි ණය ප්‍රතිපූරණය		
	වර්ෂය ආරම්භයේදී පැවති ශේෂය	**57,052,770**	24,119,700
	වර්ෂය තුළදී ණය ලබා ගැනීම්	**280,320,000**	50,927,371
	වර්ෂය තුළදී ආපසු ගෙවීම්	**(39,975,927)**	(17,994,300)
	වර්ෂාවසාන ශේෂය	**297,396,844**	57,052,770

ඊලඟ පිටුවෙන් (සටහන 25.1) ආපසු ගෙවීම් කාලසීමාව, ණය සැළසුම් ක්‍රමය, පොළී අනුපාත හා සුරැකුම් ප්‍රතිඥා සාකච්ඡා කර ඇත.

	මාර්තු 31 දිනට,	**2019** (රු)	2018 (රු)
26	මූල්‍ය කල්බදු බැඳීම්		
	වර්ෂය ආරම්භයේදී ශේෂය	**322,673,213**	188,200,097
	වර්ෂය තුළදී ලබා ගත් කල්බදු	**-**	210,823,201
		322,673,213	399,023,298
	ආපසු ගෙවීම්වල එකතුව	**(79,511,724)**	(76,350,085)
		243,161,489	322,673,213
	අඩුකලා: විලම්භිත පොළිය	**(73,611,646)**	(114,616,245)
	ශුද්ධ කල්බදු බැඳීම්	**169,549,843**	208,056,968
	වසරක් තුළදී ගෙවිය යුතු ප්‍රමාණය	**39,294,950**	37,943,951
	වසරකට පසු ගෙවිය යුතු මුදල	**130,254,893**	170,113,017
		169,549,843	208,056,968
27	වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ		
	වෙළඳ කටයුතු සම්බන්ධයෙන් ගෙවිය යුතු දෑ	**68,188,122**	87,095,426
	අනෙකුත් ගෙවිය යුතු දෑ (සටහන 27.1)	**192,506,408**	81,400,736
		260,694,520	168,496,162
27.1	**අනෙකුත් ගෙවිය යුතු දෑ**		
	අනෙකුත් ගෙවිය යුතු දෑ	**28,672,600**	44,490,548
	ගෙවිය යුතු පොළිය	**8,408,221**	553,239
	උපචිත වියදම්	**143,280,054**	36,107,278
	එකතු කළ අගය සඳහා ගෙවිය යුතු බදු	**988,850**	-
	ගෙවිය යුතු ජාතිය ගොඩනැගීමේ බදු	**8,694,512**	249,671
	ගෙවිය යුතු ඊ එස් සී	**2,462,171**	-
		192,506,408	81,400,736
28	**අනුබද්ධ පාර්ශ්වයන්ගෙන් ලැබිය යුතු දෑ**		
	එල් ඕ එල් සී සමූහය පීඑල්සී	**194,124,508**	123,844,492
	බ්‍රවුන්ස් සහ සමාගම පීඑල්සී	**354,79,133**	346,445,000
	කොමර්ෂල් ලීසිං සහ මූල්‍ය සමාගම පීඑල්සී	**7,733,595**	220,370
	එල් ඕ එල් සී ෆිනැන්ස් පී එල් සී	**10,03,750**	10,677,973
	එල් ඕ එල් සී ෆැක්ටර්ස් ලිමිටඩ්	**1,137,143,556**	386,486,032
	සෙලාන් බැංකුව පීඑල්සී	**-**	2,012,498
	ඇග්ස්ටාර් පීඑල්සී	**-**	16,862,500
	කොමර්ෂල් ට්‍රස්ට් ටෙක්නොලොජිස් ප්‍රයිවට් ලිමිටඩ්	**113,208,337**	-
	සක්‍යා කැපිටල් ප්‍රයිවට් ලිමිටඩ්	**119,791,665**	-
		1,936,830,544	886,548,864

25.1 අනුබද්ධ පාර්ශවයන්ගෙන්

	පහසුකම් වර්ගය අනුව ආපසු ගෙවීම්		පොලී අනුපාතිකය	සුරැකුම් ප්‍රතිඥා	**2019 මාර්තු 31**	2018 මාර්තු 31
					රුපියල්	රුපියල්
එල් ඕ එල් සී සමූහය පීඑල්සී	අදාළ නොවේ	කෙටි කාලීන ණය	18%	අදාළ නොවේ	**233,683,917**	233,683,917
එල් ඕ එල් සී සමූහය පීඑල්සී	අදාළ නොවේ	කෙටි කාලීන ණය	15%-21%	අදාළ නොවේ	**692,000,000**	400,000,000
බ්‍රවුන්ස් සහ සමාගම පීඑල්සී	අදාළ නොවේ	කෙටි කාලීන ණය	18%	අදාළ නොවේ	**335,877,555**	335,877,555
එල් ඕ එල් සී ෆැක්ටර්ස් ලිමිටඩ	අදාළ නොවේ	ෆැක්ටරින් පහසුකම්	22.5%	අදාළ නොවේ	**1,786,743,855**	1,786,743,855
එල් ඕ එල් සී ෆැක්ටර්ස් ලිමිටඩ	අදාළ නොවේ	කෙටි කාලීන ණය	15%-18%	අදාළ නොවේ	**930,519,832**	935,106,840
කොමර්ෂල් ලීසිං සහ මූල්‍ය සමාගම පීඑල්සී	අදාළ නොවේ	කෙටි කාලීන ණය	16%-19%	අදාළ නොවේ	**200,000,000**	200,000,000
කොමර්ෂල් ලීසිං සහ මූල්‍ය සමාගම පීඑල්සී	මාස 36	කාලීන ණය	23%	අදාළ නොවේ	**29,629,869**	41,648,653
කොමර්ෂල් ලීසිං සහ මූල්‍ය සමාගම පීඑල්සී	මාස 36	කාලීන ණය	19%	අදාළ නොවේ	**26,694,024**	44,615,679
සක්‍යා කැපිටල් ප්‍රයිවට් ලිමිටඩ්	මාස 36	කෙටි කාලීන ණය	19%-19.5%	අදාළ නොවේ	**1,500,000,000**	1,500,000,000
සෙලාන් බැංකුව පීඑල්සී	මාස 12	කෙටි කාලීන ණය	13.5%-14.5%	අදාළ නොවේ	**389,000,000**	100,000,000
කොමර්ෂල් ට්‍රස්ට් ටෙක්නොලොජිස්	මාස 24	කෙටි කාලීන ණය	19%	අදාළ නොවේ	**650,000,000**	650,000,000
එල් ඕ එල් සී ෆිනෑන්ස් පී එල් සී	මාස 60	කෙටි කාලීන ණය	21%	අදාළ නොවේ	**71,668,321**	81,332,000
					6,845,817,373	6,309,008,499

25.2 අනුබද්ධ නොවන පාර්ශ්වයන්ගෙන්

මහජන බැංකුව		කෙටි කාලීන ණය	වසරකට ඒ ඩබ් පී එල් ආර් +2.5%	බ්‍රවුන්ස් සහ සමාගම වෙතින් සුරැකුම්	**150,000,000**	150,000,000
මහජන බැංකුව	මාස 3	කාලීන ණය	වසරකට ඒ ඩබ් පී එල් ආර් +2.5%	බ්‍රවුන්ස් සහ සමාගම වෙතින් සුරැකුම්	**107,600,000**	-
ලංකා බැංකුව				බ්‍රවුන්ස් සහ සමාගම පීඑල්සී සහ එල් ඕ එල් සී සමූහය පීඑල්සී වෙතින් සුරැකුම්	-	35,000,032
	මාස 60	කාලීන ණය	වසරකට ඒ ඩබ් පී එල් ආර් +2.5%			
					257,600,000	185,000,032

25.3 ගොවි ණය ප්‍රතිපූරණය

ලංකා බැංකුව	මාස 36	කෙටි කාලීන ණය	6.5%-10%	අවබෝධතා ගිවිසුම	**17,076,844**	57,052,771
					17,076,844	57,052,771
එච් එන් බී	මාස 12	කෙටි කාලීන ණය	6.5%	අවබෝධතා ගිවිසුම	**280,320,000**	-
					280,320,000	-
				එකතුව	**7,400,814,217**	6,551,061,302
				වසරක් ඇතුළත ගෙවිය යුතු ප්‍රමාණය	**3,643,102,170**	2,848,358,129
				වසරකට පසු වසරකට පසු ගෙවිය යුතු ප්‍රමාණය	**3,757,712,047**	3,702,703,173
					7,400,81,217	6,551,061,302

29 අනුබද්ධ පාර්ශ්වයන් පිළිබඳ අනාවරණ

(i). මුල් හා අවසාන පාලක පාර්ශ්වයන්

2019 මාර්තු 31 දින වන විට සාමාන්‍ය කොටස් වලින් 51% ක් අයිති සමාගමේ ප්‍රධාන කොටස් හිමිකරු ශ්‍රී ලංකා රජය වේ.
මෙම සමාගම 2019 මාර්තු 31 දින වන විට කොටස් වලින් 26.95% ක් අයිති ලංකා ඔරික්ස් ලීසිං සමාගම (පී.එල්.සී.) සහ කොටස් වලින් 22.05% ක් අයිති බ්‍රවුන්ස් සහ සමාගම යන සමාගම්වල හවුල්කාර සමාගමකි.

(ii). ප්‍රධාන කළමනාකරණ පිරිස් සමඟ ගනුදෙනු

සෘජුව හෝ වක්‍රව සමාගමේ හා අනු සමාගම්වල සැළසුම් කටයුතු කිරීම, යොමු කිරීම හා පාලනය යනාදී කාර්යයන් සම්බන්ධයෙන් අධිකාරීත්වය හා වගකීම් දරන සමාගමේ අධ්‍යක්ෂ මඩුල්ල, ප්‍රධාන කළමනාකරණ පිරිසට අයත් වේ.

(iii). අධ්‍යක්ෂ වරුන්ට ණය ලබා දීම

සමාගමේ අධ්‍යක්ෂ වරුන්ට ණය ලබා දී නොමැත.

(iv). අනුබද්ධ සමාගම් සමඟ ගනුදෙනු

සමාගම සිය අනුබද්ධ සමාගම් සමූහය සමඟ අනුබද්ධ පාර්ශ්ව සබඳතාවක් පවත්වයි. 2019 මාර්තු 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා අනුබද්ධ පාර්ශ්වයන් සමඟ පහතින් දැක්වෙන ගනුදෙනු සිදු කරන ලදී.

30 අනුබද්ධ පාර්ශ්ව පිළිබඳ අනාවරණ;

සමාගමේ නම	සබඳතාව	ගනුදෙනුවේ ස්වභාවය	අන්තර්ගත ප්‍රමාණය	**2019 ව/ 2019න් ශේෂය**	2018ව/ 2018න් ශේෂය
ගල්ඔය (පුද්ගලික) සමාගම	පාලක සමාගම	බදු ආදායම	-	**(3,153,670)**	(2,772,105)
		වියදම් ප්‍රතිපූරණය කිරීම	**(381,566)**		
	අනුබද්ධ	ණය මත පොළී පිරිවැය	**133,349,133**	**690,671,688**	682,322,555
බ්‍රවුන්ස් සහ සමාගම (පී.එල්.සී.)	සමාගම	ණය සඳහා ගෙවූ පොළිය	**(125,000,000)**		
එල්.ඕ.එල්.සී සමූහය (පී.එල්.සී.)	අනුබද්ධ	පොළී පිරිවැය	**176,794,324**	**1,119,808,425**	757,528,409
	සමාගම	ගෙවූ පොළිය	**(106,514,308)**		
		ලබා ගත් ණය	**412,000,000**		
		ණය ආපසු ගෙවීම්	**(120,000,000)**		
කොමර්ෂල් ලීසිං සහ මූල්‍ය සමාගම	අනුබද්ධ	පොළී පිරිවැය	**53,712,587**	**264,057,488**	286,484,702
(පී.එල්.සී.)	සමාගම	කල්බදු පොළිය	**4,147,547**		
		ගෙවූ පොළිය	**(45,978,992)**		
		ගෙවූ කල්බදු පොළිය	**(4,367,917)**		
		ණය ආපසු ගෙවීම්	**(29,940,439)**		
එල්.ඕ.එල්.සී. ෆැක්ටර්ස් ලිමිටඩ්	අනුබද්ධ	පොළී පිරිවැය	**898,167,629**	**3,854,407,243**	3,108,336,728
	සමාගම	ගෙවූ පොළිය	**(152,097,114)**		
එල් ඕ එල් සී ෆිනෑන්ස් පී එල් සී	අනුබද්ධ	ණය මත පොළිය	**16,127,761**	**81,703,071**	92,009,973
	සමාගම	ණය මත පොළී පිරිවැය	**(15,306,726)**		
		ගෙවූ ණය	**(9,663,679)**		
		කල්බදු පොළිය	**35,172,424**		
		ගෙවූ කල්බදු පොළිය	**(36,636,682)**		
	අනුබද්ධ	මිලදී ගැනීම්	**2,544,253**	-	16,862,500
ඇග්ස්ටාර් (පී.එල්.සී.)	සමාගම	මිලදී ගැනීම් සඳහා ගෙවීම්	**(19,406,753)**		
සාක්‍යා කැපිටල් (පුද්ගලික) සමාගම	අනුබද්ධ	පොළී පිරිවැය	**287,499,996**	**1,619,0791,665**	1,500,000,000
	සමාගම	ගෙවූ පොළිය	**(167,708,331)**		
	අනුබද්ධ	පොළී පිරිවැය	**6,976,188**	**389,000,000**	102,012,498
	සමාගම	ගෙවූ පොළිය	**(8,998,686)**		
		ලබා ගත් ණය	**647,000,000**		
සෙලාන් බැංකුව		ගෙවූ ණය	**(358,000,000)**		
කොමර්ෂල් ට්‍රස්ට් ටෙක්නොලොජීස් ප්‍රයිවට්	අනුබද්ධ	පොළී පිරිවැය	**123,500,004**	**763,208,337**	650,000,000
ලිමිටඩ්	සමාගම	ගෙවූ පොළිය	**(10,291,667)**		

31 ප්‍රාග්ධන වගකීම්

මාර්තු 31 දිනට ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් අධ්‍යක්ෂවරුන් විසින් අනුමත කළ පහතින් දැක්වෙන ප්‍රාග්ධන බැඳීම් මූල්‍ය ප්‍රකාශ සමඟ ඉදිරිපත් කර නැත.

මාර්තු 31 දිනට,	**2019**	2018
	ඇ. ඩොලර්	ඇ. ඩොලර්
අනුමත කළ නමුත් ලබා නොදුන් ප්‍රමාණය ආසන්න වශයෙන්	-	-
ලබා දුන් නමුත් අත්කර නොගත් ප්‍රමාණය ආසන්න වශයෙන්	114,114	117,500

ඉන්දියාවේ නාරන් ලාලා (පුද්ගලික) සමාගම සමඟ ස්කාගාරය ඉදි කිරීම සඳහා වූ ප්‍රාග්ධන බැඳීම් ඉහතින් සඳහන් කරුණුවලට ඇතුළත්ය.

32 අවිනිශ්චිත වගකීම්

වාර්තා කරන දිනට අනාවරණය කළ යුතු සැලකිය යුතු තරමේ අවිනිශ්චිත වගකීම් නොතිබිණි.

33 නඩු මඟින් බෙරුම්කරණය හෝ නිමිකම් ඉල්ලා සිටීම්

34 සන්සන්දනාත්මක සංඛ්‍යාති

වත්මන් වසරේ ඉදිරිපත් කිරීම් හා වර්ග කිරීමට අවශ්‍ය සන්සන්දනාත්මක තොරතුරු අවශ්‍ය තැන්හිදී නැවත වර්ග කර හා නැවත ප්‍රකාශ කර ඇත.

35 අධ්‍යක්ෂවරුන්ගේ වගකීම්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්වලට අනුව මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීමේ වගකීම් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී තිබේ.

36 වාර්තා කරන කාලසීමාවෙන් පසු සිදුවීම්

මූල්‍ය ප්‍රකාශ මඟින් අනාවරණය කළ යුතු හෝ ඒවායේ වෙනස් කලයුතු සිදුවීම් වාර්තා කරන දින සිට පැන නැඟී නොමැත.

37 මූල්‍ය මෙවලම්

මූල්‍ය මෙවලම්වල ධාරණ ප්‍රමාණ සහ සාධාරණ අගයන්

මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශවල ධාරණ ප්‍රමාණය සමග මූල්‍ය වත්කම් හා මූල්‍ය වත්කම්වල සාධාරණ අගයන් පහත පරිදි ය.

	සටහන	සාධාරණ අගය	ණය හා ලැබිය යුතු දෑ	අනෙකුත් මූල්‍ය වගකීම්	මූල්‍ය නොවන මෙවලම්	රැගෙන යා හැකි මුළු මුදල	සාධාරණ අගය			
							පළමු තලය	දෙවන තලය	තුන්වන තලය	හතර වන තලය
		රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
2019 මාර්තු 31 දිනට										
සාධාරණ අගය මත ගණනය කල මූල්‍ය වත්කම්		-	-	-	-	-	-	-	-	-
		-	-	-	-	-	-	-	-	-
සාධාරණ අගය මත ගණනය නොකල මූල්‍ය වත්කම්										
වෙළඳ කටයුතුවලින් ලැබිය යුතු දෑ	20.1	-	**622,095**		-	**622,095**	-	-	-	-
අනෙකුත් ලැබිය යුතු දෑ	20.2	-	**82,177,133**		-	**82,177,133**	-	-	-	-
ගොවීන්ට ලබාදුන් ණය	17	-	**416,013,604**		-	**416,013,604**	-	-	-	-
අනුබද්ධ පාර්ශවයන්ගෙන් ලැබිය යුතු ප්‍රමාණ	21	-	**3,153,670**		-	**3,153,670**	-	-	-	-
මුදල් හා කෙටිකාලීන තැන්පතු	22.1	-	**28,597,348**		-	**28,597,348**	-	-	-	-
			530,563,850		-	**530,563,850**	-	-	-	-
සාධාරණ අගය මත ගණනය නොකල වගකීම්										
අනුබද්ධ පාර්ශවයන් වෙත ගෙවිය යුතු ප්‍රමාණ	28	-	-	**1,936,830,544**	-	**1,936,830,544**	-	-	-	-
වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ	27	-	-	**117,414,466**	**143,280,054**	**260,694,520**	-	-	-	-
බැංකු අයිරා හා වෙනත් කෙටිකාලීන ණය ගැනීම්	22.2	-	-	**237,851,553**	-	**237,851,553**	-	-	-	-
පොලී සහිත වගකීම්	25	-	-	**7,400,814,217**	-	**7,400,814,217**	-	-	-	-
මූල්‍ය කල්බදු බැඳීම්	26	-	-	**169,549,843**	-	**169,549,843**	-	-	-	-
		-	-	**9,862,460,624**	**143,280,054**	**10,005,740,678**	-	-	-	-
2018 මාර්තු 31 දිනට										
සාධාරණ අගය මත ගණනය කල මූල්‍ය වත්කම්		-	-	-	-	-	-	-	-	-
සාධාරණ අගය මත ගණනය නොකල මූල්‍ය වත්කම්		-	-	-	-	-	-	-	-	-
වෙළඳ කටයුතුවලින් ලැබිය යුතු දෑ	20.1	-	1,273,382	-	-	1,273,382	-	-	-	-
අනෙකුත් ලැබිය යුතු දෑ	20.2	-	121,550,626	-	-	121,550,626	-	-	-	-
ගොවීන්ට ලබාදුන් ණය	17	-	290,125,906	-	-	290,125,906	-	-	-	-
අනුබද්ධ පාර්ශවයන්ගෙන් ලැබිය යුතු ප්‍රමාණ	21	-	2,772,105	-	-	2,772,105	-	-	-	-
මුදල් හා කෙටිකාලීන තැන්පතු	22.1	-	5,509,030	-	-	5,509,030	-	-	-	-
		-	421,231,048	-	-	421,231,048	-	-	-	-
සාධාරණ අගය මත ගණනය නොකල වගකීම්										
අනුබද්ධ පාර්ශවයන් වෙත ගෙවිය යුතු ප්‍රමාණ	28	-	-	886,548,864	-	886,548,864	-	-	-	-
වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ	27	-	-	132,388,884	36,107,278	168,496,162	-	-	-	-
බැංකු අයිරා හා වෙනත් කෙටිකාලීන ණය ගැනීම්	22.2	-	-	166,507,964	-	166,507,964	-	-	-	-
පොලී සහිත වගකීම්	25	-	-	6,551,061,302	-	6,551,061,302	-	-	-	-
මූල්‍ය කල්බදු බැඳීම්	26	-	-	208,056,968	-	208,056,968	-	-	-	-
		-	-	7,944,563,983	36,107,278	7,980,671,261	-	-	-	-

38 මූල්‍ය අවදානම් කළමනාකරණය

සම්පිණ්ඩනය

මූල්‍ය මෙවලම් ආශ්‍රිත පහත සඳහන් අවදානම් වලට සමාගම බඳුන් වී ඇත.

38.1 ණය අවදානම

38.2 ද්‍රවශීලතා අවදානම

38.3 වෙළඳපල අවදානම

38.4 මෙහෙයුම් අවදානම

මෙම සටහන් මඟින් සමාගම ඉහත සඳහන් එක් එක් අවදානමට බඳුන්වීම පිළිබඳවත්, සමාගමේ අරමුණු, ප්‍රතිපත්ති හා අවදානම් මැණ බැලීමේ හා කළමනාකරණය කිරීමේ ක්‍රියාවලීන් පිළිබඳවත්, සමාගම මඟින් ප්‍රාග්ධනය කළමනාකරණය කිරීම පිළිබඳවත් තොරතුරු ඉදිරිපත් කරයි.

අවදානම් කළමනාකරණ රාමුව

සමාගමේ අවදානම් කළමනාකරණ රාමුව ස්ථාපණය කිරීමේ හා පවත්වා ගැනීමේ සමස්ථ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ. සියළුම අධ්‍යක්ෂ මණ්ඩල කමිටු විධායක හා විධායක නොවන සාමාජිකයින්ගෙන් සමන්විත වන අතර ඔවුන් සිය ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ක්‍රමවත්ව වාර්තා කරයි.

සමාගම මුහුණදෙන අවදානම් හඳුනාගැනීම හා විශ්ලේෂණය කිරීම සඳහාත් යෝග්‍ය අවදානම් සීමා හා පාලන ක්‍රම පිහිටුවීම සඳහාත්, අවදානම් පිළිබඳව සමාලෝචනය කිරීම සහ එම සීමාවන් පිලිපැදීම සඳහාත් සමාගමේ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති ස්ථාපනය කරනු ලැබේ. වෙළඳපල තත්ත්වය, නිෂ්පාදන හා සපයනු ලබන සේවාවන්වල වෙනස්කම් පිළිඹිබු වන පරිදි අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති හා පද්ධති විධිමත්ව සමාලෝචනය කරනු ලැබේ. සමාගම සිය පුහුණු හා කළමනාකරණ ප්‍රමිති හා ක්‍රියා පිළිවෙත් ඔස්සේ, සියළුම සේවකයන් ස්වකීය කාර්යභාරය හා බැඳීම් අවබෝධ කරගැනීමට ඉඩ සලසන විනය ගරුක හා වැඩ දායක පාලන පරිසරයක් ගොඩනැගීමට අපේක්ෂා කරයි.

38.1 ණය අවදානම

ණය අවදානම යනු ගනුදෙනුකරුවෙකු හෝ ප්‍රතිපාර්ශ්වයක් ස්වකීය ගිවිසුම් ප්‍රකාර බැඳීමකට අනුව ක්‍රියා කිරීමට අපොහොසත් වීමෙන් හා සමාගමේ ගනුදෙනුකරුවන්ගෙන් හා ආයෝජන වලින් මූලික වශයෙන් හට ගැනෙන මූල්‍යමය පාඩු පිළිබඳ අවදානමයි.
මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ධාරණ ප්‍රමාණය මත පදනම් වෙමින් වෙළඳ කටයුතුවලින් ලැබිය යුතු දෑ ලැබීම් වෙනුවෙන් සමාගම දරණ උපරිම ණය අවදානම පහතින් දැක්වේ.

	ධාරණ වටිනාකම	
	31/03/2019	31/03/2018
වෙළඳ කටයුතුවලින් ලැබිය යුතු දෑ	**622,095**	1,273,382
අත්තිකාරම්	**38,861,897**	97,363,634
පෙරගෙවීම්	**5,880,012**	4,331,593
ගොවි ණය නිශ්කාෂණ ගිණුම	**37,435,224**	16,855,871
බැංකුවෙහි ඇති මුදල්	**28,018,436**	5,054,538
අතැති මුදල්	**578,913**	45,492

වෙළඳ කටයුතුවලින් හා අනෙකුත් ලැබිය යුතු දෑ

එක් එක් ගනුදෙනුකරුවාගේ පුද්ගලානුබද්ධ ගුණාංග ප්‍රධාන වශයෙන්ම ආයතනයේ ණය අවදානම කෙරෙහි බලපා තිබේ.

ණය අවදානම කළමනාකරණය කිරීම

ආයතනයේ ණය අවදානම කෙරෙහි බලපා ඇත්තේ එක් එක් ගණුදෙනුකරුවාගේ පුද්ගලානුබද්ධ ගුණාංගයන්ය. කෙසේ නමුත් ගනුදෙනුකාර සංචිතයේ අතීත ක්‍රියාකාරීත්වය, කර්මාන්තය තුළ පවතින ස්ථාවරත්වය හා ණය ලබා ගැනීමට ඇති යෝග්‍යතාවය කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් ණය පැහැර හැරීමේ අවදානම ව්‍යාපාරික සබඳතා ඇතුළු බොහොමයක් ලක්ෂණ සම්බන්ධයෙන් කලමනාකාරීත්වය සැලකිලිමත් වේ.

ණය අවදානම සමාලෝචනය කිරීමේ දී ගනුදෙනුකරුවන්ගේ ව්‍යාපාරික ධාරිතාවය අනුව ඔවුන් කාණ්ඩ ගත කරන අතර ණය සීමාවන් ප්‍රධානය කිරීමේදී ඔවුන් වෙන් වෙන් වශයෙන් සළකනු ලැබේ. ගනුදෙනු වල පරිමාව හා සබඳතා මත පදනම් වෙමින් ගනුදෙනුකරුවන් ශ්‍රේණිගත කරනු ලැබේ. ඉහළ අවදානමක් සහිත ගනුදෙනුකරුවන් ලෙස හඳුනාගත් විට ඔවුන්ට හාණ්ඩ අලෙවි කරනුයේ අත්තිකාරමක් හෝ සම්පූර්ණ මුදල ගෙවීමෙන් අනතුරුවය.
සමාගම විසින් ස්ථාපනය කර ඇති ණය ප්‍රතිපත්තිය යටතේ ණය ලබා දීම සඳහා සෑම අළුත් ගනුදෙනුකරුවකුගේම යෝග්‍යතාවය වෙන් වෙන් වශයෙන් විශ්ලේෂනය කරනු ලැබේ. තවද, එක් එක් ගනුදෙනුකරුවා වෙනුවෙන් ණය සීමා පනවනු ලබන අතර ඒවා නිරතුරුව සමාලෝචනය කෙරේ.

ණය අවදානම අඩු කිරීම සඳහා පහත සඳහන් පියවරයන් ද අනුගමනය කරනු ලැබේ.
1) අය විය යුතු ණය පිළිබඳව දෛනිකව සමාලෝචනය කරනු ලැබේ.
2) ණය නිරවුල් කිරීමට අසමත් වූ ගනුදෙනු කරුවන්ට එරෙහිව නීතිමය ක්‍රියා මාර්ග ගැනීමට කටයුතු කරනු ලැබේ.

හානිකරණය

වෙළඳ ලැබීම්වලට අදාළ ඇස්තමේන්තුගත මූල්‍යමය පාඩුව මගින් නියෝජනය කරන හානිකරණය සඳහා සමාගම විසින් දීමනාවක් ප්‍රතිස්ථාපනය කරනු ලැබේ.

38.2 ද්‍රවශීලතා අවදානම

ද්‍රවශීලතා අවදානම යනු මුදල් හෝ වෙනත් මූල්‍ය වත්කමක් නිකුත් කිරීම මඟින් නිරවුල් කරනු ලබන සමාගමේ මූල්‍ය වගකීම් ආශ්‍රිත බැඳීම් ඉටු කිරීමේ දී දුෂ්කරතාවලට මුහුණපෑමේ අවදානමයි.

ද්‍රවශීලතා අවදානම කළමනාකරණය කිරීම

අනභිමත පාඩු නොදරමින් හෝ සමාගමේ කීර්ති නාමයට හානි නොපමුණුවමින්, සමාගම යථා පරිදි ක්‍රියාත්මක වන හා පිඩාවට පත් වූ තත්ත්වයන් යටතේ, අවශය සෑම අවස්ථාවකදීම සමාගම සතු වගකීම් සපුරාලීම සඳහා හැකිතාක් දුරට ප්‍රමාණවත් තරම් ද්‍රවශීලතාවක් පවත්වා ගැනීම සහතික කිරීම සමාගමේ ද්‍රවශීලතා අවදානම කළමනාකරණ ප්‍රවේශය වේ.

මෙහෙයුම් අවශ්‍යතාවන් සඳහා මුදල් ප්‍රමාණවත් බව සහතික කරනු වස් සමාගම අඛණ්ඩව පිරිවැටුම් මුදල් ප්‍රවාහ පුරෝකථන සම්පාදනය කිරීමේ සා සමාලෝචනය කිරීමේ නියැලේ. අයවැය ඉලක්කවලට එරෙහිව සත්‍ය කාර්ය සාධනය පරීක්ෂා කිරීම සඳහා විධිමත් සමාලෝචනයන්හි ද නියැලේ.

38.3 වෙළඳපල අවදානම

වෙළඳපල අවදානම යනු පොළී අනුපාත, කොටස් මිල ගණන්, විදේශ විනිමය අනුපාත හා ණය විස්ථාරය (බැඳුම්කරු/ නිකුත් කරන්නාගේ ණය තත්ත්වයේ වෙනස්කම් වලට සම්බන්ධයක් නොමැති) සමාගමේ ආදායම හෝ මූල්‍ය මෙවලම් සමාගමේ කොටස් හිමිකමේ වටිනාකම වෙත බලපෑම් කරනු ඇති බවට පවතින අවදානම වේ. වෙළඳපල අවදානම කළමනාකරණය කිරීමේ අරමුණ වන්නේ අභිමත පරාමිතීන් තුළ වෙළඳපල අවදානමට අවතීර්ණ වීම කළමනාකරණය කිරීම සහ පාලනය කිරීමයි.

පොළී අනුපාතික අවදානම

පොළී අනුපාතික අවදානම යනු වෙළඳපල පොළී අනුපාතික වෙනස් වීම හේතුවෙන් මූල්‍ය මෙවලමක මුදල් ප්‍රවාහය හෝ වටිනාකම උච්ඡාවචනය වීමේ අවදානමයි.
පොළී අනුපාතික අවදානම අඩු කිරීම සඳහා, සමාගම පහතින් දැක්වෙන උපායමාර්ග දියත් කරනු ලබයි.

1. වෙළඳපල වාශ්පශීලීතාව කළමනාකරණය කිරීම සඳහා ස්ථාවර පොළී අනුපාතික ඔස්සේ සමාගමේ ණය ව්‍යුහගත කර තිබේ.
2. අඩු නෝලන අනුපාතය දෙසට කටයුතු කිරීම.
3. බාහිර අරමුදල් සම්පාදන ප්‍රභවයන්ට වඩා අභ්‍යන්තර අරමුදල් සම්පාදන ප්‍රභවයන් වෙත අවධානය.
4. පොළී අනුපාතිකවල උච්ඡාවචන පිළිබඳව සමාලෝචනය කිරීම සඳහා සුදුසු යාන්ත්‍රණ භාවිතය.

38.4 මෙහෙයුම් අවදානම

මෙහෙයුම් අවදානම යනු, ආයතනික හැසිරීම් පිළිබඳව පොදුවේ පිළිගත් ප්‍රමිතීන් සහ නීතිමය හා නියාමක අවශ්‍යතාවලින් පැනනඟින ණය, වෙළඳපල හා ද්‍රවශීලතා අවදානම් හැර වෙනත් බාහිර සාධක වලින් මෙන්ම ක්‍රියාවලීන්, පිරිස්, තාක්ෂණය හා යටිතල පහසුකම් ඇතුළත්ව මෙහෙයුම් කටයුතුවලට අදාළ සමාගමේ මැදිහත් වීම් ආශ්‍රිත පුළුල් විවිධත්වයකින් යුතු හේතු නිසා පැන නැගෙන ඍජු හා වක්‍ර පාඩු මඟින් ඇතිවන අවදානමයි.

සමාගමේ අරමුණ වන්නේ සමස්ථ පිරිවැය ඵලදායීතාවයෙන් යුතුව සමාගමේ කීර්ති නාමයට හානි වීම සහ මූල්‍ය පාඩු වැළැක්වීම තුලනය වන පරිදි මෙහෙයුම් අවදානම කළමනාකරණය කිරීමත් මූලාරම්භයන්ගේ හා නිර්මාණාත්මක බව සීමා කරන පාලන පිලිවෙත් වළක්වාලීමත්ය.

මෙහෙයුම් අවදානමට විසඳුම් සෙවීමේ විධික්‍රම සකස් කිරීමේ හා දියත් කිරීමේ මූලික වගකීම සමාගමේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයට පැවරී ඇත. පහත දැක්වෙන ක්ෂේත්‍ර ආශ්‍රිත මෙහෙයුම් අවදානම් කළමනාකරණය කිරීම සඳහා සමස්ථ සමාගම් ප්‍රමිතීන් සකස් කිරීම මඟින් ඉහත සඳහන් වගකීමට අනුබල ලබා දේ.

1. ගනුදෙනු වල ස්වාධීන අධිකාරීත්වය පැවරීම ඇතුළුව යෝග්‍ය පරිදි රාජකාරී වෙන් කිරීමේ අවශ්‍යතා;
2. ගනුදෙනු සමාධානය සහ සමාලෝචනය කිරීමේ අවශ්‍යතා;
3. නියාමන හා අනෙකුත් නීතිමය අවශ්‍යතා වලට අනුකූල වීම;
4. පාලන ක්‍රම හා ක්‍රියාපිළිවෙත් ලේඛණගත කිරීම;
5. මුහුණපාන මෙහෙයුම් අවදානම් පිළිබඳව වරින් වර ඇගයීමේ අවශ්‍යතා සහ හඳුනාගත් අවදානම්වලට විසඳුම් ලබා දීම සඳහා පවතින පාලන ක්‍රම හා ක්‍රියා පිළිවෙත් වල ප්‍රමාණවත් බව;
6. මෙහෙයුම් පාඩු සහ ඒවා සම්බන්ධයෙන් යෝජිත ප්‍රතිකාරී ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තා කිරීමේ අවශ්‍යතා;
7. අවිනිශ්චිතතා සැලසුම් සැකසීම
8. පුහුණුව හා වෘත්තීය සංවර්ධනය;
9. ව්‍යාපාරික හා ආචාරධර්මීය ප්‍රමිතීන්.

වාර්ෂික මහා සභා රැස්වීමේ නිවේදනය

සමාගමේ වාර්ෂික මහා සභා රැස්වීම 2020 අගෝස්තු මස 28 වන දින ප.ව 6.30 ට කොළඹ 10, ටී.බී. ජයා මාවතේ, අංක 338, එක්සෙල් වර්ල්ඩ් "මාකෝපෝලෝ" හී දී පැවැත්වෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

රැස්වීමේ දී සාකච්ඡා කරන කරුණු වන්නේ;

1. 2019 මාර්තු 31න් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව, ගිණුම් ප්‍රකාශය සහ සමාගමේ ශේෂ පත්‍රය සහ ඒ පිළිබඳ විගණකවරුන්ගේ වාර්තා ලබා ගැනීම හා සළකා බැලීම.
2. එළඹෙන වසර සඳහා සමාගමේ විගණකවරුන් වශයෙන් විගණකාධිපති දෙපාර්තමේන්තුව පත් කිරීම.
3. විගණකවරුන්ගේ වේතනය නියම කිරීමට අධ්‍යක්ෂවරුන්ට බලය පැවරීම.
4. ඊළඟ වසර සඳහා පරිත්‍යාග තීරණය කිරීමට අධ්‍යක්ෂවරුන්ට බලය පැවරීම.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි.

එල් ඕ එල් සී ආයතනික සේවා (පුද්ගලික) සමාගම
ලේකම්වරු
කොළඹ

සටහන්:

1. රැස්වීමට සහභාගී වීමට හා ඡන්දය පාවිච්චි කිරීමට හිමිකම පවතින සාමාජිකයෙකුට ස්වකීය නියෝජනය වෙනුවෙන් අන් අයෙකු (පෙරකලාසිකරුවෙක්) පත් කල හැක.
2. එකී නියෝජිතයා සමාගමේ සාමාජිකයෙකු වීම අවශ්‍ය නොවේ. මේ වාර්තාවේ අවසන පෙරකලාසි පත්‍රය දක්වා තිබේ.

   පෙරකලාසිකරුවෙකු පත්කිරීමේ නිත්‍යානුකූල ලේඛණය රැස්වීම පැවැත්වීමට නියමිත වේලාවට පැය 48 කට නොඅඩු කාලයක් තුල කොළඹ 3 වන ශ්‍රීමත් මොහොමඩ් මැකේන් මාකර් මාවත, කොළඹ 3 හි තැන්පත් කළ යුතුය.

පෙරකලාසි පත්‍රය

ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම - ලි.ප. අංකය: PV 7601 (පී වී 7601)

ඉහත නම සඳහන් සමාගමේ සාමාජිකයෙකු/සාමාජිකයන් වශයෙන් .....
.....
යන ලිපිනයේ පදංචි .....
යන නම් දරණ මම/ අපි,

2020 අගෝස්තු මස 28 වන දින පැවැත්වීමට නියමිත සමාගමේ වාර්ෂික මහා සභා රැස්වීමේදී හා ඊට අදාළ වෙනයම් කල් තැබීමකදී මෙන්ම ඒ නිසා යෙදෙන සෑම ඡන්ද විමසීමකදීම, මාගේ/අපගේ පෙරකලාසිකරු ලෙස මා/අප නියෝජනය කිරීමට සහ මා/අප සඳහා සහ මා/අප වෙනුවෙන් ඡන්දය පාවිච්චි කිරීමට,

කේ.ඒ.කේ.පී. ගුණවර්ධන	හෝ ඔහු නොමැති නම්
ඩී. අබේරත්න	හෝ ඔහු නොමැති නම්
ඩබ්ලිව්. බටගොඩ	හෝ ඔහු නොමැති නම්
ඩී. එම් .එල් . බණ්ඩාරනායක	හෝ ඔහු නොමැති නම්
ලෙෆ්ටිනන් කර්නල් රන්ජිත් එල්ලගල	හෝ ඔහු නොමැති නම්
එස් හෙට්ටිආරච්චි	හෝ ඇය නොමැති නම්
කීර්ති කොටගම	හෝ ඔහු නොමැති නම්
පද්මලාල් පෙරේරා	හෝ ඔහු නොමැති නම්

.....යන
ලිපිනයේ පදිංචි .....මහතා/ මහත්මිය/
මෙනවිය පත් කරමි/ කරමු.
2020..... දින අත්සන් කරන ලදී.

.....

අත්සන/ අත්සන්

කරුණාකර පහත සඳහන් තොරතුරු සපයන්න:
කොටස් හිමිගේ හැඳුනුම්පත් අංකය : .....
කොටස් හිමිකම් සහතික අංකය : .....
හිමි කොටස් සංඛ්‍යාව : .....
පෙරකලාසිකරුගේ හැඳුනුම්පත් අංකය : .....
(මෙම සමාගමේ අධ්‍යක්ෂවරයෙකු නොවේ නම්)

සටහන්:

1 පෙරකලාසිකරු පත් කරනු ලබන කොටස් හිමිකරුගේ සම්පූර්ණ නම හා ලියාපදිංචි ලිපිනය පෙරකලාසි පත්‍රයේ පැහැදිළිව සඳහන් කළ යුතුය.

2 පෙරකලාසි පත්‍රය ඇටෝනි බලය ලත් පුද්ගලයෙකු විසින් අත්සන් කරන විට, එම ඇටෝනි බල පත්‍රය මේ වන විටත් සමාගමේ ලියාපදිංචි කර නැත්නම් සාපේක්ෂ ඇටෝනි බලය සහිත ලියවිලිද පෙරකලාසි පත්‍රය සමඟ ලියාපදිංචි කිරීම සඳහා එවිය යුතුය.

3 සමාගමක් / සංස්ථාවක් නම්, ව්‍යවස්ථාවේ විස්තර කර ඇති පරිදි පෙරකලාසි පත්‍රය ආයතනයේ නිල මුද්‍රාව තබා සහතික කළ යුතුය.

4 බද්ධ කොටස්හිමියන් වන අවස්ථාවලදී ජ්‍යෙෂ්ඨතමයා විසින් පෙරකලාසි අයදුම්පත අත්සන් කළ යුතුය. බද්ධ කොටස් හිමියන්ගේ නාම ලේඛණයේ නම් සඳහන් වන පිළිවෙල අනුව ජ්‍යෙෂ්ඨත්වය තීරණය කරනු ලැබේ.

5 පෙරකලාසි පත්‍රයේ සිදු කරන ඕනෑම වෙනස් කිරීමක් හෝ එකතු කිරීමක්, පෙරකලාසි අයදුම්පත මත අත්සන් කරන පුද්ගලයා විසින් සම්පූර්ණ අත්සන යොදා නිසි පරිදි සහතික කළ යුතුය.

6 වලංගු වීම සඳහා නිසි ලෙස සම්පූර්ණ කරන ලද පෙරකලාසි අයදුම්පත අඩුම වශයෙන් රැස්වීම පැවැත්වීමට නියමිත වේලාවට පැය 48 කට පෙර නො.34, සර් මොහොමඩ් මැකේන් මාවත, කොළඹ 03 යන ලිපිනයේ ලේකම්වරු වෙත තැන්පත් කළ යුතුය.

සමාගම් තොරතුරු

ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම

නීතික ආකෘතිය	:	2006 ඔක්තෝබර් 11 දින සංස්ථාපනය කළ සීමිත වගකීම් සහිත පෞද්ගලික සමාගමකි.
සමාගමේ ලියාපදිංචි අංකය	:	PV 7601 (පී වී 7601)
ලියාපදිංචි කාර්යාලය	:	481, ටී.බී. ජයා මාවත (ඩාලි පාර), කොළඹ 10. දූ.ක: 011-5063000, ෆැක්ස්: 011-2307380
අධ්‍යක්ෂවරු	:	කේ.බී.කොටගම — සභාපති කේ.ඒ.කේ.පී. ගුණවර්ධන — අධ්‍යක්ෂ ආර්.එම්.ජී.බී. රත්නායක — අධ්‍යක්ෂ /ප්‍රධාන විධායක නිලධාරී ඩබ්ලිව්.කේ.ඩී.ටී. අබේරත්න — අධ්‍යක්ෂ බී එම් ඩී බී බස්නායක — අධ්‍යක්ෂ ඩබ්ලිව්. බටගොඩ — අධ්‍යක්ෂ එස්. ගිරිදරන් — අධ්‍යක්ෂ ඩී. එම්. එල්. බණ්ඩාරනායක — අධ්‍යක්ෂ එන් . එස්. වනසිංහ — අධ්‍යක්ෂ
විගණකවරු	:	විගණකාධිපති විගණකාධිපති දෙපාර්තමේන්තුව කොළඹ
සමාගම් ලේකම්වරු	:	එල් ඕ එල් සී ආයතනික සේවා (පුද්ගලික) සමාගම 100/1, ශ්‍රී ජයවර්ධනපුර මාවත, රාජගිරිය



ගල්ඔය වැවිලි පුද්ගලික සමාගම,
හිඟුරාණ, අම්පාර.
දු. +94 63 5672828 ෆැ. +94 63 2240199
www.galoya.lk